සැ. යු. -2010.05.21 දින පළවූ අංක 1,655 දරන ගැසට් පත්‍රයේ II කොටස පළ නොවිය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 1,656 - 2010 මැයි මස 26 වැනි බදාදා - 2010.05.26

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස : I වැනි ඡෙදය - සාමාන්‍ය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිටුව |
|---|---|
| ජනාධිපතිතුමාණන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය | — |
| ජනාධිපතිතුමාණන් විසින් කරන ලද පත්කිරීම් ආදිය ... | 1010 |
| අමාත්‍ය මණ්ඩලය විසින් කරන ලද පත්කිරීම් ආදිය ... | — |
| රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් කරන ලද පත්කිරීම් ආදිය | — |
| අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් කරන ලද පත්කිරීම් ආදිය | — |
| වෙනත් පත්කිරීම් ආදිය ... ... ... ... | — |
| රෙජිස්ට්‍රාර්වරුන්ගේ පත්කිරීම් ආදිය ... ... ... | — |
| රජයේ නිවේදන ... ... ... | 1011 |
| මිල පාලන දැන්වීම් ... ... ... | — |
| ශ්‍රී ලංකා මහ බැංකුවේ දැන්වීම් ... ... ... | — |
| ශ්‍රී ලංකාණ්ඩුවේ ගිණුම් ප්‍රකාශන ... ... ... | — |
| ආදායම් හා වියදම් පිළිබඳ වාර්තා ... ... ... | — |
| විවිධ දෙපාර්තමේන්තු දැන්වීම් ... ... ... | 1015 |
| නැවියන්ට දැන්වීම් ... ... ... | — |
| සුරාබදු ආඥාපනත පිළිබඳ දැන්වීම් ... ... ... | — |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳ ව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා භාරගන්නා සියලු ම දැන්වීම් *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳ ව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳ ව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2010 ජුනි මස 04 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2010 මැයි මස 21 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතුය.

**ලක්ෂමන් ගුණවර්ධන,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2010 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

# ජනාධිපතිතුමාණන් විසින් කරන ලද පත්කිරීම් ආදිය

DRF/21/RECT/2978.

**ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්ථිර බල හමුදාව**

අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද අපකීර්ති සහගත ලෙස සේවයෙන් ඉවත් කිරීමක්

ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ ස්ථිර බල හමුදාවේ පහත නම සඳහන් නිලධාරි 2009 සැප්තැම්බර් මස 08 වැනි දින සිට අපකීර්ති සහගත ලෙස සේවයෙන් ඉවත් කරනු ලැබීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත :

තාවකාලික මේජර් හිරිඹුර ගමගේ ප්‍රභාත් කුමාර, ශ්‍රීලසසබ (නි/62779)

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී ආර්එස්පී පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව,
නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය.

2009 නොවැම්බර් මස 27 වැනි දින,
කොළඹ දී ය.

05-720

---

DRF/21/RECT/2973.

**ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්ථිර බල හමුදාව**

අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද අපකීර්ති සහගත ලෙස සේවයෙන් ඉවත් කිරීමක්

ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ ස්ථිර බල හමුදාවේ පහත නම සඳහන් නිලධාරි 2009 සැප්තැම්බර් මස 09 වැනි දින සිට අපකීර්ති සහගත ලෙස සේවයෙන් ඉවත් කරනු ලැබීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත :

තාවකාලික මේජර් දීපලාල් මතෙස් කංකානමගේ ජයසේකර, සඹුබ (නි/62373)

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී ආර්එස්පී පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව,
නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය.

2009 නොවැම්බර් මස 11 වැනි දින,
කොළඹ දී ය.

05-609

2010 අංක 82

DRF/21/RECT/2967.

**ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්ථිර බල හමුදාව**

අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද විශ්‍රාම ගැනීමක්

පහත නම සඳහන් නිලධාරි 2009 ජූලි මස 23 වැනි දින සිට ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ ස්ථිර බල හමුදාවෙන් වෛද්‍ය හේතූන් මත විශ්‍රාම ගැනීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත :

කපිතන් වික්‍රම පතිරණගේ අසංක ඇන් වික්‍රමපතිරණ, ශ්‍රීලංඉ (නි/65708)

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී ආර්එස්පී පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව,
නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය.

2009 නොවැම්බර් මස 06 වැනි දින,
කොළඹ දී ය.

05-610

---

2010 අංක 83

DRF/21/RECT/3013.

**ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්ථිර බල හමුදාව**

අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද විශ්‍රාම ගැනීමක්

**විශ්‍රාම ගැනීම**

පහත නම සඳහන් නිලධාරි 2009 ඔක්තෝබර් මස 14 වැනි දින සිට ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ ස්ථිර බල හමුදාවෙන් වෛද්‍ය හේතූන් මත විශ්‍රාම ගැනීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත :

කපිතන් මාගල කෝට්ටආරච්චිලාගේ සුනිල් කෝට්ටආරච්චි, ආර්එස්පී විපාරෙ (නි/63879)

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී ආර්එස්පී පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව,
නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය.

2009 දෙසැම්බර් මස 24 වැනි දින,
කොළඹ දී ය.

05-678

2010 අංක 84

DRF/21/RECT/3012.

**ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්ථිර බල හමුදාව**

අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද විශ්‍රාම ගැනීමක් සහ නිත්‍ය (පොදු) උපසේවයට මාරු කිරීමක්

**විශ්‍රාම ගැනීමක්**

පහත නම සඳහන් නිලධාරී 2010 පෙබරවාරි මස 13 වැනි දින සිට ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ ස්ථිර බල හමුදාවෙන් විශ්‍රාම ගැනීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත :

කපිතන් (උපකරණ පාලක) ලොකු හෙට්ටිගේ සරත් යූඑස්පී, ශ්‍රීලකාහ (නි/63767)

**නිත්‍ය (පොදු) උපසේවයට මාරු කිරීමක්**

පහත නම සඳහන් නිලධාරී 2010 පෙබරවාරි මස 13 වැනි දින සිට ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ නිත්‍ය (පොදු) උපසේවයට මාරු කිරීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත :

කපිතන් (උපකරණ පාලක) ලොකු හෙට්ටිගේ සරත් යූඑස්පී, ශ්‍රීලකාහ (නි/63767)

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී ආර්එස්පී පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව,
නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය.

2009 දෙසැම්බර් මස 24 වැනි දින,
කොළඹ දී ය.

05-718

---

DRF/21/RECT/2982.

**ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්ථිර බල හමුදාව**

අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද අපකීර්ති සහගත ලෙස සේවයෙන් ඉවත් කිරීමක්

ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ ස්ථිර බල හමුදාවේ පහත නම සඳහන් නිලධාරී 2009 සැප්තැම්බර් මස 09 වැනි දින සිට අපකීර්ති සහගත ලෙස සේවයෙන් ඉවත් කරනු ලැබීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත :

ලුතිනන් හේරත් මුදියන්සේලාගේ උපුල් ජයමාන්න හේරත්, විපාරෙ (නි/60800)

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී ආර්එස්පී පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව,
නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය.

2009 නොවැම්බර් මස 26 වැනි දින,
කොළඹ දී ය.

05-719

---

DRF/21/RECT/2986.

**ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්ථිර බල හමුදාව**

අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද අපකීර්ති සහගත ලෙස සේවයෙන් ඉවත් කිරීමක්

ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ ස්ථිර බල හමුදාවේ පහත නම සඳහන් නිලධාරී 2009 සැප්තැම්බර් මස 08 වැනි දින සිට අපකීර්ති සහගත ලෙස සේවයෙන් ඉවත් කරනු ලැබීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත :

දෙවන ලුතිනන් නෙල්ලි ගෙදර ලක්ෂ්මන් ජයකොඩි, ගරෙ (නි/66837)

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී ආර්එස්පී පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව,
නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය.

2009 නොවැම්බර් මස 27 වැනි දින,
කොළඹ දී ය.

05-721

---

# රජයේ නිවේදන

**1980 අංක 56, 1977 අංක 9, 1976 අංක 18 සහ 1974 අංක 34 දරන නිවාස දේපළ උපරිමය පිළිබඳ (සංශෝධන) නීතිවලින් සංශෝධිත 1973 අංක 1 දරන නිවාස දේපළ උපරිමය පිළිබඳ නීතියේ 20 වැනි වගන්තිය යටතේ නිවේදනය**

ඉහත කී 1973 අංක 1 දරන නිවාස දේපළ උපරිමය පිළිබඳ (සංශෝධිත) නීතියේ විධිවිධානයන් ක්‍රියාත්මක වීම හේතුවෙන් මේ සමග ඇති උපලේඛනයේ විස්තරාත්මක ලෙසින් දැක්වෙන නිවස/නිවාස මා වෙත පැවරී ඇති බැවින්,

එකී නීතියේ 20 වැනි වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, මෙහි පහත උපලේඛනයෙහි විස්තර කරන ලද නිවාස මා වෙත සතු වූ දිනට පෙරාතුවම වූ දිනයෙහි එම නිවාසය හෝ නිවාස පිළිබඳ සම්බන්ධතාවයක් දැරූ සියලුම පුද්ගලයන් විසින් එම එක් එක් නිවාසය සඳහා සම්පූර්ණයෙන් හෝ ඉන් කොටසකට මෙම නීතිය යටතේ ගෙවිය යුතු මිල පිළිබඳව ලිඛිත හිමිකම් පෑම මෙම ගැසට් නිවේදනය ප්‍රසිද්ධ කළ දිනයේ සිට ලිත් මසක් ඇතුළත ලියාපදිංචි තැපෑලෙන් මා වෙත ඉදිරිපත් කරන ලෙස මෙයින් නියම කරමි. එම හිමිකම් පෑම් හි මතු සඳහන් කරුණු අන්තර්ගත විය යුතු යි.

(අ) ඔහුගේ/ඇයගේ නම සහ ලිපිනය ;
(ආ) එම නිවාසය පිළිබඳ වූ ඔහුගේ/ඇයගේ සම්බන්ධතාවයෙහි ස්වභාවය ;
(ඇ) ඔහුගේ/ඇයගේ හිමිකම් පෑමේ විස්තරය ;
(ඈ) ඔහු/ඇය එම මිලෙන් හිමිකම් කියන ප්‍රමාණය ;

ජාතික නිවාස කොමසාරිස්.

2010 මාර්තු මස 15 වැනි දින,
නිවාස දේපළ උපරිම ශාඛාව,
නිවාස හා පොදු පහසුකම් අමාත්‍යාංශය,
"සෙත්සිරිපාය",
බත්තරමුල්ල.

අංක 1,632 හා 2009.12.11 වැනි දින පළ වූ නිවේදනය මෙයින් සංශෝධනය කරමි.

**උපලේඛනය**

| මගේ යොමු අංකය | ප්‍රකාශකයාගේ නම සහ ලිපිනය | වරිපනම් අංක සහ පිහිටීම | දිස්ත්‍රික්කය, ප්‍රාදේශීය බල මණ්ඩලය සහ කොට්ඨාස අංකය | මානක සැලැස්ම | කැබලි අංක | පැවරෙන ප්‍රමාණය අ. | රූ. | පර්. |
|---|---|---|---|---|---|---|---|---|
| CH/O/ 6035 | වී. ආර්. සවුන්දර රාජන්, අංක 10/1, ශ්‍රී සෙල්වවිනයාගර් කෝවිල, පේරාදෙනිය පාර, මහනුවර.<br><br>වර්තමාන ලිපිනය<br>අංක 40, වෙන්කටාසාමි වීදිය, සිනියම් තොට්ටම්, ඊ රොඩ් - 638001 තමිල්නාඩු, දකුණු ඉංදියාව. | අංක 25/10, 25/11ඒ, 25/25, 25/26, 8/1, 8/2, 8/4 8/5-8/11, 8/14 8/15, 8/16, 8/16ඊ, 8/17, 8/18, 8/18ඒ 8/18ඊ, 8/19, 8/12, 8/13, 10/4, 54/1, 54/3-2, 54/4 54/5, 54/6 කෝවිල් වත්ත, කටුකැලේ, මහනුවර. | මධ්‍යම පළාතේ මහනුවර දිස්ත්‍රික්කයේ, මහනුවර නගර සභා සීමාව තුළ කොට්ඨාශ අංක 17 ඉහළ කටුකැලේ | අංක 2052 පීඑච්/ඕ/6035 එම්. ඩී. එම්. ජේ. රූපසිංහ බලයලත් මිනින්දෝරු තැන 2001.05.10 | 42 | 01 | 03 | 11.09 |
| CH/O/ 6035 | එම | 52/2ඒ, 52/2 කටුකැලේ, කෝවිල්වත්ත, මහනුවර. | එම | අංක 2050 ඒ. ඩී. එම්. ජේ රූපසිංහ බලයලත් මිනින්දෝරු තැන 2001.05.10 | 1-2 | | | 14.87 |
| CH/O/ 6035 | එම | 52/1(4) 52/1(2) කෝවිල්වත්ත, කටුකැලේ, මහනුවර. | එම | අංක 2051 සභාධිපතිත්‍ය දේපළ ඒ. ඩී. එම්. ජේ. රූපසිංහ බලයලත් මිනින්දෝරු තැන 2001.05.10 | 1/ඔෆ්/ ඕ/යූ2<br>1/ඒ/යූ2<br>1එෆ් ඕ/යූටී | | | 14.00 |

05-597

**වන්නිවිලාංකුලම් ශ්‍රී මුතුමාරිඅම්මන් පොංගල් උත්සවය - 2010**

මුලතිව් දිස්ත්‍රික්කය

ඉහත සඳහන් පොංගල් උත්සවය 2010 මැයි මස 21 වැනි දින පෙරවරු 6.00ට පටන්ගෙන 2010 මැයි මස 22 දින පෙරවරු 6.00ට අවසන් වන බව පොදු මහජනතාවගේ දැනගැනීම සඳහා මෙයින් නිවේදනය කරනු ලැබේ.

02. මේ පිළිබඳව 1949 මැයි මස 27 වැනි දින අංක 9978 හා 1950 මැයි මස 26 වැනි දිනැති අංක 10105 දරන රෙගුලාසිවලට පොදු ජනතාවගේ අවධානය යොමු කරවනු ලැබේ.

03. ප්‍රසිද්ධියට පත් කරන ලද මෙම නිත්‍ය රෙගුලාසි මෙම උත්සවය පැවැත්වෙන කාල සීමාව තුළ වලංගුවනවා ඇත.

ඉමෙල්ඩා සුකුමාර්,
දිස්ත්‍රික් ලේකම්/දිසාපති
මුලතිව් දිස්ත්‍රික්කය.

2010 මැයි මස 05 වැනි දින,

05-731

---

එල්. ඩී. බී. 277/40

**(188 වැනි අධිකාරය වූ ) පුරාවස්තු ආඥාපනත**

19 වැනි වගන්තිය යටතේ දැන්වීම

(188 වැනි අධිකාරය වූ) පුරාවස්තු ආඥාපනතේ කාර්ය සඳහා මේ දැන්වීමෙහි උපලේඛනයේ නිශ්චිතව දැක්වෙන ස්මාරක, ආරක්ෂක ස්මාරක බවට ප්‍රකාශයට පත් කරමින් එම ආඥාපනතේ 18 වැනි වගන්තිය යටතේ නියමයක් කිරීමට අදහස් කරන බව සංස්කෘතික කටයුතු සහ ජාතික උරුමයන් පිළිබඳ අමාත්‍ය මහින්ද යාපා අබේවර්ධන වන මා විසින් මෙයින් දැනුම් දෙනු ලැබේ.

ඉහත කී නියමය කිරීමට එරෙහිව යම් විරෝධතා ඇත්නම් එම විරෝධතා 2010.06.12 දින හෝ එදිනට පෙර පුරාවිද්‍යා අධ්‍යක්ෂ ජනරාල්වරයා, කොළඹ යන ලිපිනය වෙත එවිය යුතු ය. එවැනි සෑම විරෝධතාවක්ම ලිඛිතව ඉදිරිපත් කළ යුතු අතර, එම විරෝධතාව/විරෝධතා ඉදිරිපත් කරනු ලබන්නේ යම් හේතු මත ද, එම හේතු පිළිබඳ ප්‍රකාශයක් එහි අන්තර්ගත විය යුතුය.

සංස්කෘතික කටයුතු හා ජාතික
උරුමයන් පිළිබඳ අමාත්‍ය.

2010 මාර්තු මස 27 වැනි දින,
කොළඹ දී ය.

**උපලේඛනය**

***ආරක්ෂක ස්මාරක ලෙස ප්‍රකාශයට පත් කරනු ලබන ස්මාරක ලේඛනය***

*කුරුණෑගල දිස්ත්‍රික්කය :*

01. වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, කුරුණෑගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 381 කුරුණෑගල නගරය උතුර ග්‍රාම නිලධාරි වසමේ පිහිටි ශ්‍රී ශෛලතලාරාම විහාර භූමියට අයත් කටාරම් කෙටූ ලෙන.

02. වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, කුරුණෑගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 771, හඳමාගම ග්‍රාම නිලධාරි වසමේ බිසෝගල නමැති ස්ථානයේ ඇති කටාරම් කෙටූ ලෙන.

03. වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, කුරුණෑගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, මල්ලවපිටිය ග්‍රාම නිලධාරි වසමේ පිහිටි පහළ ගැට්ටුවාන ග්‍රාමයේ ඇති මහදුරයාගේ සොහොන.

04. වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, කුරුණෑගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 822, විල්බාව ග්‍රාම නිලධාරි වසමේ පිහිටි විල්බාව රජමහා විහාර භූමියට අයත් බ්‍රාහ්මීය සෙල්ලිපිය සහිත කටාරම් කෙටූ ලෙන.

05. වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, කුරුණෑගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 771, ගිණිකරාව ග්‍රාම නිලධාරි වසමේ පිහිටි ගිණිකරාව රජමහා විහාර භූමියට අයත් කටාරම් කොටන ලද ලෙන් විහාරය.

06. වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, කුරුණෑගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 771, හඳමාගම ග්‍රාම නිලධාරි වසමේ පිහිටි හඳමාගම විහාර භූමියට අයත් කටාරම් සහිත ලෙන්.

07. වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, ගනේවත්ත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 440, අරංකැලේ ග්‍රාම නිලධාරි වසමේ පිහිටි බන්නැග්ගම බණමඩුව නමැති ස්ථානයේ ඇති පෞරාණික නටබුන් ගොඩනැගිලි සංකීර්ණය.

08. වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, ගනේවත්ත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 464, මාලගමුව ග්‍රාම නිලධාරි වසමේ පිහිටි උඩුබඩගම පුරාණ විහාර භූමියට අයත් ටැම්පිට විහාරය.

09. වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, නිකවැරටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 329, දිවුල්ලෑගොඩ ග්‍රාම නිලධාරි වසමේ පිහිටි ගනේවැව පුරාණ විහාර භූමියට අයත් පැරණි පිළිමගෙය.

10. වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, පොල්ගහවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ආරගොඩ ග්‍රාම නිලධාරි වසමේ පිහිටි ගලදෙණිකඩ පුරාණ විහාර භූමියට අයත් කටාරම් කෙටූ ගල්ලෙන සහ පැරණි චිත්‍රමූර්ති සහිත කුඩා ලෙන් විහාරය.

11. වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, පොල්ගහවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, කැඩලිත්තාවල ග්‍රාම නිලධාරි වසමේ පිහිටි ගොනටුවේගෙදර පත්තිනි දේවාල භූමියේ ඇති පැරණි ටැම්පිට දේවාල ගෘහය.

12. වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, නාරම්මල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, දඹදෙණි දකුණ ග්‍රාම නිලධාරි වසමේ පිහිටි නාගහමුල දේවාල නටබුන් ස්ථානයේ ඇති ගල්කණු සහිත නටබුන් ස්ථානය.

13. වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, කුරුණෑගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 840, කුරුණෑගල ඊසාන ග්‍රාම නිලධාරි වසමේ කුරුණෑගල මහනගර සීමාවට අයත් ජේතවන පිරිවෙන් භූමියේ ඇති කටාරම් සහිත ගල්ලෙන් දෙක.

*ගාල්ල දිස්ත්‍රික්කය :*

14. දකුණු පළාතේ, ගාල්ල දිස්ත්‍රික්කයේ, බද්දේගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 204 තෙලිකඩ ග්‍රාම නිලධාරි වසමේ පිහිටි

තෙලිකඩ ශ්‍රී සුනන්දාරා පුරාණ විහාර භූමියේ ඇති පැරණි සිතුවම් සහ මූර්ති සහිත ප්‍රතිමා ගෘහය.

15. දකුණු පළාතේ, ගාල්ල දිස්ත්‍රික්කයේ, තවලම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, පනංගල ග්‍රාම නිලධාරී වසමේ පිහිටි පනංගල ගංගාරාම විහාර භූමියට අයත් පෞරාණික සිතුවම් සහ මූර්ති සහිත පිළිම ගෙය.

16. දකුණු පළාතේ, ගාල්ල දිස්ත්‍රික්කයේ, වැලිවිටිය දිවිතුර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 196ඒ, වාඩුවැලිවිටිය ගංගාරාම විහාර භූමියේ ඇති පැරණි සිතුවම් මූර්ති සහිත ප්‍රතිමා ගෘහය සහ ස්තූපය.

17. දකුණු පළාතේ, ගාල්ල දිස්ත්‍රික්කයේ, බද්දේගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 204 තෙලිකඩ ග්‍රාම නිලධාරී වසමේ පිහිටි අංපිටිය දේවාල භූමියේ ඇති පෞරාණික ගල්කුළුණු.

18. දකුණු පළාතේ, ගාල්ල දිස්ත්‍රික්කයේ, නාගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 216 නාගොඩ ග්‍රාම නිලධාරී වසමේ පිහිටි ජයසිංහාරාම පුරාණ විහාර භූමියට අයත් පැරණි ධර්ම ශාලාව.

19. දකුණු පළාතේ, ගාල්ල දිස්ත්‍රික්කයේ, ඇල්පිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 31 අමුගොඩ ග්‍රාම නිලධාරී වසමේ පිහිටි ඉහළගොඩ සිරිවිජයාරාම විහාර භූමියේ ඇති පැරණි සිතුවම් සහිත ප්‍රතිමා ගෘහය.

*මාතර දිස්ත්‍රික්කය :*

20. දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ, කොටපොල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 240ඒ, කොළවෙනිගම ග්‍රාම නිලධාරී වසමේ පිහිටි කොළවෙනිගම රජමහා විහාර භූමියේ ඇති පැරණි ප්‍රතිමා ගෘහය.

*මාතලේ දිස්ත්‍රික්කය :*

21. මධ්‍යම පළාතේ, මාතලේ දිස්ත්‍රික්කයේ, මාතලේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, දොඹවෙල ග්‍රාම නිලධාරී වසමේ පිහිටි පලාපත්වල පල්ලෙගනේ පොත්ගුල් විහාර භූමියේ ඇති පැරණි ප්‍රතිමා ගෘහය සහ අවාස ගෘහය.

22. මධ්‍යම පළාතේ, මාතලේ දිස්ත්‍රික්කයේ, උකුවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, නාගහතැන්න දොඹවෙල ග්‍රාම නිලධාරී වසමේ පිහිටි රෙඩ්බානාගම වරකන්ද ගෘප් වතු බංගලාව.

*මහනුවර දිස්ත්‍රික්කය :*

23. මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, ගඟවට කෝරළය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, මහනුවර ග්‍රාම නිලධාරී වසමේ මහනුවර නගරයේ පිහිටි ශාන්ත අන්තෝනි දේවස්ථාන භූමියේ ඇති රැස්වීම් ශාලාව.

24. මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, ගඟවට කෝරළය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 257 මහනුවර ග්‍රාම නිලධාරී වසමේ මහනුවර නගරයේ පිහිටි දේව වීදියේ ඇති මුලාදෑනි මන්දිරය.

25. මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, ගඟවට කෝරළය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, බූවැලිකඩ ග්‍රාම නිලධාරී වසමේ පිහිටි බූවැලිකඩ පැරණි උසාවි ගොඩනැගිල්ල හා ඊට උතුරු දෙසින් ඇති පැරණි ගොඩනැගිලි හතර (04).

26. මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, ගඟවට කෝරළය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, තල්වත්ත ග්‍රාම නිලධාරී වසමේ පිහිටි තල්වත්ත ගංගරාම විහාර භූමියේ ඇති ප්‍රතිමාගෘහය.

27. මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, ගඟවට කෝරළය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, සුදුහුම්පොල ග්‍රාම නිලධාරී වසමේ සුදුහුම්පොල රජමහා විහාර භූමියට අයත් ප්‍රතිමා ගෘහය.

28. මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, ගඟවට කෝරළය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, වට්ටාරන්තැන්න ග්‍රාම නිලධාරී වසමේ පිහිටි වට්ටාරන්තැන්න පුරාණ ගල්ලෙන් විහාර භූමියේ ඇති කටාරම් කෙටූ ලෙන හා ප්‍රතිමා ගෘහය.

29. මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, ගඟවට කෝරළය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 254 මල්වත්ත ග්‍රාම නිලධාරී වසමේ මහනුවර නගරයේ පිහිටි මල්වත්ත පෝයමළු විහාර භූමියට අයත් ප්‍රතිමා ගෘහය සහිත පෝය ගෙය.

30. මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, ගඟවට කෝරළය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, මල්වත්ත ග්‍රාම නිලධාරී වසමේ මහනුවර නගරයේ පිහිටි නාගවිමාන කන්දේ විහාර භූමියේ ඇති පැරණි ප්‍රතිමා ගෘහය.

31. මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, උඩුනුවර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, උරුලෑවත්ත ග්‍රාම නිලධාරී වසමේ පිහිටි උරුලෑවත්ත පුරාණ විහාර භූමියේ සහ සත්පත්තිනි දේවාල භූමියේ ඇති චෛත්‍ය සහිත කටාරම් කෙටූ ලෙන් විහාරය සහ පියගැට පෙළ.

32. මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, හතරලියද්ද ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, දංකුඹුර ග්‍රාම නිලධාරී වසමේ පිහිටි දංකුඹුර පුරාණ විහාර භූමියේ ඇති ටැම්පිට ප්‍රතිමා ගෘහය සහ පැරණි ආවාස ගෘහය.

33. මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, පාතදුම්බර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 615 උඩතලවින්න ග්‍රාම නිලධාරී වසමේ පිහිටි වෙහෙරගල පැරණි චෛත්‍යය.

*නුවරඑළිය දිස්ත්‍රික්කය :*

34. මධ්‍යම පළාතේ, නුවරඑළිය දිස්ත්‍රික්කයේ, හඟුරන්කෙත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, උඩමළුව ග්‍රාම නිලධාරී වසමේ පිහිටි හඟුරන්කෙත පොත්ගුල් මාළිගා විහාර භූමියේ ඇති පෞරාණික ලක්ෂණ සහිත සංඝාවාසය.

*කළුතර දිස්ත්‍රික්කය :*

35. බස්නාහිර පළාතේ, කළුතර දිස්ත්‍රික්කයේ, පාතදුම්බර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 620 හොරේතුඩුව ග්‍රාම නිලධාරී වසමේ පිහිටි හොරේතුඩුව ගංගාරාම විහාර භූමියේ ඇති පැරණි ධර්ම ශාලාව.

*කෑගල්ල දිස්ත්‍රික්කය :*

36. සබරගමුව පළාතේ, කෑගල්ල දිස්ත්‍රික්කයේ, අරණායක ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අස්මඩල ග්‍රාම නිලධාරී වසමේ පිහිටි අස්මඩල බොදුරල්ල හේනවත්ත නමැති ඉඩමේ ඇති ශිලා ලිපිය සහිත කටාරම් කොටන ලද ලෙන.

37. සබරගමුව පළාතේ, කෑගල්ල දිස්ත්‍රික්කයේ, අරණායක ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අස්මඩල ග්‍රාම නිලධාරී වසමේ පිහිටි අස්මඩල ගල්ගොඩ හේනවත්ත නමැති ඉඩමේ ඇති ප්‍රාග් ඓතිහාසික සංකේත සහිත ලෙන සහ කටාරම් කොටන ලද ලෙන.

38. සබරගමුව පළාතේ, කෑගල්ල දිස්ත්‍රික්කයේ, අරණායක ප්‍රාදේශීය ලේකම් කොට්ටාසයේ, අස්මඩල ග්‍රාම නිලධාරී වසමේ පිහිටි අස්මඩල දුණුමිදිඇල්ල රක්ෂිතය නමැති ස්ථානයේ පිහිටි කටාරම් කොටන ලද ගල්ලෙන.

39. සබරගමුව පළාතේ, කෑගල්ල දිස්ත්‍රික්කයේ, අරණායක ප්‍රාදේශීය ලේකම් කොට්ටාසයේ, අස්මඩල ග්‍රාම නිලධාරී වසමේ පිහිටි ඉහළ කඩේ අස්මඩල නමැති ස්ථානයේ ඇති කටාරම් කොටන ලද ගල්ලෙන.

40. සබරගමුව පළාතේ, කෑගල්ල දිස්ත්‍රික්කයේ, කෑගල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ටාසයේ, අතුරුපාන ග්‍රාම නිලධාරී වසමේ පිහිටි දෙගලතිරිය ගලඋඩතැන්න විහාර භූමියට අයත් කටාරම් සහිත ලෙන.

05-773

---

### රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය

### නව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස හා ග්‍රාම නිලධාරී වසම් පිහිටුවීම සහ ප්‍රතිශෝධනය කිරීම සඳහා යෝජනා කැඳවීම

පරිපාලනමය හා සංවර්ධනමය ප්‍රමුඛතා පදනම් කර ගනිමින් නව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස හා ග්‍රාම නිලධාරී වසම් පිහිටුවීම සහ ප්‍රතිශෝධනය කිරීම පිළිබඳව ලැබෙන විවිධ ඉල්ලීම් සලකා බලා නිර්දේශ ඉදිරිපත් කිරීම පිණිස රජය විසින් සීමා නිර්නය කමිටුවක් පත්කර ඇත. .

01. ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ ජ්‍යෙෂ්ඨ උපදේශක සහ ශ්‍රී ලංකා මහ බැංකුවේ හිටපු අධිපති එච්. බී. දිසානායක මහතා සභාපතිත්වය දරන මෙම කමිටුවට දැනට රාජ්‍ය සේවයේ සිටින හා විශ්‍රාමික ප්‍රවීන නිලධාරීන් දහතුන් දෙනෙක් ඇතුළත් වේ.

02. මෙම කමිටුවේ නිර්ණය විෂය පථය පහත පරිදි වේ :

2.1 නව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස පිහිටුවීම හා පවත්නා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස සීමා ප්‍රතිශෝධනය කිරීමට අදාළ යෝජනා/ඉල්ලීම් අධ්‍යයනය කර නිර්දේශ ඉදිරිපත් කිරීම.

2.2 නව ග්‍රාම නිලධාරී වසම් පිහිටුවීම හා ග්‍රාම නිලධාරී වසම් සීමා ප්‍රතිශෝධනය කිරීමට අදාළ යෝජනා/ඉල්ලීම් අධ්‍යයනය කර නිර්දේශ ඉදිරිපත් කිරීම.

3. ඉහත සඳහන් 2.1 හා 2.2 කරුණු පිළිබඳව ලිඛිත නියෝජන පහත ආකෘති පරිදි සවිස්තරාත්මකව ඉදිරිපත් කරන ලෙස කමිටුව විසින් මහජන නියෝජිතයන්, සිවිල් සංවිධාන, රාජ්‍ය නිලධාරීන් හා මහජනතාවට ආරාධනා කරන අතර, එම නියෝජනයන් 2010.05.30 වැනි දිනට හෝ ඊට පෙර කමිටු ලේකම් වෙත ලැබෙන සේ පහත ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් හෝ විද්‍යුත් තැපෑලෙන් හෝ පැමිණ භාරදෙන ලෙස කාරුණිකව දැනුම් දෙමි. (මෙම තොරතුරු www.pubad.gov.lk වෙබ් අඩවිය මගින් ද ලබා ගත හැකිය.).

එස්. කේ. වීරතුංග,
ලේකම්,
සීමා නිර්ණය කමිටුව.

2010 අප්‍රේල් මස 26 වැනි දින,

දිනය :..................

* මහජන නියෝජිතයාගේ/
සිවිල් සංවිධානයේ/
රාජ්‍ය නිලධාරියාගේ/
ලියුම්කරුගේ
} නම :.....................

* ලිපිනය :.....................දුරකථන අංකය :........................

* මෙම යෝජනාව අළුතින් පිහිටුවන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයක් සඳහා ද නැතහොත් දැනටමත් පවතින ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයක ප්‍රතිශෝධනයක් ද යන වග :........................

* මෙම යෝජනාව අළුතින් පිහිටුවන ග්‍රාම නිලධාරී කොට්ඨාසයක් සඳහා ද නැතහොත් දැනටමත් පවතින ග්‍රාම නිලධාරී කොට්ඨාසයක ප්‍රතිශෝධනයක් ද යන වග :........................

* යෝජනාව සහ යෝජනාවට මූලික වූ හේතු :........................ (කරුණාකර ඔබගේ යෝජනා, එම යෝජනාවට මූලික වූ හේතූන් ද සමග වෙනත් කඩදාසියක සටහන් කර මෙයට අමුණන්න. එක් එක් යෝජනාව සඳහා වෙන වෙනම වාර්ත ඉදිරිපත් කරන්න)

ලිපිනය : එස්. කේ. වීරතුංග,
(අතිරේක ලේකම් - ස්වදේශ කටයුතු),
සීමා නිර්ණය කමිටුවේ ලේකම්,
රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය,
නිදහස් චතුරශ්‍රය, කොළඹ 07

දුරකථන අංකය : 2687772, 2687774, 2696211.
විද්‍යුත් තැපැල : adsecha@pubad.gov.lk..
ෆැක්ස් : 2688206, 2691073.

05-611

---

## විවිධ දෙපාර්තමේන්තු දැන්වීම්

### මහජන බැංකුව - දඹුල්ල ශාඛාව

### 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඩී වැනි වගන්තිය යටතේ යෝජනාව

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඩී වැනි වගන්තිය යටතේ මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2009.11.27 වැනි දින පහත සඳහන් යෝජනාව ඒකමතිකව සම්මත කර ගන්නා ලද බැව් මෙයින් නිවේදනය කරනු ලැබේ.

මාතලේ ප්‍රසිද්ධ නොතාරිස් ඒ. කේ. විජේරත්න මහත්මිය විසින් මහජන බැංකුව නමට ලියා සහතික කරන ලද 2006.07.13 දිනැති අංක 5354 දරන උකස්කරය ප්‍රකාර අයවිය යුතු ගෙවීම් නැකැත්ගෙදර විජේසේකර මුදියන්සේලාගේ රංජිත් විජේසේකර යන අය විසින් පැහැර

හැර ඇති හෙයින් ද, එකී උකස්කරය යටතේ රුපියල් හාරලක්ෂ අසූහය දහස් තිහයි ශත විසිපහ (රු. 4,86,030.25) ක මුදලක් දැනට මහජන බැංකුවට අයවීමට ඇති බැවින් ද එකී රුපියල් හාරලක්ෂ අසූහය දහස් තිහයි ශත විසිපහ (රු. 4,86,030.25) ක මුදල මත 2009.01.22 වැනි දින සිට වෙන්දේසි දිනය දක්වා අවුරුද්දට සියයට දහසයයි දශම හතයි පහ (16.75%) බැගින් තවදුරටත් පොළිය හා අදාල මහජන බැංකු පනතේ 29එල් (29L) වගන්තිය යටතේ අයකරනු ලැබිය යුතු මුදල් සහ ගාස්තු සමග ඉන් අනතුරුව යම්කිසි ගෙවීම් කිසිවක් ලැබී ඇත්නම් ඒවා අඩුව එකී රුපියල් හාරලක්ෂ අසූහය දහස් තිහයි ශත විසිපහ (රු. 4,86,030.25) ක මුදල අයකර ගැනීම සඳහා මහනුවර ෂොක්මන් සහ සමරවික්‍රම බලයලත් වෙන්දේසිකාර මහතා විසින් එකී අංක 5386 දරන උකස්කරය යටතේ එකී බැංකුවට උකස්කර ඇති දේපළ සහ පරිශ්‍රයන් ප්‍රසිද්ධ වෙන්දේසියේදී විකිණිය යුතු යැයි 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනත යටතේ තමන් වෙත පැවරී ඇති බලතල අනුව මහජන බැංකුවේ අධ්‍යක්ෂ මෙයින් තීරණය කරයි.

### උකස්කර ඇති දේපළ පිළිබඳ විස්තරය

මධ්‍යම පළාතේ, මාතලේ දිස්ත්‍රික්කයේ, මාතලේ උතුරු කොට්ඨාසයේ වගපනහ පල්ලේසිය හත්පත්තුවේ කෝරළේ, තිත්තවැල්ගොල්ලේ පිහිටා තිබෙන වර්ෂ 1967ක් වූ නොවැම්බර් මස 08 වැනි දින කේ. කුමාරස්වාමි බලයලත් මිනින්දෝරු මහතා විසින් මැන සකස් කරන ලද අංක 4236 දරන පිඹුරේ සඳහන් පතගයාය, තණහේන්යාය, ඇතිනිවැටිච්චියාය, දියපලක්යාය හෙවත් දැනට දඹුළුඔය එස්ටේට් නමින් හඳුන්වනු ලබන අක්කර දාහතයි පර්චස් දහය (අ. 17, රූ. 0, පර්. 10)ක් විශාල ඉඩමට ඉහත කී පිඹුරේ ප්‍රකාර මායිම්, උතුරට : ජයවතීට අයත් මෙම ඉඩමේ කොටසක් ද, නැගෙනහිරට : මාතලේ සිට දඹුල්ල දක්වා වැටී ඇති මහ පාර ද, දකුණට : මෙම ඉඩමේ ඉතිරි කොටසක්වන දැනට කළ්‍යාණි එස්ටේට් නමැති ඉඩම ද, සහ බස්නාහිරට : දඹුළු ඔය ද යන මෙකී මායිම් තුළ පිහිටි ඉඩමෙන් බෙදා වෙන් කළ කොටසට බලයලත් මිනින්දෝරු සිරි බෝපේ ආරච්චි මහතා විසින් 1995.07.07 වැනි දින මැන සාදන ලද අංක 1835 දරන පිඹුරේ ලොට් 78 දරන ප්‍රමාණයෙන් පර්චස් දොලහ (අ. 0, රූ. 0, පර්. 12) ක් විශාල ඉඩම මායිම්, උතුරට : අංක 1835 පිඹුරේ අංක 101 දරන පාරකට වෙන්කළ බිම් තීරය ද, නැගෙනහිරට : එකී අංක 1835 පිඹුරේ ලොට් අංක 77 ද, දකුණට : අංක 1800 පිඹුරේ මීටර් 03ක් පළල පුද්ගලික පාර සහ බස්නාහිරට : අංක 1835 පිඹුරේ ලොට් 79 ද යන මායිම් තුළ පිහිටි ඉඩම සහ එහි පිහිටි ගොඩනැගිලි ගහකොළ, පළතුරු ආදී සියලු දේත් එකී පිඹුරේ ලොට් 100 හා 161 දරන බිම් කැබලි වෙනත් ගැණුම්කරුවන් සමග පොදු පාරවල් වශයෙන් භාවිතා කිරීමේ අයිතිය ද වේ.

මෙම ඉඩම නව මිනුමකට අනුව පහත පරිදි විස්තර වේ :

ඉහත කී තිත්වැල්ගොල්ලේ පිහිටි දඹුළුඔය එස්ටේට් නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ඒ. එම්. අනුරරත්න මහතා විසින් 2006.03.12 වැනි දින සාදන ලද අංක 3182 දරන පිඹුරේ ලොට් ඒ වශයෙන් දැක්වෙන ප්‍රමාණයෙන් පර්චස් දොලහ (අ. 0, රූ. 0, පර්. 12)ක් විශාල ඉඩමට මායිම්, උතුරට : සිරි බෝපේආරච්චි බලයලත් මිනින්දෝරු මහතාගේ අංක 1835 පිඹුරේ ලොට් 101 දරන (පාර), නැගෙනහිරට : ඉහත කී බෝපේආරච්චි බලයලත් මිනින්දෝරු මහතාගේ අංක 1835 දරන පිඹුරේ ලොට් 77 ද. දකුණට : ඉහත කී බෝපේආරච්චි බලයලත් මිනින්දෝරු මහතාගේ අංක 1800 දරන පිඹුරේ ලොට් 03 (පුද්ගලික පාර) සහ බස්නාහිරට : ඉහත කී බෝපේආරච්චි බලයලත් මිනින්දෝරු මහතාගේ අංක 1835 දරන පිඹුරේ ලොට් 79 ද, යන මායිම් තුළ පිහිටි ඉඩම හා එහි පිහිටි ගොඩනැගිලි, ගහකොළ, පළතුරු ආදී සියලු දේත්, ඊට ප්‍රවේශ වීමට ඇති පොදු පාරවල් භාවිතා කිරීමේ අයිතිය ද සමග වේ.

මෙම දේපළ මාතලේ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ඩී 50 1/45හි ලියාපදිංචි වී ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ප්‍රාදේශීය කළමනාකාර, මාතලේ.

මහජන බැංකුව,
ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලය,
අංක 02, මීවත්තකුඹුර පාර,
මාතලේ.

05-716

---

## මහජන බැංකුව - බත්තරමුල්ල ශාඛාව

### 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඩී වගන්තිය යටතේ යෝජනාව

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඩී (29D) වගන්තිය යටතේ මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2009.09.25 වැනි දින පැවැත් වූ එකී අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී පහත සඳහන් යෝජනාව ඒකමතිකව සම්මත කර ගන්නා ලද බැව් මෙයින් නිවේදනය කරනු ලැබේ :

එකී අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේ දී මහජන බැංකුවේ නමට කොළඹ නීතිඥ හා ප්‍රසිද්ධ නොතාරිස් ඩී. කේ. කේ. වැලිකුඹුර මහත්මිය විසින් සහතික කරන ලද 2007.03.16 දිනැති අංක 1638 දරන උකස්කරය ප්‍රකාර ගෙවීම, දන්දෙනිය හේවගේ ගිල්බට් අනුර මයා යන අය විසින් පැහැර හැර ඇති බැවින් ද, එකී උකස්කරය යටතේ රුපියල් පහලොස් ලක්ෂයක (රු. 15,00,000) මුදලක් මහජන බැංකුවට අයවීමට ඇති බැවින් ද, 2009.02.01 වැනි දින සිට වර්ෂයකට සියයට විසිතුන බැගින් (23%) හා රුපියල් පහලොස් ලක්ෂයක (රු. 15,00,000) මුදලක් සඳහා වෙන්දේසි දිනය තෙක් තවදුරටත් පොළිය හා අදාළ මහජන බැංකු පනතේ 29 වගන්තිය යටතේ අයකරනු ලැබිය යුතු මුදල් හා ගාස්තු ද සමග අනතුරුව කිසියම් ගෙවීමක් ලැබී ඇත්නම් ඒවා අඩුව එකී රුපියල් පහලොස් ලක්ෂයක් (රු. 15,00,000) අයකර ගැනීම සඳහා කොළඹ බලයලත් වෙන්දේසිකාර ඊ. එස්. රාමනායක මිය විසින් එකී අංක 1638 දරන උකස්කරය යටතේ එකී බැංකුවට උකස්කර ඇති දේපළ හා පරිශ්‍රයන් ප්‍රසිද්ධ වෙන්දේසියක දී විකිණිය යුතු යැයි 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනත යටතේ තමන් වෙත පැවරී ඇති බලතල අනුව මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් තීරණය කරයි.

### උකස්කර ඇති දේපළ පිළිබඳ විස්තරය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, හේවාගම් කෝරළේ, පල්ලේ පත්තුවේ, හෝමාගම ප්‍රාදේශීය සභා සීමාව තුළ අතුරුගිරිය ඒකකයට අයත් වන තලවතුගොඩ යන ග්‍රාමයේ පිහිටි "ගොරකගහවත්ත" නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු එස්. වික්‍රමසිංහ මහතා විසින් 1994.12.10 වැනි දින මැන සාදන ලද අංක 6784ඒ දරන පිඹුරේ සඳහන් අංක 01 සිට 08 දක්වා වූ කොටස්වලට බෙදන ලදුව ඉහත කී තලවතුගොඩ යන ග්‍රාමයේ පිහිටි "ගොරකගහවත්ත" නමැති ඉඩමේ අංක 02 දරන කොටසට ඉහත කී අංක 6784ඒ දරන පිඹුරේ ප්‍රකාර මායිම්, උතුරට : අංක 01 දරන කොටස

ද, නැගෙනහිරට : අංක 07 දරන කොටස ද, දකුණට : අංක 03 දරන කොටස ද, බස්නාහිරට : අංක 126 දරන පිඹුරේ සඳහන් අංක 04 දරන කොටස ද, යන මායිම් තුළ පිහිටි පර්චස් නවයයි දශම පහ (අ. 0, රූ. 0, පර්. 9.5)ක් විශාල ඉඩම සහ එහි තුළ පිහිටි ගහකොළ, පළතුරු ආදී සියලු දේද වේ.

ඉහත කී තලවතුගොඩ යන ග්‍රාමයේ පිහිටි "ගොරකගහවත්ත" නැමති ඉඩමේ අංක 07 දරන කොටසට ඉහත කී අංක 6784ඒ දරන පිඹුරේ ප්‍රකාර මායිම්, උතුරට : අංක 01 දරන කොටස ද, නැගෙනහිර : අංක 04 සිට 06 දක්වා වූ කොටස් ද, දකුණට : අංක 08 දරන කොටස ද. බස්නාහිරට : අංක 03 සහ 02 දරන කොටස් ද, යන මායිම් තුළ පිහිටි පර්චස් හතරයි දශම අට (අ. 0, රූ. 0, පර්. 4.8) ක් විශාල බිම් තීරය පාරක් වශයෙන් පොදුවේ පාවිච්චි කිරිමේ අයිතිය ද සමග වේ.

ඉහත කී තලවතුගොඩ යන ග්‍රාමයේ පිහිටි "ගොරකගහවත්ත" නමැති ඉඩමේ අංක 8 දරන කොටසට ඉහත කී අංක 6784ඒ දරන පිඹුරේ ප්‍රකාර මායිම්, උතුරට : අංක 03, 07 සහ 04 දරන කොටස් ද, නැගෙනහිරට : අංක 126 දරන පිඹුරේ සඳහන් අංක 07 දරන කොටස ද, දකුණට : දැනට පවතින පාර ද, බස්නාහිරට : අංක 126 දරන පිඹුරේ සඳහන් අංක 04 දරන කොටස ද, යන මායිම් තුළ පිහිටි පර්චස් එකයි දශම නවය (අ. 0, රූ. 0, පර්. 1.9) ක් විශාල බිම් තීරය පාරක් වශයෙන් පොදුවේ පාවිච්චි කිරීමේ අයිතිය සමග වේ.

මෙම උකස්කරය හෝමාගම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ අංක 1057/157 යටතේ ලියාපදිංචි කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සහකාර සාමාන්‍යාධිකාරී,
බටහිර කලාපය II.

ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලය,
කොළඹ පිටත, මහජන බැංකුව,
අංක 102, ස්ටැන්ලි තිලකරත්න මාවත,
නුගේගොඩ.

05-715

---

## මහජන බැංකුව - කළුතර ශාඛාව

### 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඩී (29D) වගන්තිය යටතේ යෝජනාව

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඩී (29D) වගන්තිය යටතේ මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2009.08.03 දින පහත සඳහන් යෝජනාව ඒකමතිකව සම්මත කර ගන්නාල ද බැව් මෙයින් නිවේදනය කරනු ලැබේ.

කළුතර ප්‍රසිද්ධ නොතාරිස් මේරියන් සන්ධ්‍යා ද සිල්වා මිය විසින් සහතික කරන ලද 2005.09.06 දිනැති අංක 1069 දරන උකස්කරය ප්‍රකාර ගෙවීම්, සම්පත් චමින්ද රඹුක්පොත යන අය විසින් පැහැර හැර ඇති බැවින් ද, එකී උකස්කරය යටතේ දැනට රුපියල් එක්ලක්ෂ පනස් පන්දහස් දෙසීය අනූහයයි ශත හැත්තෑ හතරක් (රු. 1,55,296.74) ක මුදලක් මහජන බැංකුවට අයවීමට ඇති බැවින් ද, 2008.06.27 වැනි දින සිට වර්ෂයකට 17% බැගින් රුපියල් එක්ලක්ෂ පනස් පන් දහස් දෙසීය අනූහයයි ශත හැත්තෑ හතරක් (රු. 1,55,296.74) ක මුදලක් සඳහා වෙන්දේසි දිනය තෙක් තවදුරටත් පොළිය හා අදාල මහජන බැංකු පනතේ 29එල් (29L) වගන්තිය යටතේ අයකර ගනු ලැබිය යුතු මුදල් සහ ගාස්තු ද සමග අනතුරුව කිසියම් ගෙවීමක් ලැබී ඇත්නම් ඒවා අඩුව එකී රුපියල් එක්ලක්ෂ පනස් පන්දහස් දෙසීය අනූහයයි ශත හැත්තෑ හතරක් (රු. 1,55,296.74) ක මුදල අයකර ගැනීම සඳහා බලයලත් වෙන්දේසිකාර ඊ. සමන්මලී රාමනායක විසින් එකී අංක 1069 දරන උකස්කරය යටතේ එකී බැංකුවට උකස්කර ඇති දේපළ සහ පරිශ්‍රයන් ප්‍රසිද්ධ වෙන්දේසියකදී විකිණිය යුතු යැයි 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනත යටතේ තමන් වෙත පැවරී ඇති බලතල අනුව මහජන බැංකුවේ අධ්‍යක්ෂ මෙයින් තීරණය කරයි.

### උකස්කර ඇති දේපළ පිළිබඳ විස්තරය

මතුගම ඉඩම් ලියාපදිංචි කිරිමේ කාර්යාලයේ ඊ 330/247 දරන පත්ඉරුවේ ලියාපදිංචි වී ඇති බස්නාහිර පළාතේ, කළුතර දිස්ත්‍රික්කයේ, නැගෙනහිර පස්දුන් කෝරළේ, උතුරු මහ පත්තුවේ, පින්නගොඩ ග්‍රාමයේ පිහිටි "ලියනගෙවත්ත" නමැති ඉඩමට අවසරලත් මානක බී. ඒ. පී. ජයසූරිය මහතා විසින් 2004.09.06 දින මැන සකස් කරන ලද අංක 3500 දරන පිඹුරේ කැබලි අංක 5බී ලෙස සඳහන් ඉඩමට මායිම්, උතුරට : 5ඒ සහ 5සී (පාර පළල අඩි 10) මෙම ඉඩමේ කැබලි අංක 02 ද, නැගෙනහිරට : මෙම ඉඩමේ කැබලි අංක 2 සහ පල්ලෙලියාද්ද කුඹුර ද, දකුණට : ඇලබට් සේනානායක සහ තවත් අය හිමිකම් කියන ඉඩම සහ බස්නාහිරට : ඇල්බට් සේනානායක සහ තවත් අය හිමිකම් කියන ඉඩම සහ 5ඒ සහ 5සී (පාර පළල අඩි 10) යන මායිම් තුළ පිහිටි රූඩ් එකයි පර්චස් විස්ස (අ. 0, රූ. 1, පර්. 20)ක් හෙවත් හෙක්. 0.15176 විශාල ඉඩම සහ ඒ තුළ පිහිටි සියළුම ගොඩනැගිලි, ගහකොළ, පළතුරු, ආදී සියළුම දේ ද

ඉහත කී පිඹුරේ පෙන්වා දී ඇති කැබලි අංක 5 ලෙස සඳහන් කොට ඇති පාර සහ අංක 5සී වශයෙන් පෙන්වා ඇති අඩි 10ක් පළල පාරක් වශයෙන් පෙන්වා ඇති සියළුම මාර්ග අයිතීන්ගේ පරවශ්‍යතා අයිතිය ද සමග වේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ප්‍රාදේශීය කළමනාකරු,
කළුතර.

මහජන බැංකුව,
කලාප ප්‍රධාන කාර්යාලය (කළුතර),
අංක 341, ගාලු පාර,
පානදුර.

05-714

---

## මහජන බැංකුව - මල්වත්ත පාර ශාඛාව

### 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඩී වගන්තිය යටතේ යෝජනාව

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඩී වගන්තිය යටතේ මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පහත සඳහන් යෝජනාව ඒකමතිකව සම්මත කර ගන්නා ලද බැව් මෙයින් නිවේදනය කරනු ලැබේ :

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ඒ. දීප්ති ආර්. මෙන්ඩිස් විසින් මහජන බැංකුවේ නමට ලියා සහතික කරන ලද 2008.08.06 දිනැති අංක 3479

දරන උකස්කරය ප්‍රකාර අයවිය යුතු මුදල් ගෙවීම සීමාසහිත ට්‍රාන්ස් වර්ල්ඩ් ෆොවර්ඩිං සීඑම්බී (පෞද්ගලික) ආයතනය විසින් පැහැර හැර ඇති හෙයින් ද එකී අංක 3479 දරන උකස්කර මත, රුපියල් හතලිස් අටලක්ෂ දොලොස්දහස් අටසිය හැත්තෑපහයි ශත අසූ එකක (රු. 48.12,875.81) මුදලක් මජන බැංකුවට දැනට ලැබිය යුතු සහ අයවිය යුතුව ඇති බැවින් ද,

2008.11.30 වැනි දින වර්ෂයට සියයට විසිහය (26%) බැගින් රුපියල් හතලිස්අටලක්ෂ දොලොස්දහස් අටසිය හැත්තෑපහයි ශත අසූ එකක (රු. 48.12,875.81) මුදල සඳහා දේපළ විකිණීමේ දිනය තෙක් තවදුරටත් පොළිය සහ වෙන්දේසි ගාස්තු ද සමග අනතුරුව කිසියම් ගෙවීමක් ලැබී ඇත්නම් ඒවා අඩුව, එකී රුපියල් හතලිස් අටලක්ෂ දොලොස්දහස් අටසිය හැත්තෑපහයි ශත අසූ එකක (රු. 48.12,875.81) මුදල අයකර ගැනීම සඳහා කොළඹ බලයලත් වෙන්දේසිකාර ඊ. එස් රාමනායක විසින් එකී අංක 3479 දරන උකස්කරය යටතේ එකී බැංකුවට උකස්කර ඇති දේපළ සහ පරිශ්‍රයන් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි වර්ෂ 1985 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනත යටතේ තමන් වෙත පැවරී ඇති බලතල අනුව මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් තීරණය කරයි.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, හේවාගම් කෝරළේ, පල්ලේ පත්තුවේ, තලවතුගොඩ ගමේ පිහිටා ඇති "මිල්ලගහවත්ත" නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ඩී. කපුගීකියන මහතා විසින් 1993 ඔක්තෝබර් මස 24 වැනි දින මැන සාදන ලද අංක 3839 දරන පිඹුරේ නිරූපිත බෙදා වෙන් කරන ලද "ලොට් 3" දරන ඉඩම් කොටසට මායිම්, උතුරට : ලොට් 2 ද, නැගෙනහිරට : ලොට් 4, (පරක් සඳහා වෙන් කර ඇත), දකුණට : පන්සල පාර සහ බටහිරට : අංක 6599 දරන පිඹුරේ ලොට් A ද යන මෙකී මායිම් තුළ පිහිටි පර්චස් දහඅටයි දශම නවයයි බිංදුවක් (අ. 0, රූ. 0, පර්. 18.90) විශාල ඉඩම සහ ඒ තුළ පිහිටි ගොඩනැගිලි, වැවිලි ආදී සියලු දේ ද වේ. මෙම ඉඩම හෝමාගම ඉඩම් ලියාපදිංචි කිරිමේ කාර්යාලයේ G1781/143 යටතේ ලියාපදිංචි කර ඇත.

පහත විස්තර කර ඇති "ලොට් 4" මතින් ගමන් කිරිමේ මාර්ග අයිතිය ද සමග වේ.

ඉහත කී තලවතුගොඩ ගමේ පිහිටා ඇති ඉහත කී "මිල්ලගහවත්ත" නමැති ඉඩමේ අංක 3839 දරන පිඹුරේ නිරූපිත බෙදා වෙන් කරන ලද "ලොට් 4" දරන ඉඩම් කොටසට මායිම්, උතුරට : ලොට් 1 ද, නැගෙනහිරට : අංක 6599 දරන පිඹුරේ ලොට් C ද , දකුණට : පන්සල පාර සහ බටහිරට : ලොට් 2 සහ 3 ද යන මෙකී මායිම් තුළ පිහිටි පර්චස් අටක් (අ. 0. රූ. 0, පර්. 8) විශාල ඉඩම සහ ඒ තුළ පිහිටි ගොඩනැගිලි, වැවිලි ආදී සියලු දේ ද වේ. මෙම ඉඩම හෝමාගම ඉඩම් ලියාපදිංචි කිරිමේ කාර්යාලයේ G1303/281 යටතේ ලියාපදිංචි කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ප්‍රාදේශීය කළමනාකරු,
(කොළඹ උතුර).

මහජන බැංකුව,
කලාප ප්‍රධාන කාර්යාලය,
(බටහිර කලාප - 01),
අංක 11, ඩියුක් වීදිය,
කොළඹ 01

05-711

### රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව

1981හි අංක 62 දරන පනතින් හා 1984හි අංක 29 දරන පනතින් සංශෝධිත පරිදි 1975හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය යටතේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගැණුනු යෝජනාව

ණය අංකය : 6/47856/එෆ්6/721.

රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2010.03.01 වැනි දින පැවැත්වුණු රැස්වීමේ දී පහත සඳහන් අයුරු විශේෂයෙන් හා ඒකමතිකව තීරණය කරන ලදී :

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ඩබ්. ජේ. ඒ. ප්‍රනාන්දු විසින් සහතික කරන ලද 2005.01.28 දින හා අංක 1569 දරන උකස් බැඳුම්කරය මත අයවිය යුතු මුදල් ගෙවීම, පානදුර පදිංචි බැමිණාහැන්නදිගේ හේමසිරි ප්‍රනාන්දු සහ කිරිමඩු දුරයලාගේ යමුනා නිල්මිණී සිල්වා යන අය විසින් පැහැර හැර ඇති බැවින් ද, 2010.02.26 දිනට මුල් ණය මුදල හා එය මත පොළී වශයෙන් රුපියල් දෙලක්ෂ හැටහය දහස් හාරසිය හැට හතරයි ශත අනූ හතරක (රු. 2,66,464.94) මුදලක් ද, පූර්වෝක්ත බැඳුම්කර අංක 1569 ප්‍රකාර ගෙවිය යුතු මුදල සම්පූර්ණයෙන් ගෙවා නිම කරන දිනය වනතුරු දිනකට රුපියල් එකසිය විසිහතරයි ශත එකොළහ (රු. 124.11)ක් බැගින් වැඩිපුර පොළීය ද අයවිය යුතුව ඇති බැවින් ද, (මෙදිනට පසු කරන ලද ගෙවීම් අඩු කරන්න)

2. මෙම දැන්වීමේ පළමුවැනි ඡේදයේ දක්වා ඇති එකී මුදල සහ 1975හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 57 වැනි වගන්තිය යටතේ අයකර ගත යුතුව ඇති වියදම් හා මුදල් ආපසු අයකර ගැනීම උදෙසා මෙහි පහත උපලේඛනයේ විස්තර කර ඇති හා රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවට උකස්කර ඇති දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම සඳහා සංශෝධන සහිත 1975හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය ප්‍රකාර, වාද්දුව, තල්පිටිය උතුර, මැද පාර, අංක 40හි බලයලත් වෙන්දේසිකාර ඩී. පී. එල්. සී. ද සිල්වා මහතාට බලය පැවරිය යුතු වන්නේ ය.

### උපලේඛනය

කළුතර දිස්ත්‍රික්කයේ, පානදුර තොටමුනේ පානදුර තල්පිටි දෙබැද්දේ අංක 688 නැගෙනහිර පින්නවල ග්‍රාමසේවා කලාපයේ පින්නවල ගමේ පිහිටි අංක පී. පී. 579 දරන පිඹුරේ කැබලි අංක 19 නැවත මනින ලද කෝන්ගහවත්ත ඉඩමට 1998.10.29 දින බලයලත් මිනින්දෝරු ඩී. ඒ. විජේසූරිය විසින් මැන සකසන ලද අංක 1265 දරන පිඹුරට අනුව බෙදා දක්වා ඇති ප්‍රමාණයෙන් අ. 0, රූ. 0, පර්. 32.1ක් වූ බිම් කොටස.

මෙය පානදුර ඉඩම් ලියාපදිංචි කිරිමේ කාර්යාලයේ එල්ඩීබී 53/29 යටතේ ලියාපදිංචි වී ඇත.

මෙම ඉඩමට ප්‍රවේශ මාර්ගය ලෙස අංක 579 දරන පිඹුරට අනුව වේ.

අයි. විමලසේන,
වැඩබලන සාමාන්‍යාධිකාරී.

2010ක් මැයි මැයි මස 14 වැනි දින,
අංක 269,
ගාලු පාර, කොළඹ 03.

05-769/2

### රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව

1981හි අංක 62 දරන පනතින් හා 1984හි අංක 29 දරන පනතින් සංශෝධිත පරිදි 1975හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය යටතේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගැණුනු යෝජනාව

ණය අංකය : එස්-ජීපී/02/02155/එස්ඕ1/424.

රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2010.01.11 වැනි දින පැවැත්වුණු රැස්වීමේ දී පහත සඳහන් අයුරු විශේෂයෙන් හා ඒකමතිකව තීරණය කරන ලදී :

ගම්පහ ප්‍රසිද්ධ නොතාරිස් ඩී. ඒ. ඩබ්. ගුණසේකර විසින් සහතික කරන ලද 2003.12.15 වැනි දින හා අංක 2076 දරන උකස් බැඳුම්කරය මත අයවිය යුතු මුදල් ගෙවීම, දිවුලපිටිය පදිංචි විජය බෝපාරත්න අප්පුහාමිලාගේ අජිත් පුෂ්පලාල් සහ විජය බෝපාරත්න අප්පුාමිලාගේ සන්ධ්‍යා රෝහිණී යන අය විසින් පැහැර හැර ඇති බැවින් ද, 2009.12.31 දිනට මුල් ණය මුදල හා එය මත පොළී වශයෙන් රුපියල් හාරලක්ෂ දහනවදහස් හාරසිය අනූ දෙකයි ශත හතළිස් තුන (රු. 4,19,492.43)ක මුදලක් ද, පූර්වෝක්ත බැඳුම්කර අංක 2076 ප්‍රකාර ගෙවිය යුතු මුදල සම්පූර්ණයෙන් ගෙවා නිම කරන දිනය වනතුරු දිනකට රුපියල් එකසිය හතළිස් තුනයි ශත හැට හය (රු. 143.66)ක් බැගින් වැඩිපුර පොළිය ද අයවිය යුතුව ඇති බැවින් ද, (මෙදිනට පසු කරන ලද ගෙවීම් අඩු කරන්න).

2. මෙම දැන්වීමේ පළමුවැනි ඡේදයේ දක්වා ඇති එකී මුදල සහ 1975හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 57 වැනි වගන්තිය යටතේ අයකර ගත යුතුව ඇති වියදම් හා මුදල් ආපසු අයකර ගැනීම උදෙසා මෙහි පහත උපලේඛනයේ විස්තර කර ඇති හා රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවට උකස්කර ඇති දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම සඳහා සංශෝධන සහිත 1975හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය ප්‍රකාර, මීගමුව, ප්‍රනාන්දු පටුගම, අංක 22හි බලයලත් වෙන්දේසිකාර ඩබ්. පී. සී. පෙරේරා මහතාට බලය පැවරිය යුතු වන්නේ ය.

#### උපලේඛනය

ගම්පහ දිස්ත්‍රික්කයේ, අලුත්කුරු කෝරළේ, දාසිය පත්තුවේ (මාබෝදල උප කාර්යාලය) මීනුවන්ගොඩ ප්‍රාදේශීය සභා සීමාව තුළ මාබෝදල පිහිටි කඳන්ගොඩමූකලාන ඉඩමට 1994.03.24 වැනි දින බලයලත් මිනින්දෝරු කේ. කේ. ඒ. එස්. පද්මිණී විසින් මැන සකසන ලද අංක 247 දරන පිඹුරේ කැබලි අංක 3 ලෙස බෙදා වෙන් කර දක්වා ඇති ප්‍රමාණයෙන් අ. 0. රූ. 2, පර්. 25.65ක් වූ බිම් කොටස.

මෙය ගම්පහ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ඒ 187/129 යටතේ ලියාපදිංචි වී ඇත.

මෙම ඉඩමට ප්‍රවේශ මාර්ගය ලෙස 1985.01.24 දින බලයලත් මිනින්දෝරු කේ. ඒ. ජී. අමරසිංහ විසින් මැන සකසන ලද අංක 4557 දරන පිඹුරේ කැබලි අංක 4 සමග වේ.

අයි. විමලසේන,
*වැඩබලන සාමාන්‍යාධිකාරී.*

2010ක් වූ මැයි මස 14 වැනි දින,
අංක 269,
ගාලු පාර, කොළඹ 03.

05-769/3

### රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව

1981හි අංක 62 දරන පනතින් හා 1984හි අංක 29 දරන පනතින් සංශෝධිත පරිදි 1975හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය යටතේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගැණුනු යෝජනාව

ණය අංකය : 1/32452/සීඩී2/373.

රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2001.12.28 වැනි දින පැවැත්වුණු රැස්වීමේ දී පහත සඳහන් අයුරු විශේෂයෙන් හා ඒකමතිකව තීරණය කරන ලදී :

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ඒ. කීර්තිරත්න විසින් සහතික කරන ලද 1997.09.21 වැනි දින හා අංක 502 දරන උකස් බැඳුම්කරය මත අයවිය යුතු මුදල් ගෙවීම, මහරගම පදිංචි හේරත් මුදියන්සේලාගේ ජයපාල යන අය විසින් පැහැර හැර ඇති බැවින් ද, 2001.10.31 දිනට මුල් ණය මුදල හා එය මත පොළී වශයෙන් රුපියල් තුන්ලක්ෂ හතළිස් හත්දහස් පන්සිය විසිඑකයි ශත දහය (රු. 3,47,521.10) ක මුදලක් ද, පූර්වෝක්ත බැඳුම්කර අංක 502 ප්‍රකාර ගෙවිය යුතු මුදල සම්පූර්ණයෙන් ගෙවා නිම කරන දිනය වනතුරු දිනකට රුපියල් එකසිය හැත්තෑවයි ශත තිස්හත (රු. 170.37)ක් බැගින් වැඩිපුර පොළිය ද අයවිය යුතුව ඇති බැවින් ද, (මෙදිනට පසු කරන ලද ගෙවීම් අඩු කරන්න).

2. මෙම දැන්වීමේ පළමුවැනි ඡේදයේ දක්වා ඇති එකී මුදල සහ 1975හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 57 වැනි වගන්තිය යටතේ අයකර ගත යුතුව ඇති වියදම් හා මුදල් ආපසු අයකර ගැනීම උදෙසා මෙහි පහත උපලේඛනයේ විස්තර කර ඇති හා රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවට උකස්කර ඇති දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම සඳහා සංශෝධන සහිත 1975හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය ප්‍රකාර, පන්නිපිටිය, හයිලෙවල් පාර, අංක 145හි බලයලත් වෙන්දේසිකාර එම්. සමරනායක මහතාට බලය පැවරිය යුතු වන්නේ ය.

#### උපලේඛනය

කොළඹ දිස්ත්‍රික්කයේ, මහරගම ප්‍රාදේශීය සභා සීමාව තුළ පමුණුව පිහිටි දේවාලවත්ත නොහොත් මීගහවත්ත ඉඩමට 1975.10.02 දින බලයලත් මිනින්දෝරු සී. එම්. තාජුඩීන් විසින් මැන සකසන ලද අංක 9/75 දරන පිඹුරේ කැබලි අංක 3 ලෙස බෙදා වෙන් කර දක්වා ඇති ප්‍රමාණයෙන් අ. 0, රූ. 0, පර්. 11.85ක් වූ බිම් කොටස සමග සියලු දෑ.

මෙම ඉඩමට ප්‍රවේශ මාර්ගය ලෙස අංක 9/75 දරන පිඹුරේ කැබලි අංක 9 සහිත කොටස වේ.

අයි. විමලසේන,
*වැඩබලන සාමාන්‍යාධිකාරී.*

2010ක් වූ මැයි මස 14 වැනි දින,
අංක 269,
ගාලු පාර, කොළඹ 03.

05-769/4

## රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව

### 1981හි අංක 62 දරන පනතින් හා 1984හි අංක 29 දරන පනතින් සංශෝධිත පරිදි 1975හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය යටතේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගැණුනු යෝජනාව

ණය අංකය : ජීඑල්/08/01214/පීජ්1/750.

රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2010.02.11 වැනි දින පැවැත්වුණු රැස්වීමේ දී පහත සඳහන් අයුරු විශේෂයෙන් හා ඒකමතිකව තීරණය කරන ලදී :

ගාල්ල ප්‍රසිද්ධ නොතාරිස් ඒ. ආර්. එම්. ද සිල්වා විසින් සහතික කරන ලද 2007.06.11 දින හා අංක 243 දරන උකස් බැඳුම්කරය මත අයවිය යුතු මුදල් ගෙවීම, ගාල්ල පදිංචි උමගිලිය ගමගේ ගාමිණී සහ ක්‍රිෂාන්ති කුමාරි රත්නායක මුදියන්සේලාගේ නොහොත් රත්නායක මුදියන්සේලාගේ ක්‍රිෂාන්ති කුමාරි යන අය විසින් පැහැර හැර ඇති බැවින් ද, 2010.01.28 දිනට මුල් ණය මුදල හා එය මත පොළී වශයෙන් රුපියල් දහතුන්ලක්ෂ හාරදහස් දෙසීය හැත්තෑවයි ශත අට (රු. 13,04,270.08) ක මුදලක් ද, පූර්වෝක්ත බැඳුම්කර අංක 243 ප්‍රකාර ගෙවිය යුතු මුදල සම්පූර්ණයෙන් ගෙවා නිම කරන දිනය වනතුරු දිනකට රුපියල් හත්සිය දාහතරයි ශත හැටහත (රු. 714.67) බැගින් වැඩිපුර පොළීය ද අයවිය යුතුව ඇති බැවින් ද, (මෙදිනට පසු කරන ලද ගෙවීම් අඩු කරන්න)

2. මෙම දැන්වීමේ පළමුවැනි ඡේදයේ දක්වා ඇති එකී මුදල සහ 1975හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 57 වැනි වගන්තිය යටතේ අයකර ගත යුතුව ඇති වියදම් හා මුදල් ආපසු අයකර ගැනීම උදෙසා මෙහි පහත උපලේඛනයේ විස්තර කර ඇති හා රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවට උකස්කර ඇති දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම සඳහා සංශෝධන සහිත 1975හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය ප්‍රකාර, කොළඹ 12, අළුත්කඩේ වීදිය, අංක 186/2හි බලයලත් වෙන්දේසිකාර කේ. පී. එන් සිල්වා මහතාට බලය පැවරිය යුතු වන්නේ ය.

#### උපලේඛනය

ගාල්ල දිස්ත්‍රික්කයේ, ගාල්ල කඩවත් සතර බෝපේ පොද්දල ප්‍රාදේශීය සභා සීමාව තුළ කිතුලම්පිටිය පිහිටි පදුරේවත්ත නොහොත් කොහොඹත්ගෙවත්ත ඉඩමට 1997.06.01 සහ 1997.05.24 දින බලයලත් මිනින්දෝරු ඩී. ඩී. රණවීර විසින් මැන සකසන ලද අංක 3281 සහ අංක 3282 ලෙස වැරදිලෙස ලියාපදිංචි වී ඇති පිඹුරේ කැබලි අංක 6 ලෙස බෙදා වෙන් කර දක්වා ඇති ප්‍රමාණයෙන් අ. 0, රූ. 0, පර්. 34.125ක් වූ බිම් කොටස සමග සියලු දෑ.

මෙය ගාල්ල ඉඩම් ලියාපදංචි කිරීමේ කාර්යාලයේ ඒ 460/267 යටතේ ලියාපදිංචි වී ඇත.

අයි. විමලසේන,
*වැඩබලන සාමාන්‍යාධිකාරී.*

2010ක් වූ මැයි මස 14 වැනි දින,
අංක 269,
ගාලු පාර, කොළඹ 03.

05-769/5

---

## රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව

### 1981හි අංක 62 දරන පනතින් හා 1984හි අංක 29 දරන පනතින් සංශෝධිත පරිදි 1975හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය යටතේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගැණුනු යෝජනාව

ණය අංකය : ජීපී/02/03544/ජීඑන්1/602, ජීපී/02/04038/එක්ස්2/641.

රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2010.01.11 වැනි දින පැවැත්වුණු රැස්වීමේ දී පහත සඳහන් අයුරු විශේෂයෙන් හා ඒකමතිකව තීරණය කරන ලදී :

ගම්පහ ප්‍රසිද්ධ නොතාරිස් ඩී. ඒ. ඩබ්. ගුණසේකර සහ වී. ආර්. එම්. එස්. රත්නායක විසින් සහතික කරන ලද 2006.11.07 සහ 2007.12.19 දින හා අංක 2713 සහ 129 දරන උකස් බැඳුම්කරය මත අයවිය යුතු මුදල් ගෙවීම, ගනේමුල්ල පදිංචි හොරණෑකාරයලාගේ නිමල් කරුණාරත්න යන අය විසින් පැහැර හැර ඇති බැවින් ද, 2009.11.30 දිනට මුල් ණය මුදල හා එය මත පොළී වශයෙන් රුපියල් එක්ලක්ෂ හැත්තෑ හත්දහස් හත්සිය හතලිස් එකයි ශත අසූ අටක් (රු. 1,77,741.88) සහ දෙලක්ෂ අටසිය දහසයයි ශත විසි හතර (රු. 2,00,816.24) ක මුදලක් ද, පූර්වෝක්ත බැඳුම්කර අංක 2713 සහ 129 ප්‍රකාර ගෙවිය යුතු මුදල සම්පූර්ණයෙන් ගෙවා නිම කරන දිනය වනතුරු දිනකට රුපියල් අසූ පහයි ශත විසි දෙකක් (රු. 85.22) සහ හැත්තෑ හතරයි ශත පනස් දෙක (රු. 74.52)ක් බැගින් වැඩිපුර පොළීය ද අයවිය යුතුව ඇති බැවින් ද, (මෙදිනට පසු කරන ලද ගෙවීම් අඩු කරන්න).

2. මෙම දැන්වීමේ පළමුවැනි ඡේදයේ දක්වා ඇති එකී මුදල සහ 1975හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 57 වැනි වගන්තිය යටතේ අයකර ගත යුතුව ඇති වියදම් හා මුදල් ආපසු අයකර ගැනීම උදෙසා මෙහි පහත උපලේඛනයේ විස්තර කර ඇති හා රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවට උකස්කර ඇති දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම සඳහා සංශෝධන සහිත 1975හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය ප්‍රකාර, මීගමුව, ප්‍රනාන්දු පටුමග, අංක 22හි බලයලත් වෙන්දේසිකාර ඩබ්. පී. සී. පෙරේරා මහතාට බලය පැවරිය යුතු වන්නේ ය.

#### උපලේඛනය

ගම්පහ දිස්ත්‍රික්කයේ, අලුත්කුරු කෝරළේ, රාගම් පත්තුවේ, ගම්පහ ප්‍රාදේශීය සභා සීමාව තුළ තිබ්බොටුගොඩ පිහිටි දෙල්ගහවත්ත ඉඩමට 2006.06.02 දින බලයලත් මිනින්දෝරු එස්. ඩී. චන්ද්‍රතිලක විසින් මැන සකසන ලද අංක 5193 දරන පිඹුරේ කැබලි අංක 1 ලෙස බෙදා වෙන් කර දක්වා ඇති ප්‍රමාණයෙන් අක්. 0, රූ. 0, පර්. 13.20ක් වූ බිම් කොටස සමග සියලු දේත් සමග වේ.

මෙය ගම්පහ ඉඩම් ලියාපදංචි කිරීමේ කාර්යාලයේ බී 508/233 යටතේ ලියාපදිංචි වී ඇත.

මෙම ඉඩමට ප්‍රවේශ මාර්ගය ලෙස 2002.09.28 දින බලයලත් මිනින්දෝරු එස්. බී. චන්ද්‍රතිලක විසින් මැන සකසන ලද අංක 3147 දරන පිඹුර සහිත වේ.

අයි. විමලසේන,
*වැඩබලන සාමාන්‍යාධිකාරී.*

2010ක් වූ මැයි මස 14 වැනි දින,
අංක 269,
ගාලු පාර, කොළඹ 03.

05-769/6

### රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව

1981හි අංක 62 දරන පනතින් හා 1984හි අංක 29 දරන පනතින් සංශෝධිත පරිදි 1975හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය යටතේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගැණුනු යෝජනාව

ණය අංකය : 6/38298/එල්6/966.

රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2003.02.18 වැනි දින පැවැත්වුණු රැස්වීමේ දී පහත සඳහන් අයුරු විශේෂයෙන් හා ඒකමතිකව තීරණය කරන ලදී :

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ඩී. ජයරත්න විසින් සහතික කරන ලද 2000.09.15 දින හා අංක 1201 දරන උකස් බැඳුම්කරය මත අයවිය යුතු මුදල් ගෙවීම, පානදුර පදිංචි පාලමණ්ඩලිගේ ප්‍රියංකා කුමුදුනි ප්‍රනාන්දු සහ සිරියාගේ පියසේනලාගේ නිමල් ජයන්ත වික්‍රමනායක යන අය විසින් පැහැර හැර ඇති බැවින් ද, 2003.01.19 දිනට මුල් ණය මුදල හා එය මත පොළී වශයෙන් රුපියල් එක්ලක්ෂ විසිදහස් පන්සිය පනස් එකයි ශත අනූඅට (රු. 1,20,551.98)ක මුදලක් ද, පූර්වෝක්ත බැඳුම්කර අංක 1201 ප්‍රකාර ගෙවිය යුතු මුදල සම්පූර්ණයෙන් ගෙවා නිම කරන දිනය වනතුරු දිනකට රුපියල් හතලිස් අටයි ශත හතලිස් හතර (රු. 48.44) බැගින් වැඩිපුර පොළිය ද අයවිය යුතුව ඇති බැවින් ද, (මෙදිනට පසු කරන ලද ගෙවීම් අඩු කරන්න).

2. මෙම දැන්වීමේ පළමුවැනි ඡේදයේ දක්වා ඇති එකී මුදල සහ 1975හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 57 වැනි වගන්තිය යටතේ අයකර ගත යුතුව ඇති වියදම් හා මුදල් ආපසු අයකර ගැනීම උදෙසා මෙහි පහත උපලේඛනයේ විස්තර කර ඇති හා රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවට උකස්කර ඇති දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම සඳහා සංශෝධන සහිත 1975හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය ප්‍රකාර, පානදුර, ඩයස් ගොඩනැගිල්ල හි බලයලත් වෙන්දේසිකාර එච්. ජී. පෙරේරා මහතාට බලය පැවරිය යුතු වන්නේ ය.

#### උපලේඛනය

කළුතර දිස්ත්‍රික්කයේ, පානදුර තොටමුණේ පානදුර තල්පිටි දෙබැද්දේ පානදුර ප්‍රාදේශීය සභා සීමාව තුළ තන්තිරිමුල්ල උප කාර්යාලය හරහා පිහිටි කලුවාවලහේන නොහොත් බටපොතහේන නමැති ඉඩමට 1998.09.15 දින බලයලත් මිනින්දෝරු වයි. ජී. ද සිල්වා විසින් මැන සකසන ලද අංක 813ඒ දරන පිඹුරේ කැබලි අංක 47 ලෙස බෙදා වෙන් කර දක්වා ඇති ප්‍රමාණයෙන් අ. 0, රූ. 0, පර්. 8ක් වූ බිම් කොටස.

මෙම ඉඩමට ප්‍රවේශ මාර්ගය ලෙස අංක 813ඒ දරන පිඹුරේ කැබලි අංක 13 සහ 1 ලෙස සඳහන් වේ.

අයි. විමලසේන,
*වැඩබලන සාමාන්‍යාධිකාරී.*

2010 මැයි මස 14 වැනි දින,
අංක 269,
ගාලු පාර, කොළඹ 03.

05-769/7

### රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව

1981හි අංක 62 දරන පනතින් හා 1984හි අංක 29 දරන පනතින් සංශෝධිත පරිදි 1975හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය යටතේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගැණුනු යෝජනාව

ණය අංකය : කේයූ/18/00568/එම්කේඒ/029.

රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2010.02.11 වැනි දින පැවැත්වුණු රැස්වීමේ දී පහත සඳහන් අයුරු විශේෂයෙන් හා ඒකමතිකව තීරණය කරන ලදී :

කුරුණෑගල ප්‍රසිද්ධ නොතාරිස් වී. අමරසේකර විසින් සහතික කරන ලද 2005.08.09 දින හා අංක 10383 දරන උකස් බැඳුම්කරය මත අයවිය යුතු මුදල් ගෙවීම, බණ්ඩාරකොස්වත්ත පදිංචි ඩිංගිරියා වෙදාලෑ සමරසිරි සහ පංචානාදයලාගේ ලිලියාවතී යන අය විසින් පැහැර හැර ඇති බැවින් ද, 2010.01.28 දිනට මුල් ණය මුදල හා එය මත පොළී වශයෙන් රුපියල් දෙලක්ෂ විසිතුන්දහස් නවසිය හැටතුනයි ශත පනස් පහ (රු. 2,23,963.55)ක මුදලක් ද, පූර්වෝක්ත බැඳුම්කර අංක 10383 ප්‍රකාර ගෙවිය යුතු මුදල සම්පූර්ණයෙන් ගෙවා නිම කරන දිනය වනතුරු දිනකට රුපියල් අනූ දෙකයි ශත හතර (රු. 92.04) බැගින් වැඩිපුර පොළිය ද අයවිය යුතුව ඇති බැවින් ද, (මෙදිනට පසු කරන ලද ගෙවීම් අඩු කරන්න).

2. මෙම දැන්වීමේ පළමුවැනි ඡේදයේ දක්වා ඇති එකී මුදල සහ 1975හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 57 වැනි වගන්තිය යටතේ අයකර ගත යුතුව ඇති වියදම් හා මුදල් ආපසු අයකර ගැනීම උදෙසා මෙහි පහත උපලේඛනයේ විස්තර කර ඇති හා රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවට උකස්කර ඇති දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම සඳහා සංශෝධන සහිත 1975හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය ප්‍රකාර, කුරුණෑගල, මැද පාර, මල්කඩුවාව, ගම්මඩුගොල්ල මාවත, අංක 12හි බලයලත් වෙන්දේසිකාර බී. එම්. ඒ. විජයතිලක මහතාට බලය පැවරිය යුතු වන්නේ ය.

#### උපලේඛනය

කුරුණෑගල දිස්ත්‍රික්කයේ, තිස්සව කෝරළේ, දේවමැදි පත්තුවේ, උඩකඩවල පිහිටි ගම්මාලියවත්ත ඉඩමට සර්වේ ජනරාල්වරයා විසින් මැන සකසන ලද අංක 2274 දරන පිඹුරේ කැබලි අංක 14 ලෙස බෙදා වෙන්කර දක්වා ඇති ප්‍රමාණයෙන් හෙක් 0.200ක් වූ බිම් කොටස සමග සියළු දෑ.

මෙය කුරුණෑගල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ එල්ඩීඕ/කේයූ/එච්/6/142 යටතේ ලියාපදිංචි වී ඇත.

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළයේ පල්ලේ පත්තුවේ, මොරටුව මහ නගර සභා සීමාව තුළ එගොඩඋයන ගමේ පිහිටියා වූ ද ආරියදාස ධර්මබන්දු මාවතේ වරිපනම් අංක 55/69 දරන "පඹුරුගහවත්ත" නමැති (ඔප්පුවට අනුව පඹුරුගහවත්ත) ඉඩමේ කොටසක් යැයි කියනු ලබන ඉඩමේ බලයලත් මිනින්දෝරු බී. එල්. ඩී. ප්‍රනාන්දු විසින් සාදන ලද අංක 5671 හා 1998 ජූනි 20 දින දරන පිඹුරේ නිරූපණය කර ඇත්තා වූ ද, උතුරට : පාර ද, නැගෙනහිරට : අංක 2795 දරන පිඹුරේ ලොට් $Y^1$ ද, දකුණට : (අංක 5850 දරන ඔප්පුවේ සඳහන් අංක 919 පිඹුරේ ලොට් J පරිදි) අංක 919 පිඹුරේ ලොට් J ද, බස්නාහිරට : නව ගාලු පාර ද මායිම්වන්නා වූ එකී අංක 5671 දරන පිඹුරට අනුව පර්චස් දහයක් (අ. 0, රූ. 0, පර්. 10) විශාල වූ ද, නුගේගොඩ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ M2326/59 යටතේ ලියාපදිංචි කර ඇත්තා වූ ද බෙදා වෙන් කරන ලද මුළු ඉඩම් කොටස, එහි පස සහ එහි පිහිටි ගහකොළ, වැවිලි හා වෙනත් සියලු දේත් ය.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණපරිදි,

සහකාර සාමාන්‍යාධිකාරී,
(බටහිර කළාප II)

මහජන බැංකුව,
ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලය (කොළඹ පිටත),
අංක 102, ස්ටැන්ලි තිලකරත්න මාවත,
නුගේගොඩ.

05-707

---

## මහජන බැංකුව - නුගේගොඩ ශාඛාව

### 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන බැංකු පනතේ 29ඇ වගන්තිය යටතේ යෝජනා සම්මතය

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඇ වගන්තිය යටතේ මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2009.11.27 දින පැවැත්වූ එකී අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේ දී පහත දැක්වෙන යෝජනා සම්මතය ඒකමතිකව සම්මත කර ගත් බව මෙයින් දැනුම් ලැබේ :

මහජන බැංකුව නමට කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් කේ. එස්. ජාගොඩ මහත්මිය විසින් සහතික කරන ලද අංක 7867 සහ 2008.08.08 වැනි දින දරන උකස් බැඳුම්කරය මත අයවිය යුතු ගෙවීම් කිරීම, ඩී. අයි. ඒ. එස්. අමරසේකර ඇන්ඩ් කම්පැණි ලිමිටඩ් සහ දොන් සුසන්ත සූරියආරච්චි අමරසේකර මහතා, විසින් පැහැර හැර ඇති හෙයින්, දැන් එකී අංක 7867 දරන බැඳුම්කරය මත රුපියල් විසි දෙලක්ෂයක (රු. 22,00,000) මුදලක්, රුපියල් විසිඅට ලක්ෂයක (රු. 28,00,000) මුදලක්, රුපියල් හයලක්ෂයක (රු. 6,00,000) මුදලක් සහ රුපියල් තුන්ලක්ෂයක (රු. 3,00,000) මුදලක් මහජන බැංකුවට අයවිය යුතු සහ ලැබිය යුතුව ඇත. එබැවින් 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29

දරන මහජන බැංකු පනතින් පැවරී ඇති බලතල යටතේ මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින්, රුපියල් විසි දෙලක්ෂයක (රු. 22,00,000) මුදල ද, රුපියල් විසිඅට ලක්ෂයක (රු. 28,00,000) මුදල ද, රුපියල් හයලක්ෂයක (රු. 6,00,000) මුදලක් සහ රුපියල් තුන්ලක්ෂයක (රු. 3,00,000) එකී මුදල ද, 2009.07.01 දින සිට විකිණීමේ දිනය තෙක් රුපියල් විසි දෙලක්ෂයක (රු. 22,00,000) මුදලක් මත වර්ෂයකට සියයට විසිහත (27%) බැගින් තවදුරටත් වූ පොළිය ද, 2009.08.01 වැනි දින සිට විකිණීමේ දිනය තෙක් රුපියල් විසිඅට ලක්ෂයක (රු. 28,00,000) මුදලක් මත වර්ෂයකට සියයට විසිහත (27%) බැගින් තවදුරටත් වූ පොළිය ද, විකිණීමේ දිනය තෙක් රුපියල් තුන් ලක්ෂයක (රු. 3,00,000) හා රුපියල් හයලක්ෂයක (රු. 6,00,000) මුදලක් ද, විකිණීමේ ගාස්තු ද එකී මහජන බැංකු පනතේ 29ඕ වගන්තිය යටතේ අයකර ගත යුතු මුදල් ද එදින තෙක් කරනු ලැබ ඇති ගෙවීම් (කිසිවක් වේ නම්) අඩු කිරීමෙන් පසු අයකර ගැනීම සඳහා අංක 7867 දරන උකස් බැඳුම්කරය මගින් එකී බැංකුවට උකස්කර ඇති දේපළ සහ පරිශ්‍රය කොළඹ බලයලත් වෙන්දේසිකරු ඊ. එස්. රාමනායක මහත්මිය විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු බවට මෙයින් යෝජනා සම්මත කරනු ලැබේ.

### උකස් කරන ලද දේපළ සහ පරිශ්‍ර පිළිබඳ විස්තරය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළයේ පල්ලේ පත්තුවේ, මහරගම නගර සභා සීමාව තුළ පන්නිපිටිය ගමේ පිහිටියා වූ ද "දෙල්ගහවත්ත හෙවත් දෙල්ගහකනත්ත" යැයි කියනු ලබන සහ සෙත්සිරි පෙදෙසේ වරිපනම් අංක 558/40 සහ 558/40A දරන "එලින් විල්" යනුවෙන් ද හඳුන්වනු ලබන ඉඩමේ බලයලත් මිනින්දෝරු ඩබ්ලිව්. ඒ. ප්‍රනාන්දු විසින් සාදන ලද අංක 229 හා 2005 මැයි මස 28 දින දරන පිඹුරේ ලොට් අංක 1 ලෙස ලකුණු කොට නිරූපණය කර ඇත්තා වූ ද, උතුරට : සෙත්සිරි පෙදෙසේ වරිපනම් අංක 558/41 හා 558/36 ද. නැගෙනහිරට : සෙත්සිරි පෙදෙසේ වරිපනම් අංක 558/39 හා 558/21 ද, දකුණට : අඩි පාර සහ පාර ද, බස්නාහිරට : සෙත්සිරි පෙදෙස ද, මායිම්වන්නා වූ ද එකී අංක 229 දරන පිඹුරට අනුව පර්චස් තිස් අටයි දශම දෙකක් (අ. 0. රූ. 0, පර්. 38.2) විශාල වූ ද මුළු ඉඩම් කොටස එහි පස, සහ එහි පිහිටි ගොඩනැගිලි, ගහකොළ, වැවිලි හා වෙනත් සියලු දේත් ය.

ඉහත දැක්වෙන ඉඩම් කොටස පහත දැක්වෙන ඉඩම්වල ඒකාබද්ධ කිරීමක් සහ නැවත මැනීමක් වේ :

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළෙයේ පල්ලේ පත්තුවේ, පන්නිපිටියේ පිහිටියා වූ ද, "දෙල්ගහවත්ත හෙවත් දෙල්ගහකනත්ත" යැයි කියනු ලබන සහ "එලින් විල්" යනුවෙන් ද හඳුන්වනු ලබන ඉඩමේ බලයලත් මිනින්දෝරු ඩී. එල්. පීරිස් විසින් සාදන ලද අංක 1296 සහ 1964 නොවැම්බර් මස 23 දින දරන පිඹුරේ ලොට් අංක 38 ලෙස ලකුණු කොට නිරූපණය කර ඇත්තා වූ ද, උතුරට : ලොට් අංක 37 ද, නැගෙනහිරට : ලොට් අංක 36 සහ 39 ද, දකුණට : ලොට් අංක 40 ද, බස්නාහිරට : (පාර සඳහා වෙන් කිරීම වන) ලොට් අංක 59 ද මායිම් වන්නා වූ ද, පර්චස් විස්සයි දශම එකක් (අ. 0, රූ. 0, පර්. 20.1) විශාල වූ ද මුළු ඉඩම් කොටස එහි බිම සහ එහි පිහිටි ගොඩනැගිලි, ගහකොළ, වැවිලි හා වෙනත් සියලු දේත් ය.

තවද ලොට් අංක 38 භාවිතයේ දී හා භුක්ති විඳීමේ සියලු කාර්යයන්හිදී එකී අංක 1296 දරන පිඹුරේ ලොට් අංක 47 සහ 48හි පිහිටි ළිං, විකුණුම්කරුවන් සහ ඒ හා සමාන අයිතිවාසිකම් ඇති වෙනත් සියල්ලන් සමග පොදුවේ භාවිතා කිරීමේ අයිතිය ද මීට ඇතුළත් වේ.

ඉහත කී පන්නිපිටියේ පිහිටියා වූ ද, "දෙල්ගහවත්ත හෙවත් දෙල්ගහකනත්ත" යැයි කියනු ලබන සහ "එලින් විල්" ඉඩම යනුවෙන් ද හඳුන්වනු ලබන ඉඩමේ ඉහත කී අංක 1296 දරන පිඹුරේ ලොට් අංක 40 ලෙස ලකුණු කොට නිරූපණය කර ඇත්තා වූ ද, උතුරට : ලොට් 38 ද. නැගෙනහිරට : ලොට් 39 හා 41 ද, දකුණට : අඩි පාර ද, බස්නාහිරට : (පාර සඳහා වෙන් කිරීම වන) ලොට් අංක 59 ද මායිම් වන්නා වූ පර්චස් දහඅටයි දශම එකක් (අ. 0, රූ. 0, පර්. 18.1) විශාල වූ ද, බෙදා වෙන් කරන ලද මුළු බිම් කොටස සහ එහි පිහිටි ගොඩනැගිලි, ගහකොළ, වැවිලි හා වෙනත් සියලු දේත් ය. එකී අංක 1296 දැක්වෙන පාර සඳහා වෙන් කිරීම් වන ලොට් අංක 49, 50, 51, 52,53, 54, 55, 56 හා 59 උඩින් මාර්ග ප්‍රවේශ අයිතිය සහ අංක 1296 දරන එකී පිඹුරේ දැක්වෙන ලොට් 47හි හා 48 පිහිටි ළිං භාවිතා කිරීමේ අයිතිය ද මීට ඇතුළත් වේ.

මහරගම ප්‍රාදේශීය සභා සීමාව තුළ ඉහත කී පන්නිපිටියේ පිහිටියාවූ ද, අංක 4240 දරන පිඹුරේ ලොට් අංක 23 ලෙස ලකුණු කොට නිරූපණය කර ඇත්තා වූ ද, උතුරට : අංක 470 පිඹුරේ ලොට් අංක 22 ද, නැගෙනහිරට : ජී. ඒ. ඩබ්. ගුණතිලකගේ ඉඩම ද, දකුණට : අංක 470 පිඹුරේ ලොට් අංක 24 ද, බස්නාහිරට : (බලයලත් මිනින්දෝරු එස්. ඩී. ලියනසූරිය විසින් සාදන ලද 1969.12.10 දින අංක 207 පිඹුරේ ලොට් X සහ Y වන) අඩි 20ක් පළල පාර ද මායිම් වන්නා වූ ද, පර්චස් විසි දෙකයි දශම පහක් (අ. 0, රූ. 0, පර්. 22.5) හෙවත් හෙක්ටයාර් 0.0569 විශාල වූ ද, බෙදා වෙන් කරන ලද මුළු ඉඩම් කොටස සහ එහි පිහිටි ගොඩනැගිලි, ගහකොළ, වැවිලි හා වෙනත් සියලු දේත් ය.

නුගේගොඩ. දෙල්කඳ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ M2746/223හි ලියාපදිංචි කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සහකාර සාමාන්‍යාධිකාරි,
(බටහිර කළාප II).

මහජන බැංකුව,
ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලය (කොළඹ පිටත),
අංක 102, ස්ටැන්ලි තිලකරත්න මාවත,
නුගේගොඩ.

05-708

---

### මහජන බැංකුව - මොරටුමුල්ල ශාඛාව

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන බැංකු පනතේ 29ඈ වගන්තිය යටතේ යෝජනා සම්මතය

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඈ වගන්තිය යටතේ මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2009.09.25 දින පැවැත්වූ එකී අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේ දී පහත දැක්වෙන යෝජනා සම්මතය ඒකමතිකව සම්මත කර ගත් බව මෙයින් දැනුම් ලැබේ.

මහජන බැංකුව නමට කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් පී. ලියනගේ මහත්මිය විසින් සහතික කරන ලද අංක 2692 සහ 2007.01.26 වැනි දින දරන උකස් බැඳුම්කරය මත අයවිය යුතු ගෙවීම් කිරීම, දෙල්පචිත්‍ර

නිශාන්ත සිල්වා මහතා සහ කුඩගලගේ වරුණි දිනේෂිකා මහත්මිය, විසින් පැහැර හැර ඇති හෙයින්, දැන් එකී අංක 2692 දරන බැඳුම්කරය මත රුපියල් දෙලක්ෂ අසූතුන් දහස් තුන්සිය තිස්තුනයි ශත හතලිස් දෙකක (රු. 2,83,333.42) මුදලක් මහජන බැංකුවට අයවිය යුතු සහ ලැබිය යුතුව ඇත. එබැවින් 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතින් පැවරී ඇති බලතල යටතේ මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින්, රුපියල් දෙලක්ෂ අසූතුන් දහස් තුන්සිය තිස්තුනයි ශත හතළිස් දෙකක (රු. 2,83,333.42) එකී මුදල ද, 2009.01.27 දින සිට විකිණීමේ දිනය තෙක් රුපියල් දෙලක්ෂ අසූතුන් දහස් තුන්සිය තිස්තුනයි ශත හතලිස් දෙකක (රු. 2,83,333.42) මුදලක් මත වර්ෂයකට සියයට විසිදෙක (22%) බැගින් පොළිය ද, විකිණීමේ ගාස්තු ද, එකී මහජන බැංකු පනතේ 29ඕ වගන්තිය යටතේ අයකර ගත යුතු මුදල් ද එදින තෙක් කරනු ලැබ ඇති ගෙවීම්( කිසිවක් වේ නම්) අඩු කිරීමෙන් පසු අයකර ගැනීම සඳහා අංක 2692 දරන උකස් බැඳුම්කරය මගින් එකී බැංකුවට උකස්කර ඇති දේපළ සහ පරිශ්‍රය කොළඹ බලයලත් වෙන්දේසිකරු ඒ. එස්. ලියනගේ මහතා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු බවට මෙයින් යෝජනා සම්මත කරනු ලැබේ.

### උකස් කරන දේපළ සහ පරිශ්‍ර පිළිබඳ විස්තරය

බස්නාහිර පළාතේ, කළුතර දිස්ත්‍රික්කයේ, පානදුර තොටමුණු ප්‍රාදේශීය සභාවේ කෙසෙල්වත්ත උප කාර්යාල ප්‍රදේශය ඇතුළත හේනමුල්ල පිහිටියා වූ “කෝන්ගහවත්ත හෙවත් මල්පනින වත්ත මහ වත්ත යයි කියනුල බන ඉඩමේ බලයලත් මිනින්දෝරු ඒ. ජී. ජී. සිරිසෝම විසින් සාදන ලද අංක 1345 හා 1995.11.13 වැනි දරන පිඹුරේ ලොට් B3 ලෙස ලකුණුකොට පෙන්නුම් කර ඇත්තාවූ ද, උතුරට : එම ඉඩමේ ලොට් B1 දරන කොටස ද, නැගෙනහිරට : ලොට් B2 දරන කොටස සහ මෙම ඉඩමේ කොටසක් ද, දකුණට : එච්. ඒ. ඩී. බස්තියන් විසින් හිමිකම් කියන ඉඩම ද බස්නාහිරට : එල්. ඒබ්‍රහම් හිමිකම් කියන ඉඩම සහ බලයලත් මිනින්දෝරු බී. ඒ. ප්‍රනාන්දු විසින් සාදන ලද අංක 224 සහ 1995.11.26 දින දරන පිඹුරේ ලොට් B දරන කොටස ද මායිම් වන්නා වූ පර්චස් පහලොවයි දශම හතක් (අ. 0. රූ. 0, පර්. 15.7) විශාල වූ ද බෙදා කරන ලද මුළු ඉඩම් කොටස සහ එහි පිහිටි ගොඩනැගිලි, ගහකොළ, වැවිලි සහ වෙනත් සියලු දේත් ය.

එකී අංක 1345 දරන පිඹුරේ දැක්වෙන ලොට් B1 දරන කොටස උඩින් මාර්ග ප්‍රවේශ අයිතිය ද මීට ඇතුළත් වේ.

පානදුර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ F537/116 යටතේ ලියාපදිංචි කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණපරිදි,

සහකාර සාමාන්‍යාධිකාරී,
(බටහිර කළාප II).

මහජන බැංකුව,
ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලය (කොළඹ පිටත),
අංක 102, ස්ටැන්ලි තිලකරත්න මාවත,
නුගේගොඩ.

05-702

### මහජන බැංකුව - දෙහිවල ශාඛාව

### 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන බැංකු පනතේ 29ඈ වගන්තිය යටතේ යෝජනා සම්මතය

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඈ වගන්තිය යටතේ මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2010.02.26 දින පැවැත්වූ එකී අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේ දී පහත දැක්වෙන යෝජනා සම්මතය ඒකමතිකව සම්මත කර ගත් බව මෙයින් දැනුම් ලැබේ :

මහජන බැංකුව නමට කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ඩී. කේ. කේ. වැලිකුඹුර මහත්මිය විසින් සහතික කරන ලද අංක 1005 සහ 2005.12.06 වැනි දින දරන උකස් බැඳුම්කරය මත අයවිය යුතු ගෙවීම් කිරීම ලියනවඩුගේ ජානකී නයනාදරී මහත්මිය සහ දොන් සේකර වඩුගේ සුදත් ෂෙල්ටන් සෝමවීර මහතා විසින් පැහැර හැර ඇති හෙයින්, දැන් එකී අංක 1005 දරන බැඳුම්කරය මත රුපියල් දෙලක්ෂ විසිඑක් දහස් හයසිය හැට හයයි ශත හැත්තෑ තුනක (රු. 2,21,666.73) මුදලක් මහජන බැංකුවට අයවිය යුතු සහ ලැබිය යුතුව ඇත. එබැවින් 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතින් පැවරී ඇති බලතල යටතේ මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින්, රුපියල් දෙලක්ෂ විසිඑක් දහස් හයසිය හැට හයයි ශත හැත්තෑ තුනක (රු. 2,21,666.73) එකී මුදල ද, 2009.07.14 දින සිට විකිණීමේ දිනය තෙක් රුපියල් දෙලක්ෂ විසිඑක් දහස් හයසිය හැටහයයි ශත හැත්තෑතුනක (රු. 2,21,666.73) මුදලක් මත වර්ෂයකට සියයට විස්සයි දශම පහ (20.5%) බැගින් තවදුරටත් වූ පොළිය ද, විකිණීමේ ගාස්තු ද, එකී මහජන බැංකු පනතේ 29ඕ වගන්තිය යටතේ අයකර ගත යුතු මුදල් ද එදින තෙක් කරනු ලැබ ඇති ගෙවීම්( කිසිවක් වේ නම්) අඩු කිරීමෙන් පසු අයකර ගැනීම සඳහා අංක 1005 දරන උකස් බැඳුම්කරය මගින් එකී බැංකුවට උකස්කර ඇති දේපළ සහ පරිශ්‍රය කොළඹ බලයලත් වෙන්දේසිකරු ඊ. එස්. රාමනායක මහත්මිය විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු බවට මෙයින් යෝජනා සම්මත කරනු ලැබේ.

### උකස් කරන ලද දේපළ සහ පරිශ්‍ර පිළිබඳ විස්තරය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, හේවාගම් කෝරළයේ, පල්ලේ පත්තුවේ, කඩුවෙල ප්‍රාදේශීය සභා සීමාව තුළ තලංගම පිහිටියා වූ ද බලයලත් මිනින්දෝරු ඒ. හෙට්ටිගේ විසින් සාදන ලද අංක 3534 හා 2003 පෙබරවාරි මස 02 දින දරන පිඹුරේ ලොට් අංක 1 ලෙස ලකුණු කොට නිරූපණය කර ඇත්තා වූ ද, උතුරට : පාර ද, නැගෙනහිරට : බලයලත් මිනින්දෝරු ජේ. පී. එන්. ජයසුන්දර විසින් සාදන ලද අංක 1099 දරන පිඹුරේ ලොට් අංක 1 ද, දකුණට : එකී අංක 1099 දරන පිඹුරේ ලොට් අංක 3 ද, බස්නාහිරට : අඩි 15ක් පළල (අංක 1099 පිඹුරේ ලොට් අංක 5 වන) පාර ද මායිම් වන්නා වූ ද, එකී අංක 3534 දරන පිඹුරට අනුව පර්චස් දහතුනක් (අ. 0, රූ. 0, පර්. 13) විශාල වූ බෙදා වෙන් කරන ලද මුළු ඉඩම් කොටස සහ එහි පස, එහි පිහිටි ගහකොළ, වැවිලි හා වෙනත් සියලු දේත් ය.

ඉහත කී අංක 3534 දරන පිඹුරේ දැක්වෙන ලොට් අංක 1 පහත දැක්වෙන ඉඩමේ නැවත මැනීමකි :

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, හේවාගම් කෝරළයේ, පල්ලේ පත්තුවේ, කඩුවෙල ප්‍රාදේශීය සභා සීමාව තුළ තලංගම පිහිටියා වූ ද, දෙල්ගහවත්තේ කැබැල්ල යැයි කියනු ලබන ඉඩමේ බලයලත් මිනින්දෝරු ජේ. පී. එන්. විජයසුන්දර විසින් සාදන ලද අංක 1099 හා 1998 දෙසැම්බර් මස 05 වැනි දින දරන පිඹුරේ ලොට් අංක 2 ලෙස ලකුණු කොට නිරූපණය කර ඇත්තා වූ ද, උතුරට : පාර ද, නැගෙනහිරට : ලොට් අංක 1 ද, දකුණට : ලොට් අංක 3 ද, බස්නාහිරට : ලොට් අංක 5 ද මායිම් වන්නා වූ ද, පර්චස් එකොළහයි දශම පහක් (අ. 0. රූ, 0, පර්. 11.5) විශාල

වූ හෝමාගම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ G1156/05හි ලියාපදිංචි කර ඇත්තාවූ ද බෙදා වෙන් කරන ලද මුළු ඉඩම් කොටස එහි පස, එහි පිහිටි ගහකොළ, වැවිලි හා වෙනත් සියලු දේත් ය. අංක 1099 හා 1998 දෙසැම්බර් මස 05 වැනි දින දරන පිඹුරේ ලොට් අංක 5 (අඩි 15ක් පළල පාර සඳහා වෙන් කිරීම) ලෙස ලකුණු කර ඇත්තා වූ ද, උතුරට : පාර ද, නැගෙනහිරට : ලොට් අංක 2, 3 සහ 4 ද, දකුණට : ලොට් අංක 9 ද, බස්නාහිරට : ලොට් අංක 8 හා 6 ද මායිම් වන්නාවූ ද, පර්චස් දොළහයි දශම එකක් (අ. 0, රූ. 0, පර්. 12.1) විශාල වූ ද, හෝමාගම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ G1156/09 ලියාපදිංචි කර ඇත්තා වූ ද, බෙදා වෙන් කරන ලද මුළු ඉඩම් කොටස.

හෝමාගම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ G1528/31, 1488/213 හි ලියාපදිංචි කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණපරිදි,

සහකාර සාමාන්‍යාධිකාරී,
(බටහිර කළාප II).

මහජන බැංකුව,
ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලය (කොළඹ පිටත),
අංක 102, ස්ටැන්ලි තිලකරත්න මාවත,
නුගේගොඩ.

05-709

---

**සම්පත් බැංකුව පීඑල්සී**
( සීමාසහිත සම්පත් බැංකුව නමින් කලින් හැඳින්වූ )

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය යටතේ සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබූ යෝජනා සම්මුතිය

ඒ. ඩී. ජේ. කරුණානායක සහ පී. ඩී. ඩී. සී. කරුණාරත්න.
ගිණුම් අංක : 0022 5001 3925.

සම්පත් බැංකුව පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් වර්ෂ 2010 ක් වූ මාර්තු මස 25 වැනි දින පවත්වන්නට යෙදුණු රැස්වීමේ දී පහත සඳහන් අයුරු විශේෂිතව හා ඒකමතිකව යෝජනා කොට සම්මත කර ගන්නා ලදී :

සමාගම් ලියාපදිංචි අංක පීකිව්. 144 දරන සම්පත් බැංකුව පීඑල්සී නමින් කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් කේ. එස්. පී. ඩබ්ලිව්. ජයවීර යන අය විසින් ලියා සහතික කරන ලද 2003 ඔක්තෝබර් මස 15 දාතම හා අංක 2361 දරන උකස් බැඳුම්කරය මගින් උකස්කොට ඇපකොට මෙහි උපලේඛනයේ මැනවින් විස්තර කොට ඇති දේපළ හා පරිශ්‍රයන් ඇපයට තබාගෙන ලබාදුන් ණය මුදල ආපසු ගෙවීම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතපත්තු දොන් ජයන්ත කරුණානායක සහ පයන්ගලගේ දෝන දේවිකා චාන්දනී කරුණාරත්න යන අය බන්ධනදායීන් වශයෙන් හා එකී අතපත්තු දොන් ජයන්ත කරුණානායක උකස්කරු වශයෙන් පැහැර හැර ඇති හෙයින් ද, එකී බැඳුම්කරය ප්‍රකාර අයවිය යුතු මුළු මුදල වශයෙන් ශ්‍රී ලංකාවේ වලංගු මුදලින් රුපියල් හාරලක්ෂ පනස් පන් දහස් එකසිය අනූ නමයයි ශත විසි නමයක (රු. 4,55,199.29) මුදලක් 2010 ජනවාරි මස 04 වැනි දිනට එකී සම්පත් බැංකුව පීඑල්සී වෙත ලැබිය යුතුව හා අයවිය යුතුව ඇති හෙයින් ද, එකී රුපියල් හාරලක්ෂ පනස් පන් දහස් එකසිය අනූ නමයයි ශත විසි නමයක (රු. 4,55,199.29) මුදල ද 2010 ජනවාරි මස 05 දින සිට අංක 2361 දරන එකී බැඳුම්කරය මත අයවිය යුතු මුළු මුදල පියවනු ලබන දිනය තෙක්, රුපියල් හාරලක්ෂ හයදහස් දෙසීය පනහක (රු. 4,06,250) මුදලක් සඳහා වාර්ෂිකව සියයට දහහතක් (17%), බැගින් වූ පොලිය ද, දැන්වීම් ගාස්තු ද, දරන්නට සිදුවූ වෙනත් වියදම් ද, තදනන්තරව ලැබී ඇති යම් මුදලක් (වෙතොත්) ඒවා අඩුකොට අයකර ගැනීම සඳහා, අංක 2361 දරන එකී බැඳුම්කරය මගින් ලබාගන්නා ලද එකී ණය මුදල සඳහා ඇප වශයෙන් එකී සම්පත් බැංකුව පීඑල්සී වෙත උකස්කොට ඇති මෙහි උපලේඛනයේ මැනවින් විස්තර කොට ඇති පරිශ්‍රයන් හා දේපළ, මහනුවර බලයලත් වෙන්දේසිකරුවන් වන අයි. ඩබ්ලිව්. ජයසූරිය ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණාලිය යුතු යැයි, 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන ) පනතින් පැවරී ඇති බලතල ප්‍රකාර එකී සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කර ගන්නා ලදී.

උපලේඛනය

සබරගමුව පළාතේ, කෑගල්ල දිස්ත්‍රික්කයේ, තුන් කෝරළයේ හි පානවල් කෝරළයේ දෙහිඕවිට ප්‍රාදේශීය සභා සීමාවන් තුළ මාදොල පිහිටි "අබ්බාසි එස්ටේට්" (හි කොටසක්) (පිඹුරු අංක 2460 හි ලොට් 6 හි උප බෙදුමක් හා නැවත මිනුමක් වන) යැයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන ඩී. ඒ. විජේසිංහ යන අය විසින් සාදන ලද 2000 දෙසැම්බර් මස 28 දාතම හා අංක W/2590 දරන පිඹුරේ නිරූපිත බෙදාවෙන් කොට සීමා නිර්ණය කොට ලොට් ඒ වශයෙන් ලකුණු කොට ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට : ඉසුරු මාවත සහ ඩී. එන්. ආරියරත්න යන අය විසින් හිමිකම් කියනු ලබන අබ්බාසි එස්ටේට් හි කොටසක්, නැගෙනහිරට : ඩී. ඒ. රුශාන් යන අය විසින් හිමිකම් කියනු ලබන අබ්බාසි එස්ටේට් (හි කොටසක්), දකුණට : පාර (ප්‍රාදේශීය සභා) සහ බස්නාහිරට : ඇල වඩා නිවැරදිව ලොට් බී සහ ඉසුරු මාවත යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් රූඩ් තුනයි, පර්චස් හතරයි දශම අටක් (අ. 0, රූ. 3, පර්. 4.8) විශාල ඉඩම් කොටස සමග පස, ගහකොළ, වගාවන් සහ එහි පිහිටි සෑම සියලු දේ සහ සියලුම මාර්ග අයිතීන් ද, වෙනත් අයිතීන් ද, වරප්‍රසාදයන්, ප්‍රවශතාවන්, පරවශ්‍යතාවන් සහ ඒ හා සම්බන්ධ අනුබද්ධයන් ද සමග එකී අංක W/2590 දරන පිඹුරට අනුව වෙළුම/පත්ඉරුව ආර් 77/188 යටතේ අවිස්සාවේල්ල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණපරිදි,

සමාගම් ලේකම්.

05-757/5

---

**සීමාසහිත ඩීඑෆ්සීසී වර්ධන බැංකුව**

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය ප්‍රකාර සීමාසහිත ඩීඑෆ්සීසී වර්ධන බැංකුව විසින් සම්මත කරගන්නා ලද යෝජනා සම්මතය පිළිබඳ දැන්වීම

සීමාසහිත ඩීඑෆ්සීසී වර්ධන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙහි පහත දැක්වෙන යෝජනා සම්මතය ඒකච්ඡන්දයෙන් සම්මත කර ගන්නා ලද බව 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වැනි වගන්තියට අනුකූලව මෙයින් දැනුම් දෙනු ලැබේ :

**අධ්‍යක්ෂ මණ්ඩල යෝජනා සම්මතය**

සීමාසහිත ඩීඑෆ්සීසී වර්ධන බැංකුව නමට ගම්පහ ප්‍රසිද්ධ නොතාරිස් ආර්. එම්. ඒ. එන්. ඩබ්. රාජකරුණා විසින් ලියා සහතික

කරන ලද අංක 21983 හ 21984 හා 2004.09.14 දින ද අංක 22416 හා 2005.05.08 දින ද අංක 22739 හා 2007.05.31 දින ද, අංක 22990 සහ 22991 හා 2005.08.12 දින ද අංක 23675 හා 2006.03.15 දින ද අංක 24335 හා 2006.10.12 දින ද දරන උකස් බැඳුම්කර මත අයවිය යුතු මුදල් ගෙවීම, ගම්පහ, ගම්ලක්ෂගේ දොන් අජිත් නාලන් ධම්මික සෙනෙවිරත්න යන අය විසින් පැහැර හැර ඇති හෙයින් ද, 2008 නොවැම්බර් මස 30 වැනි දිනට එම උකස් බැඳුම්කර මත, එකී ගම්ලක්ෂගේ දොන් අජිත් නාලන් ධම්මික සෙනෙවිරත්න යන අයගෙන් සීමාසහිත ඩීඑෆ්සීසී වර්ධන බැංකුවට රුපියල් එක්කෝටි තිස් හතර ලක්ෂ විසිහත් දහස් අටසිය හතලිස් නවයකුත් ශත තිස්පහක (රු. 1,34,27,849.35) මුදලක් සහ ඒ සඳහා 2008 දෙසැම්බර් මස 01 වැනි දින සිට වර්ෂයකට සියයට තිස්හය (36%) බැගින් හෝ මෙම බැංකු පහසුකමට අදාළ විය හැකි වෙනත් යම් අනුපාතිකයක් මත පොළිය ද, රුපියල් දෙකෝටි තිස්නව ලක්ෂ අනූ අට දහස් නවසිය හැත්තෑ දෙකකුත් ශත හැටක (රු. 2,39,98,972.60) මුදලක් සහ 2008 දෙසැම්බර් මස 01 දින සිට විකිණීමේ දිනය දක්වා එයින් රුපියල් දෙකෝටි තිස්පන් ලක්ෂයක් (රු. 2,35,00,000) සඳහා වර්ෂයකට සියයට විසිනවයක් (29%) බැගින් පොළිය ද, ලැබිය යුතුව හා අයවිය යුතුව ඇති හෙයින් ද,

ඉහත කී උකස් බැඳුම්කරය මත අයවිය යුතු මුදල වන රුපියල් එක්කෝටි තිස්හතර ලක්ෂ විසිහත් දහස් අටසිය හතලිස් නවයකුත් ශත තිස්පහක (රු. 1,34,27,849.35) මුදල සහ ඒ සඳහා 2008 දෙසැම්බර් මස 01 වැනි දින සිට වර්ෂයකට සියයට තිස්හය (36%) බැගින් හෝ මෙම බැංකු පහසුකමට අදාළ විය හැකි වෙනත් යම් අනුපාතිකයක් මත පොළිය ද, රුපියල් දෙකෝටි තිස්නව ලක්ෂ අනූ අට දහස් නවසිය හැත්තෑ දෙකකුත් ශත හැටක (රු. 2,39,98,972.60) මුදල සහ 2008 දෙසැම්බර් මස 01 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා එයින් රුපියල් දෙකෝටි තිස්පන් ලක්ෂයක් (රු. 2,35,00,000) සඳහා වර්ෂයකට සියයට විසිනවයක් (29%) බැගින් පොළිය හෝ විකිණීමේ දිනට එයින් නොගෙවා ඉතිරිව ඇති යම් කොටසක් මීට අදාළ ඉඩම හා පරිශ්‍රය සහ එහි පිහිටි සියලු දේ සහ වෙළඳ භාණ්ඩ තොග විකිණීම පිළිබඳ ප්‍රචාරක ගාස්තු හා විකිණීමේ ගාස්තු ද 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 13 වැනි වගන්තිය අනුව හා එකී උකස් බැඳුම්කරයේ ප්‍රතිඥප්ති අනුව සීමාසහිත ඩීඑෆ්සීසී වර්ධන බැංකුව වැයකර ඇති සියලු මුදල් හා දරා ඇති සියලු වියදම් හා ගාස්තු ද සමග අයකර ගැනීම සඳහා ඉහත කී අංක 21983, 21984, 22416, 22739, 22990, 22991, 24335 සහ 23675 දරන උකස් බැඳුම්කර මගින් සීමාසහිත ඩීඑෆ්සීසී වර්ධන බැංකුව වෙත උකස් කර ඇති මෙහි පහත විස්තර කරන ඉඩම සහ පරිශ්‍රය සහ එහි පිහිටි සියලු දේ හා වෙළඳ භාණ්ඩ තොග කොළඹ බලයලත් වෙන්දේසිකාර ෂොක්මන් සහ සමරවික්‍රම මහතුන් ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතුයැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පැවරි ඇති බලතල යටතේ සීමාසහිත ඩීඑෆ්සීසී වර්ධන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් යෝජනා සම්මත කරයි.

**අංක 21983, 21984, 22416, 22739, 22991 සහ අංක 23675 දරන උකස් බැඳුම්කර මගින් උකස් කරන ලද දේපළ විස්තරය**

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, අලුත්කුරු කෝරළේ, රාගම් පත්තුවේ, ගම්පහ මහ නගර සභා සීමාව ඇතුළත ගම්පහ මැදගම පිහිටි ගම්පහ යක්කල පාර, වරිපනම් අංක 139 දරන කීනගහලන්ද නමැති ඉඩමේ බලයලත් මිනින්දෝරු එච්. ඒ. එන්. පී. රණසිංහ විසින් මැන සාදන ලද අංක 253 හා 2002.05.28 දින දරන පිඹුරේ දැක්වෙන ලොට් සී ලෙස ලකුණු කළ බෙදා වෙන් කළ බිම් කට්ටිය වන උතුරට : එස්. එම්. ජයසේකරට සහ තවත් අයට අයිති කුඹුර ද, නැගෙනහිරට : අංක 3557/සී දරන පිඹුරේ ලොට් අංක 5 සහ අංක 249 දරන පිඹුරේ දැක්වෙන ඉඩමේ ඉතිරි කොටස සහ ළිඳ ද, දකුණට : පාර (හයිවේ) සහ බස්නාහිරට : අංක 2077P දරන පිඹුරේ ලොට් අංක 3 සහ අංක 250 දරන පිඹුරේ ලොට් ඒ දරන බිම් කට්ටිය ද යන මායිම් ඇතුළත රූඩ් එකකුත් පර්චස් තිස් හතක් (අ. 0, රූ. 1, පර්. 37) නොහොත් හෙක්ටෙයාර් 0.1947ක් බිම් ප්‍රමාණයෙන් යුත් ඉඩම සහ එහි පිහිටි ගොඩනැගිලි, ගසකොළ, වැවිලි සහ වෙනත් සියලු දේ.

**අංක 22990 දරන උකස් බැඳුම්කරය මගින් උකස් කරන ලද වත්කම් පිළිබඳ විස්තරය**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, ගම්පහ-යක්කල පාර අංක 135 දරන පරිශ්‍රය තුළ සහ මත 2005 අගෝස්තු මස 01 වැනි දිනට තිබෙන

| විස්තරය | හඳුනාගැනීමේ අංකය | සංඛ්‍යාව |
|---|---|---|
| සී ආර් 41 | HF-0796 | 01 |
| සී ආර් 41 | JF-8308 | 01 |
| සෙඩ්‍රික් | 65-2273 | 01 |
| බෙන්ස් 200 ඩී | 64-0573 | 01 |
| කැරීනා 1.8 එස් අයි. | ජී. එස්. 8688 | 01 |
| චවර්ලේ කෲස් | ලියාපදිංචි නොකළ | 01 |
| ටොයෝටා හයිඒස් (ඩොල්ෆින්) | 62-1935 | 01 |
| හයිඒස් (සෙල්) | 54-8390 | 01 |
| මිට්සුබිෂි පැජරෝ | 32-7783 | 01 |
| මිට්සුබිෂි පැජරෝ | 64-3118 | 01 |
| ඉසුසු එල්ෆ් 250 | 226-740 | 01 |
| හයිජෙට් ඩයිහට්සු | ලියාපදිංචි නැති | 01 |
| මිනි මයිනර් | 04-6328 | 01 |
| කොරොල්ලා Xe සැලූන් ලිමිටඩ් 110 | ජීයූ - 7215 | 01 |
| එක්ස් සැලූන් එස්බී 14 (නිසාන්) | 65-8889 | 01 |
| මාච් (නිසාන්) | එච්ඩී 5067 | 01 |
| නිසාන් මාච් ලිමිටඩ් | ජේ ඒ - 1718 | 01 |
| සුබාරු | ලියාපදිංචි නොකළ | 01 |
| සුසුකි ස්විෆ්ට් | ලියාපදිංචි නොකළ | 01 |
| 1.8 ඩීඑක්ස් කොරොල්ලා සිර් 90 | 64-5097 | 01 |
| ලාන්සර් 1400 | 11 ශ්‍රී 7658 | 01 |
| මැස්ඩා 323 | 15-9512 | 01 |
| කැන්ටර් 250-10-1/2 | 226-9133 | 01 |
| හොන්ඩා සිවික් | 300-0051 | 01 |
| කොරොල්ලා 110 | ජීසී 1784 | 01 |
| නිසාන් සනී | 16-5513 | 01 |
| කොරොල්ලා ඊඊ 96 | 18-6274 | 01 |
| මිට්සුබිෂි ජීප් | 32-7362 | 01 |
| ලයිට් ඒස් | 56-2868 | 01 |
| මරුටි | ජීඑෆ් - 5327 | 01 |

යන සියලු චංචල දේපළ ඇතුළුව දැනට එම පරිශ්‍රයේ තිබෙන හෝ ගබඩා කොට තිබෙන වෙනත් සියලු අයිතම හා සෑම ආකාරයකම සහ කවර හෝ විස්තරයකට අයත් වෙළඳ බඩු තොග, වෙළඳ ද්‍රව්‍ය, බඩු බාහිරාදිය. අමු ද්‍රව්‍ය, නොනිමි වැඩ, නිමි භාණ්ඩ හා නොනිමි භාණ්ඩ

**අංක 24335 දරන උකස් බැඳුම්කරය මගින් උකස් කරන ලද වත්කම් විස්තරය**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ, බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, ගම්පහ, යක්කල පාර අංක 135 දරන පරිශ්‍රය තුළ සහ මත තිබෙන

| විස්තරය | හඳුනාගැනීමේ අංකය | සංඛ්‍යාව |
|---|---|---|
| මිට්සුබිෂි ස්ට්‍රාඩා | 250-7143 | 01 |
| නිසාන් එක්ස් - ට්‍රයල් | එච් සී - 7227 | 01 |

| විස්තරය | හඳුනාගැනීමේ අංකය | සංඛ්‍යාව |
|---|---|---|
| නිසාන් සනී එන් 16 | ජේ. බී. 1865 | 01 |
| සුසුකි ස්විෆ්ට් | ලියාපදිංචි නොකළ | 01 |
| නිසාන් කියුබ් | එච් ජී 4189 | 01 |
| ටොයෝටා අයි එස් ටී | ලියාපදිංචි නොකළ | 01 |
| ටොයෝටා කැම් | ජී කිව් 5653 | 01 |
| සුසුකි ස්විෆ්ට් | ලියාපදිංචි නොකළ | 01 |
| චවර්ලේ කෲස් | ලියාපදිංචි නොකළ | 01 |
| කියා රියෝ | ලියාපදිංචි නොකළ | 01 |
| හොන්ඩා මිනි කැබ් | ලියාපදිංචි නොකළ | 01 |
| හයිඋන්ඩායි - ඇක්සන්ට් | ලියාපදිංචි නොකළ | 01 |
| ටොයෝටා හයිඒස් එල්එච් 61 | 61-1290 | 01 |
| නිසාන් කැරවෑන් | ලියාපදිංචි නොකළ | 01 |
| නිසාන් කැරවෑන් (3 ඕඩීඅයි) සී එක්ස් | ලියාපදිංචි නොකළ | 01 |
| ටොයෝටා අල්ලිඔන් (ඒ 1.5) | ලියාපදිංචි නොකළ | 01 |
| ටොයෝටා කොරොල්ලා (121) | ලියාපදිංචි නොකළ | 01 |
| සුසුකි ග්‍රෑන්ඩ් විටාරා | ජීජී - 5555 | 01 |
| මිට්සුබිෂි ඉන්ටර්කූලර් (2.8) | 64-8814 | 01 |
| මිට්සුබිෂි මොන්ටෙරෝ | ජීඊ 9876 | 01 |
| ටොයෝටා ලෑන්ඩ් කෲසර් ප්‍රාඩෝ | ලියාපදිංචි නොකළ | 01 |
| ඉසුසු එල්ෆ් ටිපර් | 226-0740 | 01 |
| ඉසුසු එල්ෆ් (250) | ලියාපදිංචි නොකළ | 01 |
| නිසාන් ඩැට්සන් | 50 ශ්‍රී 6062 | 01 |
| යූ. ඩී. නිසාන් - ඩීසල් බස් | ලියාපදිංචි නොකළ | 01 |
| ටොයෝටා - ඩයිනා | ලියාපදිංචි නොකළ | 01 |
| ඉසුසු එල්ෆ් (260) එෆ්ටී | ජේඑෆ් 4479 | 01 |
| හයිඋන්ඩායි - ස්ටෙලර් | 15-2579 | 01 |
| ඉසුසු - ජෙමිනි | 32-9472 | 01 |
| මිට්සුබිෂි මිනිකැබ් | එල්ජී 4645 | 01 |
| ටොයෝටා - හයිඒස් (ඩොල්ෆින්) | ජේඕ 2591 | 01 |
| ටොයෝටා - හයිඒස් (ඩොල්ෆින්) | 52-8900 | 01 |
| නිසාන් වැනට් කැබ් | ලියාපදිංචි නොකළ | 01 |
| මැස්ඩා බොංගෝ | 254-1249 | 01 |
| ටොයෝටා කොරොල්ලා (ඩීඑක්ස්) | 15-8540 | 01 |
| ටොයෝටා කොරෝනා (170) | 64-9338 | 01 |
| ටොයෝටා කොරෝනා (170) | 64-3742 | 01 |
| ටොයෝටා හයිඒස් සුපර් ජී එල් | පීඩී 2345 | 01 |
| හොන්ඩා කාර් | 300-8512 | 01 |
| ටොයෝටා සී ආර් 27 | 254-1618 | 01 |
| මිට්සුබිෂි කැන්ටර් ලොරි | 226-9133 | 01 |
| ටොයෝටා හයිඒස් | එච්. ඩබ්ලිව් 5544 | 01 |
| කියා ෂේපියා | එච් ඉසෙඩ් 8250 | 01 |
| නිසාන් මාර්ච් | ජේඩී 5353 | 01 |
| මිට්සුබිෂි ජීප් (පැජරෝ) | 64-3118 | 01 |
| නිසාන් - ඩැට්සන් කැබ් | 40-2881 | 01 |
| ටොයෝටා ඇලිඔන් | ජේ ටී 7094 | 01 |

යන සියලු චංචල දේපළ ඇතුළුව, දැනට එම පරිශ්‍රයේ තිබෙන හෝ ගබඩාකොට තිබෙන සහ වෙනත් යම් ගුදම්, ගබඩා සහ පරිශ්‍රවල හෝ වෙනත් යම් ස්ථානයත තබා තිබෙන වෙනත් සියලු අයිතම හා සෑම ආකාරයකම හා කවර හෝ විස්තරයක වෙනත් චංචල දේපළ

එල්. ජී. පෙරේරා,
කළමණාකාර අධ්‍යක්ෂ/ප්‍රධාන විධායක නිලධාරී.

සීමාසහිත ඩීඑෆ්සීසී වර්ධන බැංකුව,
අංක 73, ඩබ්. ඒ. ඩී. රාමනායක මාවත,
කොළඹ 02.

05-752

**සම්පත් බැංකුව පීඑල්සී**
(සීමාසහිත සම්පත් බැංකුව නමින් කලින් හැඳින්වූ)

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය යටතේ සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කර ගන්නා ලද සම්මුතිය

කේ. වසන්ත කුමාර්.
ගිණුම් අංක : 0042 5000 8452.

සම්පත් බැංකුව පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2010 ක් වූ මාර්තු මස 25 වැනි දින පවත්වන්නට යෙදුණු රැස්වීමේ දී පහත සඳහන් අයුරු විශේෂිතව හා ඒකමතිකව යෝජනා සම්මත කර ගන්නා ලදී.

සමාගම් ලියාපදිංචි අංක පීකිව්. 144 දරන සම්පත් බැංකුව පීඑල්සී නමින් කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ඩබ්ලිව්. ජී. කේ. විජේතුංග යන අය විසින් ලියා සහතික කරන ලද 2003 අප්‍රේල් මස 09 දාතම හා අංක 847, 2006 නොවැම්බර් 02 දාතම හා අංක 3250, 2007 ජූනි 27 දාතම හා අංක 3788 සහ 2008 සැප්තැම්බර් 18 දාතම හා අංක 4191 දරන උකස් බැඳුම්කර සියල්ලම මගින් උකස්කොට ඇපකොට මෙහි උපලේඛනයේ මැනවින් විස්තර කොට ඇති දේපළ හා පරිශ්‍රයන් ඇපයට තබාගෙන ලබාදුන් ණය මුදල ආපසු ගෙවීම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ කොලන්දවෙල් නොහොත් කුමාරවේලු වසන්ත කුමාර් යන අය බන්ධනදායීන් වශයෙන් පැහැර හැර ඇති හෙයින් ද, එකී බැඳුම්කර ප්‍රකාර අයවිය යුතු මුළු මුදල වශයෙන් ශ්‍රී ලංකාවේ වලංගු මුදලින් රුපියල් දසලක්ෂ හැට දෙදහස් තුන්සිය විසි හයයි ශත හැත්තෑඑකක (රු. 10,62,326.71) මුදලක් 2010 ජනවාරි මස 25 වැනි දිනට එකී සම්පත් බැංකුව පීඑල්සී වෙත ලැබිය යුතුව හා අයවිය යුතුව ඇති හෙයින් ද, එකී රුපියල් දසලක්ෂ හැට දෙදහස් තුන්සිය විසි හයයි ශත හැත්තෑඑකක (රු. 10,62,326.71) මුදල ද 2010 ජනවාරි මස 26 දින සිට අංක 847, 3250, 3788 සහ 4191 දරන එකී බැඳුම්කර මත අයවිය යුතු මුළු මුදල පියවනු ලබන දිනය තෙක්, රුපියල් පන්ලක්ෂ හැටඑක් දහස් හයසිය හැට හයයි ශත පනස් නමයක (රු. 5,61,666.59) මුදලක් සඳහා වාර්ෂිකව සියයට විසිදෙකක් (22%), රුපියල් පනස් නමදහස් නවසිය අනූවයි ශත විසිහයක (රු. 59,990.26) මුදලක් සඳහා වාර්ෂිකව සියයට විසිදෙකක් (22%) හා තවත් රුපියල් තුන්ලක්ෂ විසි දහස් අටසිය දෙකයි ශත හතලිස් හතක (රු. 3,20,802.47) මුදලක් සඳහා වාර්ෂිකව සියයට විසිපහක් (25%) බැගින් වූ පොලිය ද, දැන්වීම් ගාස්තු ද, දරන්නට සිදුවූ වෙනත් වියදම් ද, තදනන්තරව ලැබී ඇති යම් මුදලක් (වෙතොත්) ඒවා අඩුකොට අයකර ගැනීම සඳහා, අංක 847, 3250, 3788 සහ 4191 දරන එකී බැඳුම්කර මගින් ලබාගන්නා ලද එකී ණය මුදල සඳහා ඇප වශයෙන් එකී සම්පත් බැංකුව පීඑල්සී වෙත උකස්කොට ඇති මෙහි උපලේඛනයේ මැනවින් විස්තර කොට ඇති පරිශ්‍රයන් හා දේපළ, මහනුවර බලයලත් වෙන්දේසිකරුවන් වන අයි. ඩබ්ලිව්. ජයසූරිය ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණාලිය යුතු යැයි, 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන ) පනතින් පැවරී ඇති බලතල ප්‍රකාර එකී සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කර ගන්නා ලදී.

**උපලේඛනය**

මධ්‍යම පළාතේ, නුවරඑළිය දිස්ත්‍රික්කයේ, උඩ බුලත්ගම කොට්ඨාසයේ අඹගහමුව කෝරළේ, හැටන් දික්ඔය නගර සභා සීමාවන් තුළ හැටන් පිහිටි "ෆ්‍රෑට් හිල් එස්ටේට්" යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන ඩී. එල්. ඩී. වයි. විජේවර්ධන යන අය විසින් සාදන ලද 1987 ජනවාරි 14 දාතම හා අංක 3240 දරන පිඹුරේ නිරූපිත බෙදා වෙන් කොට සීමා නිර්ණය කොට ලොට් 23 වශයෙන් ලකුණු කොට ඇති ඉඩම් කොටසට

මායිම්, උතුරට : ලොට් 22, 21 සහ 20, නැගෙනහිරට : ලොට් 20 සහ පිවිසුම් ක්‍රමය, දකුණට : පිවිසුම් ක්‍රමය හා ලොට් 17 වඩා නිවැරදිව ලොට් 27 සහ බස්නාහිරට : ලොට් 27 සහ 22 යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් දහයක් (අ. 0, රූ. 0, පර්. 10) විශාල ඉඩම් කොටස සමග පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියලු දේ සහ සියලුම මාර්ග අයිතීන් ද, වෙනත් අයිතීන් ද, වරප්‍රසාදයන්, ප්‍රවශතාවයන්, පරවශ්‍යතාවයන් සහ ඒ හා සම්බන්ධ අනුබද්ධයන් ද සමග එකී අංක 3240 දරන පිඹුරට අනුව වෙළුම/පත්ඉරුව බී 74/261 යටතේ ගම්පොල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සමාගම් ලේකම්.

05-757/2

---

**සම්පත් බැංකුව පීඑල්සී**
( සීමාසහිත සම්පත් බැංකුව නමින් කලින් හැඳින්වූ )

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය යටතේ සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කර ගන්නා ලද සම්මුතිය

ජී. ආර්. ජී. ගොඩගමගේ,
ගිණුම් අංක : 0007 5010 3081.

සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් වර්ෂ 2010 ක් වූ මාර්තු මස 25 වැනි දින පවත්වන්නට යෙදුණු රැස්වීමේ දී පහත සඳහන් අයුරු විශේෂිතව හා ඒකමතිකව යෝජනා සම්මත කර ගන්නා ලදී.

සමාගම් ලියාපදිංචි අංක පීකිව්. 144 දරන සම්පත් බැංකුව පීඑල්සී නමින් මහනුවර ප්‍රසිද්ධ නොතාරිස් ඒ. ඕ. ආර්. ප්‍රනාන්දු යන අය විසින් ලියා සහතික කරන ලද 1999 මාර්තු මස 25 වැනි දාතම හා අංක 7789 දරන හා එස්. ටී. කේ. විබද්ද යන අය විසින් ලියා සහතික කරන ලද 2005 සැප්තැම්බර් මස 28 දාතම හා අංක 676 දරන උකස් බැඳුම්කර දෙක මගින් උකස්කොට ඇපකොට මෙහි උපලේඛනයේ මැනවින් විස්තර කොට ඇති දේපළ හා පරිශ්‍රයන් ඇපයට තබාගෙන ලබාදුන් ණය මුදල ආපසු ගෙවීම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගොඩගම රාලලාගේ ගාමිණී ගොඩගමගේ යන අය බන්ධනදායී වශයෙන් පැහැර හැර ඇති හෙයින් ද, එකී බැඳුම්කර ප්‍රකාර අයවිය යුතු මුළු මුදල වශයෙන් ශ්‍රී ලංකාවේ වලංගු මුදලින් රුපියල් අටලක්ෂ අට දහස් දෙසීය හැත්තෑ අටයි ශත දහ අටක (රු. 8,08,278.18) මුදලක් 2009 නොවැම්බර් මස 26 වැනි දිනට එකී සම්පත් බැංකුව පීඑල්සී වෙත ලැබිය යුතුව හා අයවිය යුතුව ඇති හෙයින් ද, එකී රුපියල් අටලක්ෂ අට දහස් දෙසීය හැත්තෑ අටයි ශත දහ අටක (රු. 8,08,278.18) මුදල ද 2009 නොවැම්බර් මස 27 වැනි දින සිට අංක 7789 සහ 676 දරන එකී බැඳුම්කර මත අයවිය යුතු මුළු මුදල පියවනු ලබන දිනය තෙක්, රුපියල් පන්ලක්ෂ විසි දහසක (රු. 5,20,000) මුදලක් සඳහා වාර්ෂිකව සියයට දහ හතයි දශම පහක් (17.5%) බැගින් වූ පොළිය ද, දැන්වීම් ගාස්තු ද, දරන්නට සිදුවූ වෙනත් වියදම් ද, තදනන්තරව ලැබී ඇති යම් මුදලක් (වෙතොත්) ඒවා අඩුකොට අයකර ගැනීම සඳහා, අංක 7789 සහ 676 දරන එකී බැඳුම්කර මගින් ලබාගන්නා ලද එකී ණය මුදල සඳහා ඇප වශයෙන් එකී සම්පත් බැංකුව පීඑල්සී වෙත උකස්කොට ඇති මෙහි උපලේඛනයේ මැනවින් විස්තර කොට ඇති පරිශ්‍රයන් හා දේපළ, මහනුවර බලයලත් වෙන්දේසිකරුවන් වන අයි. ඩබ්ලිව්. ජයසූරිය ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණාලිය යුතු යැයි, 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන ) පනතින් පැවරී ඇති බලතල ප්‍රකාර එකී සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කර ගන්නා ලදී.

**උපලේඛනය**

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, දුම්බර කෝරළේ, උඩුගම්පහ පත්තුවේ, කුන්ඩසාලේ ප්‍රාදේශීය සභා සීමාවන් තුළ අතරගල්ල මැදගම්මැද්දේ ග්‍රාමයේ පිහිටි "සියඹලාවේ වත්ත නොහොත් වටගොඩයේවත්ත" යයි කියනු ලබන ඉඩමට බයලත් මානක තැන එස්. කේ. අබේසුන්දර යන අය විසින් සාදන ලද 1998 මැයි මස 16 දාතම හා අංක 897 දරන පිඹුරේ නිරූපිත බෙදා වෙන්කොට සීමා නිර්ණය කොට ලොට් 1 වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට : කේ. ආර්. රණසිංහ යන අයට අයිති එම ඉඩමේ ඉතිරි කොටස, නැගෙනහිරට : කේ. ආර්. දසනායක යන අයට අයිති එම ඉඩමේ ඉතිරි කොටස, දකුණට : මහරතැන්න මල්පන පාර (ගම් සභා පාර) සහ බස්නාහිරට : කේ. ආර්. බෝධිපාල යන අයට අයිති සෙයද්දුරගේවත්ත යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් දහහතරයි දශම හතයි පහක් (අ. 0, රූ. 0, පර්. 14.75) විශාල ඉඩම් කොටස සමග පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියලු දේ සහ සියලුම මාර්ග අයිතීන්ද, වෙනත් අයිතීන් ද, වරප්‍රසාදයන්, ප්‍රවශතාවන්, පරවශ්‍යතාවයන් සහ ඒ හා සම්බන්ධ අනුබද්ධයන් ද සමග එකී අංක 897 දරන පිඹුර අනුව වෙළුම/පත්ඉරුව ඊ 785/193 යටතේ මහනුවර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

එකී ලොට් 1 පහතින් විස්තර කොට ඇති ඉඩමේ නැවත මිනුමකි.

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, දුම්බර කෝරළේ, උඩුගම්පහ පත්තුවේ, කුන්ඩසාලේ ප්‍රාදේශීය සභා සීමාවන් තුළ අතරගල්ල මැදගම්මැද්දේ ග්‍රාමයේ පිහිටි "සියඹලාවේ වත්ත නොහොත් වටගොඩයේවත්ත" යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන එල්. ඩබ්ලිව්. ආරියසේන යන අය විසින් සාදන ලද 1973 ජනවාරි මස 16 දාතම හා අංක 1664 දරන පිඹුරේ නිරූපිත බෙදා වෙන් කොට සීමා නිර්ණය කොට ලොට් 4 වශයෙන් ලකුණු කොට ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට : එකී පිඹුරේ ලොට් 3, නැගෙනහිරට : එකී පිඹුරේ ලොට් 1, දකුණට : ගම් සභා පාර සහ බස්නාහිරට : සෙයද්දුරගේවත්ත වෙන් කරන පැළ ඉණි වැට සහ කොඩිතුවක්කුගෙදර බෝධියාගේවත්ත යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් දහ හතරයි දශම හතයි පහක් (අ. 0, රූ 0, පර්. 14.75) විශාල ඉඩම් කොටස සමග පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියලු දේ සහ සියලුම මාර්ග අයිතීන් ද, වෙනත් අයිතීන් ද, වරප්‍රසාදයන්, ප්‍රවශතාවන්, පරවශ්‍යතාවයන් සහ ඒ හා සම්බන්ධ අනුබද්ධයන් ද සමග එකී අංක 1664 දරන පිඹුරට අනුව ය.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සමාගම් ලේකම්.

05-757/3

---

**සම්පත් බැංකුව පීඑල්සී**
(සීමාසහිත සම්පත් බැංකුව නමින් කලින් හැඳින්වූ)

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය යටතේ සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කර ගන්නා ලද සම්මුතිය

යූ. එම්. බී. එම්. ජී. බී. බස්නායක සහ යූ. එම්. බී. එම්. එම්. පී. බස්නායක,
ගිණුම් අංක : 1038 5334 2429.

සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් වර්ෂ 2010 ක් වූ මාර්තු මස 25 වැනි දින පවත්වන්නට යෙදුණු රැස්වීමේ දී පහත සඳහන් අයුරු විශේෂිතව හා ඒකමතිකව යෝජනා කොට සම්මත කර ගන්නා ලදී.

සමාගම් ලියාපදිංචි අංක පීකිව්. 144 දරන සම්පත් බැංකුව පීඑල්සී නමින් මහනුවර ප්‍රසිද්ධ නොතාරිස් එස්. ටී. කේ. විබැද්ද යන අය විසින් ලියා සහතික කරන ලද 2008 අප්‍රේල් මස 04 දාතම හා අංක 1197 දරන උකස් බැඳුම්කරය මගින් උකස් කොට ඇපකොට මෙහි උපලේඛනයේ මැනවින් විස්තර කොට ඇති දේපළ හා පරිශ්‍රයන් ඇපයට තබාගෙන ලබාදුන් ණය මුදල ආපසු ගෙවීම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ උඩවක මැද බස්නායක මුදියන්සේලාගේ ගාමිණී බණ්ඩාර බස්නායක සහ උඩවක මැද බස්නායක මුදියන්සේලාගේ මදුක් පාලින්ද බස්නායක යන අය බන්ධනදායී වශයෙන් හා එකී උඩවක මැද බස්නායක මුදියන්සේලාගේ ගාමිණී බණ්ඩාර බස්නායක උකස්කරු වශයෙන් පැහැර හැර ඇති හෙයින් ද, එකී බැඳුම්කරය ප්‍රකාර අයවිය යුතු මුළු මුදල වශයෙන් ශ්‍රී ලංකාවේ වලංගු මුදලින් රුපියල් හාර ලක්ෂ අසූනම දහස් හත්සිය හැත්තෑ නමයයි ශත හැට එකක (රු. 4,89,779.61) මුදලක් 2009 දෙසැම්බර් මස 10 වැනි දිනට එකී සම්පත් බැංකුව පීඑල්සී වෙත ලැබිය යුතුව හා අයවිය යුතුව ඇති හෙයින් ද, එකී රුපියල් හාරලක්ෂ අසූනම දහස් හත්සිය හැත්තෑ නමයයි ශත හැට එකක (රු. 4,89,779.61) මුදල ද 2009 දෙසැම්බර් මස 11 වැනි දින සිට අංක 1197 දරන එකී බැඳුම්කරය මත අයවිය යුතු මුළු මුදල පියවනු ලබන දිනය තෙක්, රුපියල් හාර ලක්ෂ තිස්පන් දහස් අටසිය පනස් එකයි ශත එකක (රු. 4,35,851.01) මුදලක් සඳහා වාර්ෂිකව සියයට විසිදෙකක් (22%) බැගින් වූ පොලිය ද, දැන්වීම් ගාස්තු ද, දරන්නට සිදුවූ වෙනත් වියදම් ද, තදනන්තරව ලැබී ඇති යම් මුදලක් (වෙතොත්) ඒවා අඩුකොට අයකර ගැනීම සඳහා, අංක 1197 දරන එකී බැඳුම්කරය මගින් ලබාගන්නා ලද එකී ණය මුදල සඳහා ඇප වශයෙන් එකී සම්පත් බැංකුව පීඑල්සී වෙත උකස්කොට ඇති මෙහි උපලේඛනයේ මැනවින් විස්තර කොට ඇති පරිශ්‍රයන් හා දේපළ, මහනුවර බලයලත් වෙන්දේසිකරුවන් වන අයි. ඩබ්ලිව්. ජයසූරිය ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණාලිය යුතු යැයි, 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන ) පනතින් පැවරී ඇති බලතල ප්‍රකාර එකී සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කර ගන්නා ලදී.

### උපලේඛනය

උතුරුමැද පළාතේ, පොළොන්නරුව දිස්ත්‍රික්කයේ, තමන්කඩුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ මැද පත්තුවේ, කාලිංග ඇල ග්‍රාමයේ පිහිටි "විස්සේ ඉඩම" යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන පී. බී. ඉලංගසිංහ යන අය විසින් සාදන ලද 2008 පෙබරවාරි මස 13 වැනි දාතම හා අංක 2008/Po/16 දරන පිඹුරේ නිරූපිත බෙදාවෙන් කොට සීමා නිර්ණය කොට ලොට් 01 වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට : ඒ එම්. දයාවතී විසින් වර්තමානයේ හිමිකම් කියන ඒ. එම්. හීන්බණ්ඩා යන අය විසින් හිමිකම් කියන FCP Po 59හි ලොට් 64, නැගෙනහිරට : අංක 2008/Po/16 දරන පිඹුරේ ලොට් 02, දකුණට : කේ. ජී. විලියම් විසින් වර්තමානයේ හිමිකම් කියන කේ. ජී. පුංචා යන අය විසින් හිමිකම් කියන FCP Po 59 හි ලොට් 68 සහ බස්නාහිරට : අංක FCP Po 59හි ලොට් 68 සහ 25 යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් රූඩ් දෙකයි පර්චස් එකොළහක් (අ. 0, රූ. 2, පර්. 11) හෝ හෙක්ටයාර් 1.03954ක් විශාල ඉඩම් කොටස සමග පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියළු දේ සහ සියළුම මාර්ග අයිතීන් ද, වෙනත් අයිතීන් ද, වරප්‍රසාදයන්, ප්‍රවශතාවන්, පරවශ්‍යතාවයන් සහ ඒ හා සම්බන්ධ අනුබද්ධයන් ද සමග එකී අංක 2008/Po/16 දරන පිඹුරට අනුව වෙළුම/පත්‍රිකාව LDO 3/4/2/186 යටතේ පොළොන්නරුව ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

එකී ලොට් 01 පහත සඳහන් ඉඩමේ උපබෙදුමේ නැවත මිනුමකි.

එකී කාලිංග ඇල ග්‍රාමයේ පිහිටි "විස්සේ ඉඩම" යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන පී. බී. ඉලංගසිංහ යන අය විසින් සාදන ලද අංක 2007/Po/448 දරන පිඹුරේ නිරූපිත බෙදාවෙන් කොට සීමා නිර්ණය කොට ලොට් 01 වශයෙන් ලකුණු කොට ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට : ඒ. එම්. දයාවතී විසින් වර්තමානයේ හිමිකම් කියන ඒ. එම්. හීන්බණ්ඩා යන අය විසින් හිමිකම් කියන FCP Po 59 ලොට් 64, නැගෙනහිරට : ඒ. එම් දයාවතී යන අය විසින් වර්තමානයේ හිමිකම් කියනු ලබන ඒ. එම්. හීන්බණ්ඩා යන අය විසින් හිමිකම් කියනු ලබන අංක FCP Po 59 දරන පිඹුරේ ලොට් 64 සහ FCP Po 59 හි ලොට් 66, දකුණට : FCP Po 59 හි ලොට් 69 සහ බස්නාහිරට : කේ. ජී, විලියම් යන අය විසින් වර්තමානයේ හිමිකම් කියනු ලබන කේ. ජී. පුංචා යන අය විසින් හිමිකම් කියනු ලබන අංක FCP Po 59 හි ලොට් 68 සහ FCP Po 59 හි ලොට් 25 යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් රූඩ් දෙකයි පර්චස් එකොළහක් (අ. 0, රූ. 2, පර්. 11) හෝ හෙක්ටයාර් 1.03954ක් විශාල ඉඩම් කොටස සමග පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියලු දේ සහ සියලුම මාර්ග අයිතීන් ද, වෙනත් අයිතීන් ද, වරප්‍රසාදයන්, ප්‍රවශතාවන්, පරවශ්‍යතාවයන් සහ ඒ හා සම්බන්ධ අනුබද්ධයන් ද සමග එකී අංක 2007/Po/448 දරන පිඹුරට අනුවය.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සමාගම් ලේකම්.

05-757/1

---

### සම්පත් බැංකුව පීඑල්සී

(සීමාසහිත සම්පත් බැංකුව නමින් කලින් හැඳින්වූ)

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය යටතේ සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කර ගන්නා ලද සම්මුතිය

අයි. යූ. මුණසිංහ,
ගිණුම් අංක : 0019 5001 5582.

සීමාසහිත සම්පත් බැංකුව පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2008 ක් වූ අගෝස්තු මස 28 වැනි දින පවත්වන්නට යෙදුණු රැස්වීමේ දී පහත සඳහන් අයුරු විශේෂිතව හා ඒකමතිකව යෝජනා සම්මත කර ගන්නා ලදී.

සමාගම් ලියාපදිංචි අංක පීකිව්. 144 දරන සම්පත් බැංකුව පීඑල්සී නමින් කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ආර්. ජී. ඩී. සුනාරි යන අය විසින් ලියා සහතික කරන ලද 2006 අගෝස්තු මස 17 දාතම හා අංක 1301 දරන උකස් බැඳුම්කරය මගින් උකස්කොට ඇපකොට මෙහි උපලේඛනයේ මැනවින් විස්තර කොට ඇති දේපළ හා පරිශ්‍රයන් ඇපයට තබාගෙන ලබාදුන් ණය මුදල ආපසු ගෙවීම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පිළියන්දල, නන්පමුණුව, ග්‍රීන් ගාර්ඩ්න්හි අංක 17/36, හි පදිංචි ඉන්ද්‍රා උදය මුණසිංහ යන අය බන්ධනදායී වශයෙන් පැහැර හැර ඇති හෙයින් ද, එකී බැඳුම්කරය ප්‍රකාර අයවිය යුතු මුළු මුදල වශයෙන් ශ්‍රී ලංකාවේ වලංගු මුදලින් රුපියල් රුපියල් පනස් හත්ලක්ෂ හැට එක්දහස් හාරසිය හැත්තෑහයයි ශත එකක (රු. 57,61,476.01) මුදලක් 2008 ජුනි මස 17 වැනි දිනට එකී සම්පත් බැංකුව පීඑල්සී වෙත ලැබිය යුතුව හා අයවිය යුතුව ඇති

හෙයින් ද, එකී රුපියල් පනස් හත්ලක්ෂ හැට එක්දහස් හාරසිය හැත්තෑ හයයි ශත එකක (රු. 57,61,476.01) මුදල ද 2008 ජුනි මස 18 දින සිට අංක 1301 දරන එකී බැඳුම්කරය මත අයවිය යුතු මුළු මුදල පියවනු ලබන දිනය තෙක්, රුපියල් පනස් එක් ලක්ෂ අනූඅට දහස් තුන්සිය හැට හතයි ශත අනූවක (රු. 51,98,367.90) මුදලක් සඳහා වාර්ෂිකව සියයට දහහතරක් (14%) බැගින් වූ පොළිය ද, දැන්වීම් ගාස්තු ද, දරන්නට සිදුවූ වෙනත් වියදම් ද, තදනන්තරව ලැබී ඇති යම් මුදලක් (වෙතොත්) ඒවා අඩුකොට අයකර ගැනීම සඳහා, අංක 1301 දරන එකී බැඳුම්කරය මගින් ලබාගන්නා ලද එකී ණය මුදල සඳහා ඇප වශයෙන් එකී සම්පත් බැංකුව පීඑල්සී වෙත උකස්කොට ඇති මෙහි උපලේඛනයේ මැනවින් විස්තර කොට ඇති පරිශ්‍රයන් හා දේපළ, කොළඹ බලයලත් වෙන්දේසිකරුවන් වන ෂොක්මන් සහ සමරවික්‍රම ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණාලිය යුතු යැයි, 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන ) පනතින් පැවරී ඇති බලතල ප්‍රකාර එකී සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කර ගන්නා ලදී.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරලේ, පල්ලේ පත්තුවේ, කැස්බෑව ප්‍රාදේශීය සභා සිමාව තුළ නාන්පමුණුවේ පිහිටි “දෙල්ගහවත්ත” යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන ආර්. එස්. අලහකෝන් යන අය විසින් සාදන ලද 1999 නොවැම්බර් මස 24 දාතම හා අංක 1293 දරන පිඹුරේ නිරූපිත බෙදා වෙන් කොට සීමා නිර්ණය කොට ලොට් 16 වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටස මායිම්, උතුරට : පාර, නැගෙනහිරට : ලොට් අංක 15, දකුණට : ලොට් ඒ සහ බස්නාහිරට : ලොට් 17 යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් අටයි දශම එකයි පහක් (අ. 0, රූ. 0, පර්. 8.15) විශාල ඉඩම් කොටස සමග පස, ගහකොළ, වගාවන්, සහ එහි පිහිටි සෑම සියළු දේ සහ සියළුම මාර්ග අයිතීන් ද, වෙනත් අයිතීන් ද, වරප්‍රසාදයන්, ප්‍රවශතාවන්, පරවශ්‍යතාවයන් සහ ඒ හා සම්බන්ධ අනුබද්ධයක් ද සමග එකී අංක 1293 දරන පිඹුරට අනුව වෙළුම/පත්‍රිරුව එම් 2716/271 යටතේ ගල්කිස්ස ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළයේ, පල්ලේ පත්තුවේ, කැස්බෑව ප්‍රාදේශීය සභා සීමාවන් තුළ නාන්පමුණුවේ පිහිටි “දෙල්ගහවත්ත” යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන ආර්. එස්. අලහකෝන් යන අය විසින් සාදන ලද 1999 නොවැම්බර් මස 24 වැනි දාතම හා අංක 1293 දරන පිඹුරේ නිරූපිත බෙදා වෙන්කොට සීමා නිර්ණය කොට ලොට් 17 වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට : පාර, නැගෙනහිරට : ලොට් 16, දකුණට : ලොට් ඒ සහ බස්නාහිරට : ලොට් 18 යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් අටයි දශම එකයි පහක් (අ. 0, රූ. 0, පර්. 8.15) විශාල ඉඩම් කොටස සමග පස, ගහකොළ, වගාවන් සහ එහි පිහිටි සෑම සියලු දේ සහ සියලුම මාර්ග අයිතීන් ද, වෙනත් අයිතීන් ද, වරප්‍රසාදයන්, ප්‍රවශතාවන්, පරවශ්‍යතාවයන් සහ ඒ හා සම්බන්ධ අනුබද්ධයක් ද සමග එකී අංක 1293 දරන පිඹුරට අනුව වෙළුම/පත්‍රිරුව එම් 2716/272 යටතේ ගල්කිස්ස ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

පහත සඳහන් දෑ මතින් ගමන් කිරීමේ හා මාර්ග අයිතිය ද සමග ය.

අංක 1293 දරන එකී පිඹුරේ ලොට් ඒ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සමාගම් ලේකම්.

05-757/6

---

## සම්පත් බැංකුව පීඑල්සී

(සීමාසහිත සම්පත් බැංකුව නමින් කලින් හැඳින්වූ)

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය යටතේ සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කර ගන්නා ලද සම්මුතිය

වී. නාගේශ්වරන්.
ගිණුම් අංකය : 0042 5000 5585.

සම්පත් බැංකුව පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2010 ක් වූ මාර්තු මස 25 වැනි දින පවත්වන්නට යෙදුණු රැස්වීමේ දී පහත සඳහන් අයුරු විශේෂිතව හා ඒකමතිකව යෝජනා කොට සම්මත කර ගන්නා ලදී.

සමාගම් ලියාපදිංචි අංක පීකිව්. 144 දරන සම්පත් බැංකුව පීඑල්සී නමින් කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ඩබ්ලි. ජී. කේ. විජේතුංග යන අය විසින් ලියා සහතික කරන ලද 2007 පෙබරවාරි මස 07 දාතම හා අංක 3459 දරන හා 2006 ජූලි මස 03 දාතම හා අංක 2960 දරන උකස් බැඳුම්කර දෙක මගින් උකස්කොට ඇපකොට මෙහි උපලේඛනයේ මැනවින් විස්තර කොට ඇති දේපළ හා පරිශ්‍රයන් ඇපයට තබාගෙන ලබාදුන් ණය මුදල ආපසු ගෙවීම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ වේලු නාගේශ්වරන් යන අය බන්ධනදායී වශයෙන් පැහැර හැර ඇති හෙයින් ද, එකී බැඳුම්කරය ප්‍රකාර අයවිය යුතු මුළු මුදල වශයෙන් ශ්‍රී ලංකාවේ වලංගු මුදලින් රුපියල් දහහතර ලක්ෂ පනස් එක්දහස් හතලිස් අටයි ශත හැටපහක (රු. 14,51,048.65) මුදලක් 2010 ජනවාරි මස 07 වැනි දිනට එකී සම්පත් බැංකුව පීඑල්සී වෙත ලැබිය යුතුව හා අයවිය යුතුව ඇති හෙයින් ද, එකී රුපියල් දහහතර ලක්ෂ පනස් එක්දහස් හතලිස් අටයි ශත හැටපහක (රු. 14,51,048.65) මුදල ද 2010 ජනවාරි මස 08 වැනි දින සිට අංක 3459 සහ 2960 දරන එකී බැඳුම්කරය මත අයවිය යුතු මුළු මුදල පියවනු ලබන දිනය තෙක්, රුපියල් එකොලොස් ලක්ෂ හැට අටදහස් එකසිය පනස් හයයි ශත හැත්තෑඑකක (රු. 11,68,156.71) මුදලක් සඳහා වාර්ෂිකව සියයට දහහතක් (17%) බැගින් වූ පොළිය ද, දැන්වීම් ගාස්තු ද, දරන්නට සිදුවූ වෙනත් වියදම් ද, තදනන්තරව ලැබී ඇති යම් මුදලක් (වෙතොත්) ඒවා අඩුකොට අයකර ගැනීම සඳහා, අංක 3459 සහ 2960 දරන එකී බැඳුම්කරය මගින් ලබාගන්නා ලද එකී ණය මුදල සඳහා ඇප වශයෙන් එකී සම්පත් බැංකුව පීඑල්සී වෙත උකස්කොට ඇති මෙහි උපලේඛනයේ මැනවින් විස්තර කොට ඇති පරිශ්‍රයන් හා දේපළ, මහනුවර බලයලත් වෙන්දේසිකරුවන් වන අයි. ඩබ්ලිව්. ජයසූරිය ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණාලිය යුතු යැයි, 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන ) පනතින් පැවරී ඇති බලතල ප්‍රකාර එකී සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කර ගන්නා ලදී.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ ලියාපදිංචි කොට්ඨාසයේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, දකුණු අළුත්කුරු කෝරළේ, රාගම් පත්තුවේ, පල්ලියවත්ත වත්තල ප්‍රාදේශීය සභා සීමාවන් තුළ හැඳල උප කාර්යාලය තුළ පල්ලියවත්ත පළමු පටුමගේ දැන් වරිපනම් අංක 25/9 දරන (පරිශ්‍ර අංක 23 1 වැනි පටුමග හී කොටසක්) වන “ලෝරල් ප්ලේස් ” යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන එම්. සමරනායක යන අය විසින් සාදන ලද 1988 වඩා නිවැරදිව 1988 ජුනි මස 02 දාතම හා අංක 6022 දරන පිඹුරේ නිරූපිත බෙදාවෙන් කොට සීමා නිර්ණය කොට ලොට් 15 වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටස මායිම්, උතුරට : ලොට් 7, නැගෙනහිරට : ලොට් ඩී2, දකුණට : ලොට් 13 සහ බස්නාහිරට : අංක 3753 දරන පිඹුරේ ලොට් 4 යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් දහයක් (අ. 0, රූ. 0, පර්. 10) විශාල ඉඩම් කොටස පස, ගහකොළ, වගාවන්,

ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියළු දේ සහ සියළුම මාර්ග අයිතීන් ද, වෙනත් අයිතීන් ද, වරප්‍රසාදයන් ප්‍රවශතාවන්, පරවශ්‍යතාවයන් හා ඒ හා සම්බන්ධ අනුබද්ධයන් ද සමග එකී අංක 6022 දරන පිඹුරට අනුව වෙලුම/පත්ඉරුව බී 898/226 යටතේ කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සමාගම් ලේකම්.

05-757/4

---

**සම්පත් බැංකුව පීඑල්සී**
(සීමාසහිත සම්පත් බැංකුව නමින් කලින් හැඳින්වූ)

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය යටතේ සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කර ගන්නා ලද සම්මුතිය

එම්. වී. අමරසේන.
හිඳුනුම් අංකය : 1079 5335 3998.

සම්පත් බැංකුව පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2010 ක් වූ මාර්තු මස 25 වැනි දින පවත්වන්නට යෙදුණු රැස්වීමේ දී පහත සඳහන් අයුරු විශේෂිතව හා ඒකමතිකව යෝජනා කොට සම්මත කර ගන්නා ලදී.

සමාගම් ලියාපදිංචි අංක පීකිව්. 144 දරන සම්පත් බැංකුව පීඑල්සී නමින් මාතර ප්‍රසිද්ධ නොතාරිස් ඩබ්ලිව්. එස්. පරණමාන යන අය විසින් ලියා සහතික කරන ලද 2008 ජනවාරි මස 23 වැනි දාතම හා අංක 1203 දරන උකස් බැඳුම්කරය මගින් උකස්කොට ඇපකොට මෙහි උපලේඛනයේ මැනවින් විස්තර කොට ඇති දේපළ හා පරිශ්‍රයන් ඇපයට තබාගෙන ලබාදුන් ණය මුදල ආපසු ගෙවීම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මැදවිට විතානගේ අමරසේන යන අය බන්ධනදායී වශයෙන් පැහැර හැර ඇති හෙයින් ද, එකී බැඳුම්කරය ප්‍රකාර අයවිය යුතු මුළු මුදල වශයෙන් ශ්‍රී ලංකාවේ වලංගු මුදලින් රුපියල් දහනම ලක්ෂ පනස් තුන් දහස් පන්සිය හැටයි ශත හැටඑකක (රු. 19,53,560.61) මුදලක් 2009 දෙසැම්බර් මස 14 වැනි දිනට එකී සම්පත් බැංකුව පීඑල්සී වෙත ලැබිය යුතුව හා අයවිය යුතුව ඇති හෙයින් ද, එකී රුපියල් දහනම ලක්ෂ පනස් තුන් දහස් පන්සිය හැටයි ශත හැටඑකක (රු. 19,53,560.61) මුදල ද 2009 දෙසැම්බර් මස 15 වැනි දින සිට අංක 1203 දරන එකී බැඳුම්කරය මත අයවිය යුතු මුළු මුදල පියවනු ලබන දිනය තෙක්, රුපියල් දහඅට ලක්ෂ තිස්පන් දහස් හයසිය අනූ පහයි ශත තිහක (රු. 18,35,695.30) මුදලක් සඳහා වාර්ෂිකව සියයට විස්සක් (20%) බැගින් වූ පොලිය ද, දැන්වීම් ගාස්තු ද, දරන්නට සිදුවූ වෙනත් වියදම් ද, තදනන්තරව ලැබී ඇති යම් මුදලක් (වෙතොත්) ඒවා අඩුකොට අයකර ගැනීම සඳහා, අංක 1203 දරන එකී බැඳුම්කරය මගින් ලබාගන්නා ලද එකී ණය මුදල සඳහා ඇප වශයෙන් එකී සම්පත් බැංකුව පීඑල්සී වෙත උකස්කොට ඇති මෙහි උපලේඛනයේ මැනවින් විස්තර කොට ඇති පරිශ්‍රයන් හා දේපළ, මහනුවර බලයලත් වෙන්දේසිකරුවන් වන අයි. ඩබ්ලිව්. ජයසූරිය ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණාලිය යුතු යැයි, 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන ) පනතින් පැවරී ඇති බලතල ප්‍රකාර එකී සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කර ගන්නා ලදී.

**උපලේඛනය**

දකුණු පළාතේ, ගාල්ල දිස්ත්‍රික්කයේ, වලල්ලවිටි කෝරළේ, බෙන්තොට ඉඳුරුව ග්‍රාමයේ යාලේගම පිහිටි “වල්ලයාහේන කැලේ දළුක්ගහකන්ද සහ ඇටවෙල ලොට් 2හි ලොට් 2බී හි උප-බෙදුම” යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක කේ. සිරිවර්ධන යන අය විසින් සාදන ලද 2006 සැප්තැම්බර් මස 23 දාතම හා අංක 1029/2006 දරන පිඹුරේ නිරූපිත බෙදා වෙන් කොට සීමා නිර්ණය කොට ලොට් 22 වශයෙන් ලකුණු කොට ඇති ඉඩම් කොටසටම මායිම්, උතුරට : එම ඉඩමේ ලොට් 21 සහ ලොට් 13 (අඩි 20 පළල පාර), නැගෙනහිරට : එම ඉඩමේ ලොට් 13 (අඩි 20 පළල පාර) සහ ලොට් 23, දකුණට : එම ඉඩමේ ලොට් 23 සහ අංක 900 දරන පිඹුරේ ලොට් 04 සහ බස්නාහිරට : අංක 900 දරන පිඹුරේ ලොට් 4 සහ එම ඉඩමේ ලොට් 21 යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් දහයයි දශම හයයි හතරක් (අ. 0, රූ, 0, පර්. 10.64) විශාල ඉඩම් කොටස සමග පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියලු දේත් සහ සියලුම මාර්ග අයිතීන් ද, වෙනත් අයිතීන් ද, වරප්‍රසාදයන්, ප්‍රවශතාවන්, පරවශ්‍යතාවයන් සහ ඒ හා සම්බන්ධ අනුබද්ධයක් ද සමග එකී අංක 1029/2006 දරන පිඹුරට අනුව වෙළුම/පත්ඉරුව B522/205 යටතේ බලපිටිය ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කර ඇත.

පහත සඳහන් දෑ දිගේ හා ඒ මතින් ගමන් කිරීමේ හා මාර්ග අයිතිය ද සමග ය.

1. එකී යාලෙගම පිහිටි “වල්ලයාහේන කැලේ දළුක්ගහකන්ද සහ ඇටවෙල ලොට් 2හි ලොට් 2බී හි උප-බෙදුම” යයි කියනු ලබන ඉඩමට එකී අංක 1029/2006 දරන පිඹුරේ නිරූපිත බෙදාවෙන් කොට සීමා නිර්ණය කොට ලොට් 01 (අඩි 20 පළල පාර) වශයෙන් ලකුණු කොට ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට : එම ඉඩමේ ලොට් 13. 12, 11, 10, 06, 03 සහ 02, අංක 942/2006 දරන පිඹුරේ ලොට් 2A සහ යාලේගම සිට ගෝනගල දක්වා ප්‍රධාන පාර, නැගෙනහිරට : යාලෙගම සිට ගෝනගල දක්වා ප්‍රධාන පාර සහ අංක 900 දරන පිඹුරේ ලොට් 03, දකුණට : අංක 900 දරන පිඹුරේ ලොට් 03 සහ අංක 942/2006 දරන පිඹුරේලොට් 24 සහ බස්නාහිරට : එම ඉඩමේ ලොට් 24. 13. 12. 11, 10, 06, 03, 02 සහ අංක 942/2006 දරන පිඹුරේ ලොට් 2A යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් තිස් නමයයි දශම හතයි තුනක් (අ. 0, රූ. 0, පර්. 39.73) විශාල ඉඩම් කොටස එකී අංක 1029/2006 දරන පිඹුරට අනුව වෙළුම/පත්ඉරුව B522/203 යටතේ බලපිටිය ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

2. එකී යාලෙගම පිහිටි “වලල්ලයාහේන කැලේ දළුක්ගහකන්ද සහ ඇටවෙල ලොට් 2හි ලොට් 2බී හි උප-බෙදුම” යයි කියනු ලබන ඉඩමට එකී අංක 1029/2006 දරන පිඹුරේ නිරූපිත බෙදා වෙන් කොට සිමා නිර්ණය කොට ලොට් 13 (අඩි 20 පළල පාර) වශයෙන් ලකුණු කොට ඇති ඉඩම් කොටස මායිම්, උතුරට : අංක 900 දරන පිඹුරේ ලොට් 01 සහ එම ඉඩමේ ලොට් 12. 14, 15, 16 සහ 17 සහ ලොට් 24, 23, 22, 21, 20, 19 සහ 18 සහ බස්නාහිරට : එම ඉඩමේ ලොට් 18 සහ අංක 900 දරන පිඹුරේ ලොට් 1 යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් විසි දෙකයි දශම හතයි අටක් (අ. 0, රූ. 0, පර්. 22.78) විශාල ඉඩම් කොටස එකී අංක 1029/2006 දරන පිඹුරට අනුව වෙළුම/පත්ඉරුව B522/207 යටතේ බලපිටිය ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සමාගම් ලේකම්.

05-757/8

**සම්පත් බැංකුව පීඑල්සී**
(සීමාසහිත සම්පත් බැංකුව නමින් කලින් හැඳින්වූ)

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය යටතේ සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කර ගන්නා ලද සම්මුතිය

ඒ. එල්. සී. එස්. එල් ද සිල්වා.
ගිණුම් අංක : 0012 5001 8122.

සම්පත් බැංකුව පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2010 ක් වූ මාර්තු මස 25 වැනි දින පවත්වන්නට යෙදුණු රැස්වීමේ දී පහත සඳහන් අයුරු විශේෂිතව හා ඒකමතිකව යෝජනා කොට සම්මත කර ගන්නා ලදී.

සමාගම් ලියාපදිංචි අංක පීකිව්. 144 දරන සම්පත් බැංකුව පීඑල්සී නමින් කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ඩබ්ලිව් ජී. කේ. විජේතුංග යන අය විසින් ලියා සහතික කරන ලද 2006 දෙසැම්බර් මස 11 දාතම හා අංක 3406 දරන උකස් බැඳුම්කරය මගින් උකස්කොට ඇපකොට මෙහි උපලේඛනයේ මැනවින් විස්තර කොට ඇති දේපළ හා පරිශ්‍රයන් ඇපයට තබාගෙන ලබාදුන් ණය මුදල ආපසු ගෙවීම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අම්බලන්ගොඩ ලියනගේ චන්දිම සජීව ලක්ප්‍රිය ද සිල්වා යන අය බන්ධනදායීන් වශයෙන් පැහැර හැර ඇති හෙයින් ද, එකී බැඳුම්කරය ප්‍රකාර අයවිය යුතු මුදල වශයෙන් ශ්‍රී ලංකාවේ වලංගු මුදලින් රුපියල් දොලොස් ලක්ෂ අනූ දහස් හයසිය හැට තුනයි ශත පනස් දෙකක (රු. 12,90,663.52) මුදලක් 2010 ජනවාරි මස 04 වැනි දිනට එකී සම්පත් බැංකුව පීඑල්සී වෙත ලැබිය යුතුව හා අයවිය යුතුව ඇති හෙයින් ද, එකී රුපියල් දොලොස් ලක්ෂ අනූ දහස් හයසිය හැට තුනයි ශත පනස් දෙකක (රු. 12,90,663.52) මුදල ද 2010 ජනවාරි මස 05 දින සිට අංක 3406 දරන එකී බැඳුම්කරය මත අයවිය යුතු මුලු මුදල පියවනු ලබන දිනය තෙක්, රුපියල් එකොලොස් ලක්ෂ හැත්තෑ අට දහස් එකසිය හැටතුනයි ශත අනූහයක (රු. 11,78,163.96) මුදලක් සඳහා වාර්ෂිකව සියයට පහළොවක් (15%) බැගින් වූ පොලිය ද, දැන්වීම් ගාස්තු ද, දරන්නට සිදුවූ වෙනත් වියදම් ද, තදනන්තරව ලැබී ඇති යම් මුදලක් (වෙතොත්) ඒවා අඩුකොට අයකර ගැනීම සඳහා, අංක 3406 දරන එකී බැඳුම්කරය මගින් ලබාගන්නා ලද එකී ණය මුදල සඳහා ඇප වශයෙන් එකී සම්පත් බැංකුව පීඑල්සී වෙත උකස්කොට ඇති මෙහි උපලේඛනයේ මැනවින් විස්තර කොට ඇති පරිශ්‍රයන් හා දේපළ, මහනුවර බලයලත් වෙන්දේසිකරුවන් වන අයි. ඩබ්ලිව්. ජයසූරිය ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණාලිය යුතු යැයි, 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන ) පනතින් පැවරී ඇති බලතල ප්‍රකාර එකී සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කර ගන්නා ලදී.

**උපලේඛනය**

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, සියනෑ කෝරළේ, අදිකාරි පත්තුවේ, බියගම ප්‍රාදේශීය සභා සීමාවන් තුළ (දෙල්ගොඩ උප කාර්යාල) තල්වත්ත පිහිටි තල්වත්ත බෝධි පාර වරිපනම් අංක 28/3 දරන "ගල්පොත්තේවත්ත" යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන පී. එම්. ලීලාරත්න යන අය විසින් සාදන ලද 2006 නොවැම්බර් මස 01 දාතම හා අංක 446/2006 දරන පිඹුරේ නිරූපිත බෙදා වෙන් කොට සීමා නිර්ණයකොට ලොට් 1 වශයෙන් ලකුණු කොට ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට : අඩි 10 පළල පාර, නැගෙනහිරට : අංක 169/1980 දරන පිඹුරේ ලොට් ඒ2, දකුණට : ජී. කරෝලිස් සිල්වාගේ ඉඩම සහ බස්නාහිරට : අංක 169/1980 දරන පිඹුරේ ලොට් බී යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් දොළහයි දශම දෙකයි බිංදුවක් (අ. 0, රූ. 0, පර්. 12.20) විශාල ඉඩම් කොටස සමග පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියලු දේ සහ සියලුම මාර්ග අයිතීන් ද, වෙනත් අයිතීන් ද, වරප්‍රසාදයන්, ප්‍රවශතාවන්, පරවශ්‍යතාවන් සහ ඒ හා සම්බන්ධ අනුබද්ධයන් ද සමග එකී අංක 446/2006 දරන පිඹුරට අනුව ය.

එකී ලොට් 1 පහතින් විස්තර කොට ඇති ඉඩමේ නැවත මිනුමකි :

එකී තල්වත්ත පිහිටි "ගල්පොත්තේවත්ත" යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන ආර්. හෙට්ටිආරච්චි යන අය විසින් සාදන ලද 1980 අගෝස්තු මස 10 දාතම හා අංක 169/1980 දරන පිඹුරේ නිරූපිත බෙදා වෙන්කොට සීමා නිර්ණය කොට ලොට් ඒ1 වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම්, ඊසානට : ලොට් ඒ2, ගිණිකොණට : පී. කරෝලිස් සිල්වාගේ ඉඩම, නිරිතට : ලොට් බී සහ වයඹට : අඩි 6 පළල පාර යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් දොළහයි දශම දෙකයි බිංදුවක් (අ. 0, රූ. 0, පර්. 12.20) විශාල ඉඩම් කොටස සමග පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියලු දේ සහ සියලුම මාර්ග අයිතීන් ද, වෙනත් අයිතීන් ද, වරප්‍රසාදයන් ප්‍රවශතාවන්, පරවශ්‍යතාවයන් සහ ඒ හා සම්බන්ධ අනුබද්ධයන් ද සමග එකී අංක 169/1980 දරන පිඹුරට අනුව වෙළුම/පත්ඉරුව සී 642/173 යටතේ ගම්පහ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණපරිදි,

සමාගම් ලේකම්.

05-757/9

---

**හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී - මොරටුව ශාඛාව**
(කලින් සීමාසහිත හැටන් නැෂනල් බැංකුව නමින් හඳුන්වනු ලැබූ)

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබූ යෝජනා සම්මුතිය

අමරතුංගගේ කමලාවතී ද සිල්වා
වීරකොන්ද ආරච්චිගේ ලානි විශාකා ප්‍රනාන්දු විවාහයට පෙර
වීරකොන්ද ආරච්චිගේ ලානි විශාකා ද සිල්වා සහ
සීලප්පෙරුමගේ ඇලෙක්ෂි ශ්‍රීලාල් ප්‍රනාන්දු.

2010.03.31 වැනි දින පවත්වන ලද හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. හි අධ්‍යක්ෂ මණ්ඩලයේ රැස්වීමේ දී මතු දැක්වෙන යෝජනාව විශේෂයෙන්ම සහ ඒකච්ඡන්දයෙන් සම්මත කර ගන්නා ලදී :

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් කේ. සේනානායක විසින් සහතික කරන ලද්දාවූ ද හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. හි නමට ලියන ලද්දාවූ ද 2006.06.01 දිනැති සහ අංක 1743 දරන බැඳුම්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම අමරතුංගගේ කමලාවතී ද සිල්වා වීරකෝන් ආරච්චිගේ ලානි විශාකා ප්‍රනාන්දු විවාහයට පෙර වීරකොන්ද ආරච්චිගේ ලානි විශාකා ද සිල්වා සහ සීලප්පෙරුමගේ ඇලෙක්ෂි ශ්‍රීලාල් ප්‍රනාන්දු යන අය ණයකරුවන් හැටියට ද පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කරය යටතේ රුපියල් පන්ලක්ෂ විසිඅටදහස් පන්සිය අනූනමයයි ශත අනූව (රු. 5,28,599.90) ක මුදලක් 2010.02.12 වැනි දින වන විට හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. ට අයවිය යුතුව සහ ලැබිය යුතුව ඇති හෙයින් එකී රු. 5,28,599.90ක මුදලට 2010.03.13 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට වැඩිදුර පොළිය ද ප්‍රචාරක වියදම් සඳහා දරන ලද වියදම් සහ වෙනත් ගාස්තු සහ මුදල් ප්‍රමාණයන් ද

තදන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් ඒ මුදල අඩුකොට එකී අංක 1743 දරන උකස් බැඳුම්කරය මගින් හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. වෙත උකස් කොට ඇත්තා වූද මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇත්තාවූ ද, දේපළ හා පරිශ්‍රය කොළඹ ප්‍රසිද්ධ වෙන්දේසිකරු එස්. රාමනායක මහතා ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය මේ මගින් යෝජනා සම්මත කර ගනී.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළේ, පල්ලේ පත්තුවේ, කැස්බෑව ප්‍රාදේශීය සභා සීමාවේ, වෑවල ගමේ ගගුලේඕවිට නමැති ඉඩමට බලයලත් මානක ඒ. හෙට්ටිගේ විසින් ලියා සහතික කරන ලද 1992.08.06 දිනැති අංක 1413 පිඹුරෙහි ලොට් අංක 8 නමැති ඉඩමට මායිම්, උතුරට : ලොට් අංක 13 (අඩි 15ක් පළල පාර) ත් ද, නැගෙනහිරට : ලොට් අංක 13 (අඩි 15ක් පළල පාර)න් ද, දකුණට : ලොට් අංක 14 (පානදුර - ගගා සහ බස්නාහිරට : ලොට් අංක 7න් ද මායිම් වූ පර්චස් දහහතරක (අ. 0. රූ. 0, පර්. 14)ක් විශාල ඉඩම සහ සියලු දේත් සමග වේ. මෙම ඉඩම ගල්කිස්ස ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ එම් 1931/181 යටතේ ලියාපදිංචි කර ඇත.

අංක 1743 දරන උකස් බැඳුම්කරයේ දෙවන උපලේඛනයේ වැඩිදුරටත් විස්තර කර ඇති මාර්ග අයිතිය ද සමග වේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ඉන්ද්‍රාණි ගුණසේකර,
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිණී (නීති),
අධ්‍යක්ෂ මණ්ඩලයේ ලේකම්.

05-740/13

---

### හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී - නිට්ටඹුව ශාඛාව
(කලින් සීමාසහිත හැටන් නැෂනල් බැංකුව නමින් හඳුන්වනු ලැබූ)

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබූ යෝජනා සම්මුතිය

පත්තුවේ ලියන ආරච්චිගේ අජිත් සමන්ත පෙරේරා සහ කරුණානායක පතිරන්නැහෙලාගේ යසවතී පොඩිහාමිනේ.

2009.12.02 වැනි දින පවත්වන ලද හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. හි අධ්‍යක්ෂ මණ්ඩලයේ රැස්වීමේ දී මතු දැක්වෙන යෝජනාව විශේෂයෙන්ම සහ ඒකච්ඡන්දයෙන් සම්මත කර ගන්නා ලදී :

ගම්පහ ප්‍රසිද්ධ නොතාරිස් පී. එන්. ඒකනායක විසින් සහතික කරන ලද්දාවූ ද හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. හි නමට ලියන ලද්දාවූ ද 2007.07.25 දිනැති සහ අංක 6236 දරන බැඳුම්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම පත්තුවේ ලියන ආරච්චිගේ අජිත් සමන්ත පෙරේරා සහ කරුණානායක පතිරන්නැහෙලාගේ යසවතී පොඩිහාමිනේ යන අය ණයකරුවන් හැටියට පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කරය යටතේ රුපියල් හැටඅට ලක්ෂ දහදහස් අටසිය පනස් අටයි ශත විසිපහ (රු. 68,10,858.25) ක මුදලක් 2009.10.31 වැනි දින වන විට හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. ට අයවිය යුතුව සහ ලැබිය යුතුව ඇති හෙයින් එකී රු. 68,10,858.25ක මුදලට 2009.11.01 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට වැඩිදුර පොළිය ද ප්‍රචාරක වියදම් සඳහා දරන ලද වියදම් සහ වෙනත් ගාස්තු සහ මුදල් ප්‍රමාණයන් ද තදනන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් ඒ මුදල අඩුකොට එකී අංක 6236 දරන උකස් බැඳුම්කරය මගින් හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී වෙත උකස් කොට ඇත්තා වූද මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇත්තාවූ ද, දේපළ හා පරිශ්‍රය කොළඹ ප්‍රසිද්ධ වෙන්දේසිකරු ඊ. එස්. රාමනායක මහතා ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය මේ මගින් යෝජනා සම්මත කර ගනී.

### උපලේඛනය

1. බස්නහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, සියනෑ කෝරළේ, උඩුගහ පත්තුවේ, අත්තනගල්ල ප්‍රාදේශීය සභාවට අයත් එගොඩපොත උප කාර්යාල සීමාව තුළ හග්ගල පිහිටි “නුගගහවත්ත බටහිර කොටස” නමැති ඉඩමට බලයලත් මානක යූ. ආර්. එදිරිසිංහ විසින් මැන සාදන ලද අංක 1037 සහ 1995 සැප්තැම්බර් මස 22 වැනි දින දරන පිඹුර ප්‍රකාර බෙදා වෙන් කරන ලද “ලොට් 1” ලෙස ලකුණු කර ඇති ඉඩම් කොටස වන උතුරට : පී. එල්. ඒ. අරුණ දේවප්‍රියට අයත් ඉඩමෙන් ද, නැගෙනහිරට : ජී. කේ. ඩී. ගුණවීරට සහ පී. කේ. ඩී. ජයතිලකට අයත් ඉඩම්වලින් ද, දකුණට : පාරෙන් ද සහ බස්නාහිරට : ලොට් 4න් ද මායිම් වූ එකී අංක 1037 දරන පිඹුර ප්‍රකාරව අක්කර එකයි පර්චස් අටයි දශම අට (අ. 1, රූ. 0. පර්. 8.8) ක විශාල ඉඩම තුළ පිහිටි ගොඩනැගිලි සහ අනෙකුත් සියළුම දේත් සමග වන මෙය ගම්පහ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ එෆ් 321/169 ශීර්ෂය යටතේ ලියාපදිංචි කර ඇත.

2. බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, සියනෑ කෝරළේ, උඩුගහ පත්තුවේ, අත්තනගල්ල ප්‍රාදේශීය සභාවට අයත් එගොඩපොත උප කාර්යාල සීමාව තුළ හග්ගල පිහිටි “නුගගහවත්ත බටහිර කොටස” නමැති ඉඩමට බලයලත් මානක යූ. ආර්. එදිරිසිංහ විසින් මැන සාදන ලද අංක 1037 සහ 1995 සැප්තැම්බර් මස 22 වැනි දින දරනි පිඹුර ප්‍රකාර බෙදා වෙන් කරන ලද “ලොට් 2” ලෙස ලකුණු කර ඇති ඉඩම් කොටස වන උතුරට : පාරෙන් ද, නැගෙනහිරට : පී. කේ. අමරතුංගට සහ අනෙක් අයට අයත් ඉඩම් වලින් ද, දකුණට : පී. කේ. නිමල් රණසිංහට සහ එල්. එච්. ධර්මදාසට අයත් ඉඩමෙන් ද සහ බස්නාහිරට : ලොට් 3න් ද මායිම් වූ එකී අංක 1037 දරන පිඹුර ප්‍රකාරව රූඩ් තුනයි අක්කර තිස්එකයි දශම දෙක (අ. 0, රූ. 3, පර්. 31.2) විශාල ඉඩම තුළ පිහිටි ගොඩනැගිලි සහ අනෙකුත් සියලුම දේත් සමග වන මෙය ගම්පහ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ එෆ් 208/285 ශීර්ෂය යටතේ ලියාපදිංචි කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ඉන්ද්‍රානි ගුණසේකර,
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිණී (නීති),
අධ්‍යක්ෂ මණ්ඩලයේ ලේකම්.

05-740/15

## හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. - නුවරඑළිය ශාඛාව
(කලින් සීමාසහිත හැටන් නැෂනල් බැංකුව නමින් හඳුන්වනු ලැබූ)

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබූ යෝජනා සම්මුතිය

හේරත් මුදියන්සේලාගේ පල්ලෙගෙදර උපාලි ජයතිස්ස.

2010.03.31 වැනි දින පවත්වන ලද හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. හි අධ්‍යක්ෂ මණ්ඩලයේ රැස්වීමේ දී මතු දැක්වෙන යෝජනාව විශේෂයෙන්ම සහ ඒකච්ඡන්දයෙන් සම්මත කර ගන්නා ලදී :

මහනුවර ප්‍රසිද්ධ නොතාරිස් එම්. එස්. පෙරේරා විසින් සහතික කරන ලද්දාවූ ද හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. හි නමට ලියන ලද්දාවූ ද 2005.05.04 දින අංක 649, 2007.04.10 දින සහ අංක 1123 සහ 2008.07.23 වැනි වැනි දින අංක 1519 දරන බැඳුම්කරයන් යටතේ අයවිය යුතු මුදල් ගෙවීම හේරත් මුදියන්සේලාගේ පල්ලෙගෙදර උපාලි ජයතිස්ස යන අය ණයකරු හැටියට පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කරයන් යටතේ රුපියල් විසිහතරලක්ෂ හැත්තෑහයදහස් පන්සිය දහතුනයි ශත හතළිහ (රු. 24,76,513.40) ක මුදලක් 2010.02.26 වැනි දින වන විට හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. ට අයවිය යුතුව සහ ලැබිය යුතුව ඇති හෙයින් එකී රු. 24,76,513.40ක මුදලට 2010.02.27 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට වැඩිදුර පොළිය ද ප්‍රචාරක වියදම් සඳහා දරන ලද වියදම් සහ වෙනත් ගාස්තු සහ මුදල් ප්‍රමාණයන් ද තදන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් ඒ මුදල අඩුකොට එකී අංක 649, 1123 සහ 1519 දරන උකස් බැඳුම්කරයන් මගින් හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී වෙත උකස් කොට ඇත්තා වූද මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇත්තාවූ ද, දේපළ හා පරිශ්‍රය කොළඹ ප්‍රසිද්ධ වෙන්දේසිකරු අයි. ඩබ්. ජයසූරිය මහතා ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය මේ මගින් යෝජනා සම්මත කර ගනී.

### උපලේඛනය

මධ්‍යම පළාතේ, නුවරඑළිය දිස්ත්‍රික්කයේ, සහ කොට්ඨාසයේ නුවරඑළිය ඔයපළාත කෝරළේ, නුවරඑළිය මහ නගර සභා සීමාව තුළ පාර්ක් පාරෙහි පිහිටි වරිපනම් අංක 29 (කලින් අංක 10 අංක 30 සහ 30/1) ටෙවින් "පෝෂන් " නමැති ඉඩමට බලයලත් මානක යූ. එන්. පී. විජේවීර විසින් මැන සාදන ලද අංක 4301එන් සහ 1999 මාර්තු මස 02 දින ප්‍රකාර බෙදා වෙන් කරන ලද ලොට් 3 ලෙස ලකුණු කර ඇති ඉඩම් කොටස වන උතුරට සහ වයඹ දිශාවට : ලොට් 2න්, ලොට් 4න් (පිවිසුම් මාර්ගය) ලොට් 1න් ද, ඊසාන දිශාවට : කේ. විවේකානන්දන්ට අයත් දේපළෙන් ද, දකුණට : පල්ලිය පාරෙන් ද සහ බස්නාහිරට : පාර්ක් පාරෙන් ද මායිම් වූ රූඩ් දෙකයි පර්චස් හයයි දශම දෙක (අ. 0, රූ. 2, පර්. 6.2) විශාල ඉඩම තුළ ඇති ගොඩනැගිලි සහ අනෙකුත් සියලුම දේත් සමග නුවරඑළිය ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ වෙළුම/පත්ඉරු ඒ 65/193 යටතේ ලියාපදිංචි කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ඉන්ද්‍රානි ගුණසේකර,
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිණි (නීති),
මාණ්ඩලික ලේකම්.

05-740/16

## හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. - මාතර ශාඛාව
(කලින් සීමාසහිත හැටන් නැෂනල් බැංකුව නමින් හඳුන්වනු ලැබූ)

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබූ යෝජනා සම්මුතිය

ඩැනී ටයිටස් මනම්පේරි සහ
වාසල විජේසුන්දර මුදියන්සේලාගේ චන්ද්‍රිකා කුමාරිහාමි.

2010.03.31 වැනි දින පවත්වන ලද හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. හි අධ්‍යක්ෂ මණ්ඩලයේ රැස්වීමේ දී මතු දැක්වෙන යෝජනාව විශේෂයෙන්ම සහ ඒකච්ඡන්දයෙන් සම්මත කර ගන්නා ලදී :

මාතර ප්‍රසිද්ධ නොතාරිස් ටී. එන්. පිනිදිය විසින් සහතික කරන ලද්දාවූ ද හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. හි නමට ලියන ලද්දාවූ ද 2006.02.21 දිනැති සහ අංක 937 දරන බැඳුම්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම ඩැනී ටයිටස් මනම්පේරි සහ වාසල විජේසුන්දර මුදියන්සේලාගේ චන්ද්‍රිකා කුමාරිහාමි යන අයවලුන් ණයකරුවන් හැටියට පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කරය යටතේ රුපියල් තුන්ලක්ෂ හැටදහස් අටසිය විසිතුනයි ශත පහ (රු. 3,60,823.05) ක මුදලක් 2009.06.30 වැනි දින වන විට හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. ට අයවිය යුතුව සහ ලැබිය යුතුව ඇති හෙයින් එකී රු. 3,60,823.05ක මුදලට 2009.07.01 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට වැඩිදුර පොළිය ද ප්‍රචාරක වියදම් සඳහා දරන ලද වියදම් සහ වෙනත් ගාස්තු සහ මුදල් ප්‍රමාණයන් ද තදන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් ඒ මුදල අඩුකොට එකී අංක 937 දරන උකස් බැඳුම්කරය මගින් හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී වෙත උකස් කොට ඇත්තා වූද මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇත්තාවූ ද, දේපළ හා පරිශ්‍රය කොළඹ ප්‍රසිද්ධ වෙන්දේසිකරු පී. මුතුකුමාරණ මහතා ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය මේ මගින් යෝජනා සම්මත කර ගනී.

### උපලේඛනය

1. දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ. වැල්ලබඩ පත්තුවේ, උඩ අපරැක්කේ පිහිටි අපරැක්ක එස්ටේට් හි ලොට් ඒ වලින් ලොට් 16න් ලොට් 1න් සහ ලොට් බී නමැති ඉඩමට බලයලත් මානක කේ. ජී. එස්. යාපා විසින් සකස් කරන ලද 1999.04.25 දිනැති අංක 2740 පිඹුරෙහි ලොට් අංක ඒ1 නමැති ඉඩමට මායිම්, උතුරට : යූ. එච්. හීන්අප්පුට සහ වෙනත් අයට අයිති ඉඩමෙන් ද, නැගෙනහිරට : පිඹුරු අංක 2740හි ලොට් අංක ඒ2න් ද, දකුණට : මෙම ඉඩමේම ලොට් අංක බී ලෙස නිරූපිත අඩි 15 පළල පාරෙන් ද සහ බස්නාහිරට : මෙම ඉඩමේම ලොට් අංක 15න් ද මායිම් වූ අක්කර එකයි පර්චස් තිස්තුනයි දශම හයයි බින්දුවක් (අ. 1, රූ. 0. පර්. 33.60)ක් විශාල ඉඩම සහ සියලුදේත් සමග වේ. පිඹුරු අංක 2740හි ලොට් අංක බී ලෙස නිරූපිත කොටසේ මාර්ග අයිතිය ද සමග වේ. මෙම ඉඩම මාතර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ බී 577/04 යටතේ ලියාපදිංචි කර ඇත.

2. ඉහත කී පරිදි උඩ අපරැක්කේ පිහිටි අපරැක්ක එස්ටේට් නැමැති ඉඩමේ ඉහත කී අංක 2740 පිඹුරෙහි අපරැක්ක එස්ටේට් හි ලොට් අංක ඒ වලින් ලොට් 16 වලින් ලොට් බී වලින් ලොට් 1 නමැති ඉඩමට මායිම්, උතුරට : යූ. එච්. හීන්අප්පුට සහ තවත් අයට අයිති ඉඩමෙන් ද. නැගෙනහිරට : කොහුදෙණිය සහ පිඹුරු අංක 2740හි ලොට් අංක ජී වලින් ද, (දිය පාරෙන්ද), දකුණට : පිඹුරු අංක 2740හි ලොට් අංක ඒ3න් ද, සහ බස්නාහිරට : පිඹුරු

අංක 2740හි ලොට් අංක බී (අඩි 15ක් පළල පාර) ද මායිම් වූ අක්කර එක (අ. 1, රූ. 0, පර්. 0) ක් විශාල ඉඩම සහ සියලු දේත් සමග වේ. පිඹුරු අංක 2740හි ලොට් අංක බී ලෙස නිරූපිත කොටසේ මාර්ග අයිතිය ද සමග වේ. මෙම ඉඩම මාතර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ බී 577/05 යටතේ ලියාපදිංචි කර ඇත.

ඉහත කී අංක 2740 දරන පිඹුරේ ලොට් බී ලෙස දක්වා ඇති මාර්ග අයිතිය ද සමග වේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ඉන්ද්‍රාණි ගුණසේකර,
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිණී (නීති),
අධ්‍යක්ෂ මණ්ඩලයේ ලේකම්.

05-740/11

---

## හැටන් නැෂනල් බෑන්ක් පී.එල්.සී. - මොරටුව ශාඛාව
(කලින් සීමාසහිත හැටන් නැෂනල් බැංකුව නමින් හඳුන්වනු ලැබූ)

### 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ හැටන් නැෂනල් බෑන්ක් පී. එල්. සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබූ යෝජනා සම්මුතිය

මානික්කුගේ නලීන් සුමේධ සිල්වා.

2010.03.01 වැනි දින පවත්වන ලද හැටන් නැෂනල් බෑන්ක් පී.එල්.සී. හි අධ්‍යක්ෂ මණ්ඩලයේ රැස්වීමේ දී මතු දැක්වෙන යෝජනාව විශේෂයෙන්ම සහ ඒකච්ඡන්දයෙන් සම්මත කර ගන්නා ලදී :

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් පී. එන්. බී. පෙරේරා විසින් සහතික කරන ලද්දාවූ ද හැටන් නැෂනල් බෑන්ක් පී.එල්.සී. හි නමට ලියන ලද්දාවූ ද 2008.10.15 දිනැති සහ අංක 4584 දරන බැඳුම්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම මානික්කුගේ නලීන් සුමේධ සිල්වා යන අය ණයකරු හැටියට පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කරය යටතේ රුපියල් විසිලක්ෂ අසූතුන්දහස් නවසිය හැටපහයි ශත හැටහතර (රු. 20,83,965.64) ක මුදලක් 2010.02.12 වැනි දින වන විට හැටන් නැෂනල් බෑන්ක් පී.එල්.සී. ට අයවිය යුතුව සහ ලැබිය යුතුව ඇති හෙයින් එකී රු. 20,83,965.64ක මුදලට 2010.02.13 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට වැඩිදුර පොළිය ද ප්‍රචාරක වියදම් සඳහා දරන ලද වියදම් සහ වෙනත් ගාස්තු සහ මුදල් ප්‍රමාණයන් ද තදන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් ඒ මුදල අඩුකොට එකී අංක 4584 දරන උකස් බැඳුම්කරය මගින් හැටන් නැෂනල් බෑන්ක් පී.එල්.සී වෙත උකස් කොට ඇත්තා වූද මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇත්තාවූ ද, දේපළ හා පරිශ්‍රය කොළඹ ප්‍රසිද්ධ වෙන්දේසිකරු පී. මුතුකුමාරණ මහතා ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ හැටන් නැෂනල් බෑන්ක් පී.එල්.සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය මේ මගින් යෝජනා සම්මත කර ගනී.

#### උපලේඛනය

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, (මීගමුව කොට්ඨාසය තුළ ලියාපදිංචි වී ඇති) අළුත්කුරු කෝරළේ, දාසිය පත්තුවේ, මීනුවන්ගොඩ ප්‍රාදේශීය සභා සීමාව තුළ ඕපාතහි පිහිටි ''කොස්ගහවත්ත සහ පුතලන්ගොඩලුවේවත්ත'' නමැති ඉඩමට බලයලත් මානක කේ. ආර්. එස්. ෆොන්සේකා විසින් මැන සාදන ලද අංක 5069 සහ 2008.08.06 වැනි දින දරන පිඹුර ප්‍රකාර බෙදා වෙන් කරන ලද ලොට් ''13ඒ'' ලෙස ලකුණු කර ඇති ඉඩම් කොටස වන උතුරට : බලයලත් මානක සේන ඉද්දමල්ගොඩ විසින් මැන සාදන ලද අංක 2148 සහ 1980.10.19 වැනි දින දරන පිඹුර ප්‍රකාර බෙදා වෙන් කරන ලද ලොට් ''14''න් ද නැගෙනහිරට : ලොට් බී වලින් ද (අඩි 20ක් පළලැති පාර), දකුණට : පිඹුරු අංක 2148ට අයත් ලොට් 12න් ද සහ බස්නාහිරට : බී. ජී. පියසීලි ජයවර්ධන හිමිකම් කියන ඉඩමෙන් ද, මායිම් වූ අංක 5069 දරන පිඹුර ප්‍රකාර පර්චස් දාහතයි දශම පහයි එක (අ. 0. රූ. 0, පර්. 17.51)ක් විශාල ඉඩම වේ.

ඉහත විස්තර කරන ලද අංක 5069දරන පිඹුරට අයත් ලොට් 13ඒ නමැති ඉඩම් කෙටස පිඹුරු අංක 2148 පිඹුරට අයත් ලොට් 13 ලෙස නැවත මැනීමකට ලක් කිරීමෙන් අනතුරුව මෙසේ විස්තර කර ඇත :

ඕපාතහි පිහිටි ''කොස්ගහවත්ත සහ පුතලන්ගොඩලුවේවත්ත'' නමැති ඉඩමට බලයලත් මානක සේන ඉද්දමල්ගොඩ විසින් මැන සාදන ලද අංක 2148 සහ 1980.10.19 වැනි දින දරන පිඹුර ප්‍රකාර බෙදා වෙන් කරන ලද ලොට් ''13'' ලෙස ලකුණු කර ඇති ඉඩම් කොටස වන උතුරට : ලොට් ''14'' න් ද, නැගෙනහිරට : ලොට් බී වලින් ද, (අඩි 20ක් පළලැති පාර) දකුණට : ලොට් 12න් ද සහ බස්නාහිරට : බී. පී. පියසීලි ජයවර්ධන හිමිකම් කියන ඉඩමෙන් ද මායිම් වූ අංක 2148 දරන පිඹුර ප්‍රකාර පර්චස් දාහතයි දශම පහයි එක (අ. 0, රූ. 0, පර්. 17.51) ක් විශාල ඉඩම මීගමුව ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ සී 893/288හි ලියාපදිංචි කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ඉන්ද්‍රාණි ගුණසේකර,
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිණී (නීති),
මාණ්ඩලික ලේකම්.

05-740/12

---

## නේෂන්ස් ට්‍රස්ට් බෑන්ක් පී. එල්. සී.

### 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය ප්‍රකාර නේෂන්ස් ට්‍රස්ට් බෑන්ක් පී. එල්. සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද යෝජනා සම්මතය පිළිබඳ දැන්වීම

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වැනි වගන්තිය ප්‍රකාරව නේෂන්ස් ට්‍රස්ට් බෑන්ක් පී. එල්. සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2009 අගෝස්තු මස 31 වැනි දින පහත සඳහන් යෝජනාව ඒකමතිකව සම්මත කර ගන්නා ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ :

මහනුවර ප්‍රසිද්ධ නොතාරිස් සී. පී. සුහසිංහ විසින් සහතික කරන ලද අංක 2847 සහ 2007 අප්‍රේල් මස 5 දින දරන උකස් බැඳුම්කරය සහ අංක 3019 සහ 2007 ඔක්තෝබර් මස 11 වැනි දින දරන උකස් බැඳුම්කරය මගින් මෙහි පහත උපලේඛනයේ සවිස්තරව දක්වා ඇති අයිතිවාසිකම්, දේපළ සහ පරිශ්‍රය මහනුවර ලේඩි ගාර්ඩින්ස් ඩ්‍රයිව් හි අංක 89/2 දරන ස්ථානයේ මොහොමඩ් නිසාම් මොහොමඩ් ෆාසි යන අය විසින් ලබා ගන්නා ලද මූල්‍ය පහසුකම් නිසි පරිදි ආපසු ගෙවීම සඳහා ඇපයක්

වශයෙන් එකී උකස්කරු විසින් කොළඹ 02, යුනියන් පෙදෙසේ, අංක 242 දරන ස්ථානයේ පිහිටි නේෂන්ස් ට්‍රස්ට් බැන්ක්. පී. එල්. සී නමට උකසට තබා බැඳීමකට යටත් කර ඇති බැවින් ද, තවද එකී බැඳුම්කර මගින් ඇප තබ ලද පහසුකම් මත ලැබිය යුතු ගෙවීම් එකී මොහොමඩ් නිසාම් මොහොමඩ් ෆාසි විසින් පැහැර හැරීම සිදු කර ඇති බැවින් ද.

රුපියල් දෙකෝටි විසිඅටලක්ෂ විසි දහස් නවසිය පනස්එකකුත් ශත හතලිස්දෙකක මුදල (රු. 2,28,20,951.42) සහ 2009.07.20 වැනි දිනට අයිරා පහසුකම් මත හිඟ මුදල වන එකී මුදල මත 2009.07.21 වැනි දින සිට විකිණීමේ දිනය තෙක් එකඟ වූ පරිදි (වැල්පොලී පදනමින් මාසිකව ගණනය කරන) තවදුරටත් පොළිය ද, ඊට සම්බන්ධිත ගාස්තු, ව්‍යවස්ථාපිත අයකිරීම්, ප්‍රචාරක වියදම් සහ එදින සිට ගෙවා ඇති යම් මුදලක් (වෙතොත්) එම මුදල අඩු කොට අයකර ගැනීම සඳහා මෙහි පහත උපලේඛනයේ සවිස්තරව දක්වා ඇති අයිතිවාසිකම්, දේපළ සහ පරිශ්‍රය කොළඹ ත්‍රිවංක ඇන්ඩ් සේනානායක ඔක්ෂනියර්ස් හි ත්‍රිවංක සී. සේනානායක මහතා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය දරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතෙන් පැවරී ඇති බලතල යටතේ මෙයින් යෝජනා සම්මත කරනු ලැබේ.

### ඉහත කී උපලේඛනය

01. මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, මහනුවර නගරයේ සහ මහනගර සභා සීමාව තුළ දළඳා වීදියේ පිහිටි බලයලත් මිනින්දෝරු ජේ. සී. එස්. මිසෝ විසින් මැන සාදන ලද අංක 2771 සහ 1950 පෙබරවාරි මස 15 දින දරන පිඹුර ප්‍රකාරව බෙදා වෙන් කළ ඉඩම සහ ගොඩනැගිලිවලට බලයලත් මිනින්දෝරු එල්. ඒ. ද සී. විජේතුංග විසින් මැන සාදන ලද අංක 7091 සහ 1975 ජූලි මස 10 දින දරන පිඹුර ප්‍රකාරව දළඳා වීදියේ වරිපනම් අංක 50 සහ 52 දරන බෙදා වෙන් කළ ඉඩම සහ ඊට අයිති ගොඩනැගිලිවලට බලයලත් මිනින්දෝරු එල්. ඒ. ද සී. විජේතුංග විසින් මැන සාදන ලද අංක 7091 සහ 1975 ජූලි මස 10 වැනි දින දරන පිඹුර ප්‍රකාරව "ද සොයිසා ගොඩනැගිලි " නමැති ඉඩම සහ පරිශ්‍රයේ කොටසක් වන එකි දළඳා වීදියේ වරිපනම් අංක 50 දරන බෙදා වෙන් කළ ඉඩම සහ ඊට අයිති භූගත මහල, බිම් මහල සහ උඩු මහලින් සමන්විත ගොඩනැගිල්ලට මායිම් උතුරට : ඉහත කී අංක 7091/A දරන පිඹුරේ නිරූපිත ලොට් A සහ යටිනුවර වදියේ අංක 9 සහ 7 දරන පරිශ්‍රයන් ද, නැගෙනහිරට : දළඳා වීදියේ අංක 48 දරන පරිශ්‍රය ද, දකුණට : දළඳා වීදියේ පදික වේදිකාව ද, බස්නාහිරට : අංක 7091 දරන පිඹුරේ නිරූපිත දළඳා වීදියේ වරිපනම් අංක 52 දරන පරිශ්‍රය ද යන මායිම් තුළ පිහිටි ඉහත කී අංක 7091 දරන පිඹුර අනුව පර්චස් තුනකුත් දශම පහයි බින්දුවක (අ. 0, රූ. 0, පර්. 3.50) විශාලත්වයෙන් යුක්ත ඉඩම පරිශ්‍රය සහ ඊට අයත් සෑම සියලු දේත් සමග ය. මෙය මහනුවර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ A/389/46 යටතේ ලියාපදිංචි කර ඇත.

ඉහත කී ඉඩම මෑතකාලීන මැන බෙදා වෙන් කිරීමට අනුව පහත සඳහන් පරිදි විස්තර කෙරේ.

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, මහනුවර නගරයේ සහ මහනගර සභා සීමාව තුළ දළඳා වීදියේ පිහිටි බලයලත් මිනින්දෝරු ජේ. සී. එස්. මිසෝ විසින් මැන සාදන ලද අංක 2771 සහ 1950 පෙබරවාරි මස 15 වැනි දින දරන පිඹුර ප්‍රකාරව බෙදා වෙන් කළ ඉඩම සහ ගොඩනැගිලිවලට බලයලත් මිනින්දෝරු එල්. ඒ. ද සී. විජේතුංග විසින් මැන සාදන ලද අංක 7091 සහ 1975 ජූලි මස 10 වැනි දින දරන පිඹුර ප්‍රකාරව දළඳා වීදියේ වරිපනම් අංක 50 සහ 52 දරන බෙදා වෙන් කළ ඉඩම සහ ඊට අයිති ගොඩනැගිලිවලට බලයලත් මිනින්දෝරු සී. පාලමකුඹුර විසින් මැන සාදන ලද අංක 4382/A සහ 2004 සැප්තැම්බර් මස 09 දින දරන පිඹුර ප්‍රකාරව "ද සොයිසා ගොඩනැගිලි " නමැති ඉඩම සහ පරිශ්‍රයේ කොටසක් වන ලොට් 1 නමැති (බලයලත් මිනින්දෝරු එල්. ඒ. ද සී. විජේතුංග විසින් මැන සාදන ලද අංක 7091 සහ 1975 ජූලි මස 10 වැනි දින දරන පිඹුරේ කොටසක් වන) දළඳා වීදියේ වරිපනම් අංක 50 දරන (කොසටක්) බෙදා වෙන් කළ ඉඩම සහ භූගත මහල සහ එක් උඩුමහලකින් සමන්විත ගොඩනැගිල්ලට මායිම් උතුරට : ලොට් 3 යටිනුවර වීදියේ අංක 9 දරන පරිශ්‍රය සහ දළඳා වීදියේ අංක 48 දරන පරිශ්‍රය ද, නැගෙනහිරට : යටිනුවර වීදියේ අංක 07 දරන පරිශ්‍රය, දළඳා වීදියේ අංක 48 දරන පරිශ්‍රය ද, දකුණට : දළඳා වීදියේ පදික වේදිකාව ද, බස්නාහිරට : දළඳා වීදියේ වරිපනම් අංක 52 දරන පරිශ්‍රය, සහ ලොට් 3 යන මායිම් තුළ පිහිටි ඉහත කි අංක 4382A දරන පිඹුර අනුව පර්චස් තුනයි දශම හතරයි බිංදුවක (අ. 0, රූ. 0, පර්. 3.40) නොහොත් හෙක්ටයාර 0.0086ක විශාලත්වයෙන් යුක්ත ඉඩම, පරිශ්‍රය සහ ඊට අයත් සෑම සියලු දේත් සමග ය.

02. මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, මහනුවර නගරයේ සහ මහනගර සභා සීමාව තුළ දළඳා වීදියේ පිහිටි බලයලත් මිනින්දෝරු ජේ. සී. එස්. මිසෝ විසින් මැන සාදන ලද අංක 2771 සහ 1950 පෙබරවාරි මස 15 වැනි දින දරන පිඹුර ප්‍රකාරව බෙදා වෙන් කළ ඉඩම සහ ගොඩනැගිලිවලට බලයලත් මිනින්දෝරු එල්. ඒ. ද සී. විජේතුංග විසින් මැන සාදන ලද අංක 7091 සහ 1975 ජූලි මස 10 වැනි දින දරන පිඹුර ප්‍රකාරව දළඳා වීදියේ වරිපනම් අංක 50 සහ 52 දරන බෙදා වෙන් කළ ඉඩම සහ ගොඩනැගිලිවලට බලයලත් මිනින්දෝරු සී. පාලමකුඹුර විසින් මැන සාදන ලද අංක 4382A සහ 2004 සැප්තැම්බර් මස 09 වැනි දින දරන පිඹුර ප්‍රකාරව "ද සොයිසා ගොඩනැගිලි " නමැති ඉඩම සහ පරිශ්‍රයේ කොටසක් වන ලොට් 2 (බලයලත් මිනන්දෝරු එල්. ඒ. ද සී. විජේතුංග විසින් මැන සාදන ලද අංක 7091/A හා 1975.07.10 වැනි දින දරන පිඹුර ප්‍රකාර ලොට් B හි කොටසක් වන) නමැති දළඳා වීදියේ වරිපනම් අංක 50 දරන (කොටසක්) බෙදා වෙන් කළ ඉඩම සහ ඊට අයිති බිම් මහලින් සහ ඉහළ මහල් තුනකින් සමන්විත ගොඩනැගිල්ලට මායිම්, උතුරට : යටිනුවර වීදියේ අංක 11 සහ 13 පරිශ්‍රයන් ද, නැගෙනහිරට : යටිනුවර වීදියේ අංක 11 පරිශ්‍රය සහ පතුලේ මහලේ කොරිඩෝව හරහා ඉඩකම වෙන් කරන බිත්තිය ද, දකුණට : ලොට් 3 ද, බස්නාහිරට : පතුල් මහලේ කොරිඩෝව හරහා ඉඩකඩ වෙන් කරන බිත්තිය සහ යටිනුවර වීදියේ අංක 13 පරිශ්‍රය ද යන මායිම් තුළ පිහිටි ඉහත කී අංක 4382/A දරන පිඹුර අනුව පර්චස් දෙකයි දශම බිංදුවයි නවයක (අ. 0. රූ. 0, පර්. 2.09) නොහොත් හෙක්ටයාර 0.0053ක විශාලත්වයෙන් යුක්ත ඉඩම පරිශ්‍රය ඊට අයිති සෑම සියලු දේත් සමග ය.

ඉහත කී ලොට් 2 පහත විස්තර කරන ඉඩමේම කොටසක් වේ.

ඉහත සඳහන් දළඳා වීදියේ පිහිටි එකී අංක 2771 දරන පිඹුරේ නිරූපිත ඉඩම සහ පරිශ්‍රයට මැන සාදන ලද එකී අංක 7091/A දරන පිඹුර ප්‍රකාරව "ද සොයිසා ගොඩනැගිලි " නමැති ඉඩම සහ පරිශ්‍රයේ කොටසක් වන ලොට් B සහ B1 වශයෙන් නිරූපිත බෙදා වෙන් කළ ඉඩම සහ ගොඩනැගිල්ලට මායිම් උතුරට : එම දේපළේම ඉතිරි කොටස ද, නැගෙනහිරට : එම දේපළේම ඉතිරි කොටස සහ 7091/A දරන පිඹුරේ ලොට් A ද, දකුණට සහ බස්නාහිරට : අංක 7091/A දරන පිඹුරේ ලොට් A ද යන මායිම් තුළ පිහිටි පර්චස් තුනයි දශම එකයි හතරක (අ. 0, රූ. 0, පර්. 3.14) විශාලත්වයෙන් යුක්ත ඉඩම, පරිශ්‍රය සහ ඊට අයිති සෑම සියලු දේත් සමග ය. මෙය මහනුවර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ A150/239 යටතේ ලියාපදිංචි කර ඇත.

03. මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, මහනුවර නගරයේ සහ මහ නගර සභා සීමාව තුළ දළඳා වීදියේ පිහිටි, ප්‍රසිද්ධ නොතාරිස් ජේ. සී. එස්. මියෝ විසින් මැන සාදන ලද අංක 2771 සහ 1950 පෙබරවාරි මස 15 දින දරන පිඹුර ප්‍රකාරව බෙදා වෙන් කළ ඉඩම සහ ගොඩනැගිලිවලට බලයලත් මිනින්දෝරු එල්. ඒ. ද සී. විජේතුංග විසින් මැන සාදන ලද අංක 7091 සහ 1975 ජූලි මස 10 දින දරන පිඹුර ප්‍රකාරව දළඳා වීදියේ වරිපනම් අංක 50 සහ 52 දරන බෙදා වෙන් කළ ඉඩම, ගොඩනැගිල්ලට බලයලත් මිනින්දෝරු සී. පාලමකුඹුර විසින් මැන සාදන ලද අංක 4382/A සහ 2004 සැප්තැම්බර් මස 09 දින දරන පිඹුර ප්‍රකාරව "ද සොයිසා ගොඩනැගිලි " නමැති ඉඩම සහ පරිශ්‍රයේ කොටසක් වන ලොට් 3 නමැති (බලයලත් මිනින්දෝරු එල්. ඒ. ද සී. විජේතුංග විසින් මැන සාදන ලද

අංක 7091/A සහ 1975 ජූලි මස 10 දින දරන පිඹුර ප්‍රකාරව ලොට් A හි කොටසක් වන) දළඳා වීදියේ වරිපනම් අංක 50 දරන (කොටසක්) බෙදා වෙන් කළ ඉඩම සහ ඊට අයිති බිම් මහල සහ එක් උඩුමහලකින් සමන්විත ගොඩනැගිල්ලට මායිම් උතුරට : ලොට් 2 සහ පතුල් මහලේ කොරිඩෝව හරහා ඉඩකඩ වෙන්කරන බිත්ති ය ද, නැගෙනහිරට : ලොට් 1 ද, දකුණට : ලොට් 1 සහ දළඳා වීදියේ අංක 52, 54, 56 සහ 58 පරිශ්‍රයන් ද, බස්නාහිරට : පතුල් මහලේ කොරිඩෝව හරහා ඉඩකඩ වෙන් කරන බිත්තිය සහ යටිනුවර වීදියේ අංක 13 පරිශ්‍රය ද යන මායිම් තුළ පිහිටි ඉහත කී අංක 4382/A දරන පිඹුර අනුව පර්චස් බින්දුවයි දශම හතයි හයක (අ. 0, රූ. 0, පර්. 0.76) නොහොත් හෙක්ටයාර 0.0019 ක විශාලත්වයෙන් යුක්ත ඉඩම පරිශ්‍රය සහ ඊට අයිති සෑම සියලු දේත් සමග ය.

ඉහත කී ලොට් 3 පහත විස්තර කරන ඉඩමේම කෙටසක් වේ.

ඉහත සඳහන් දළඳා වීදියේ පිහිටි එකී අංක 2771 දරන පිඹුරේ නිරූපිත බෙදා වෙන් කළ ඉඩම සහ පරිශ්‍රයට මැන සාදන ලද අංක 7091/A දරන පිඹුර ප්‍රකාරව "ද සොයිසා ගොඩනැගිලි " නමැති ඉඩම සහ පරිශ්‍රයේ කොටසක් වන බෙදා වෙන් කළ ලොට් A නමැති ඉඩම සහ ගොඩනැගිල්ලට මායිම්, උතුරට : එම ඉඩමේම ඉතිරි කොටස සහ අංක 7091/A දරන එකී පිඹුරේ ලොට් B සහ B1 ද, නැගෙනහිරට : වර්තමානයේ යටිනුවර වීදිය වශයෙන් හඳුන්වන බ්‍රවුන්රිග් වීදියේ අංක 13. 11 සහ 9 පරිශ්‍රයන් ද, දකුණට : දළඳා වීදියේ අංක 50, 52, 54 සහ 58 පරිශ්‍රයන් ද, බස්නාහිරට : එම දේපළේම ඉතිරි කොටස් ද යන මායිම් තුළ පිහිටි පර්චස් දෙකයි දශම දෙකයි හයක (අ. 0, රූ. 0, පර්. 2.26) විශාල ඉඩම පරිශ්‍රය සහ ඊට අයිති සෑම සියලු දේත් සමග ය. මෙය මහනුවර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ A223/114 යටතේ ලියාපදිංචි කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ නියමය පරිදි,

තේජා සිල්වා,
සමාගම් ලේකම්.

අංක 242, යූනියන් පෙදෙස,
කොළඹ 02.

05-672/1

---

**ඩීඑෆ්සීසී බැංකුව**

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය ප්‍රකාර ඩීඑෆ්සීසී බැංකුව විසින් සම්මත කරගන්නා ලද යෝජනා සම්මතය පිළිබඳ දැන්වීම

ඩීඑෆ්සීසී බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙහි පහත දැක්වෙන යෝජනා සම්මතය ඒකච්ඡන්දයෙන් සම්මත කර ගන්නා ලද බව 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විවිධිධාන) පනතේ 8 වැනි වගන්තියට අනුකූලව මෙයින් දැනුම් දෙනු ලැබේ.

**අධ්‍යක්ෂ මණ්ඩල යෝජනා සම්මතය**

ඩීඑෆ්සීසී බැංකුව නමට ප්‍රසිද්ධ නොතාරිස් ඒ. එස්. ගනේගොඩ විසින් ලියා සහතික කරන ලද ලද අංක 352 හා 2006 මාර්තු මස 17 හා 22 වැනි දින දරන උකස් බැඳුම්කරය ද කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ඩබ්ලිව්. ඒ. ඩී. වී. වනසිංහ සහ හලාවත ප්‍රසිද්ධ නොතාරිස් එම්. එම්. අයි. එස්. ප්‍රනාන්දු ලියා සහතික කළ අංක 487/9265 හා 2006 ඔක්තෝබර් මස 19 වැනි දින දරන උකස් බැඳුම්කර මත ද අයවිය යුතු මුදල් ගෙවීම, "නිව් ආර්ක් පැලස් " යන නාමය අභිධානය සහ ආයතනය යටතේ හවුල් ව්‍යාපාරයක් ලෙස හලාවත ව්‍යාපාරය කරගෙන යන රන්දෙනි කෝරාලලාගේ ඉන්දිරා නිල්මිණි හේරත් රන්දෙනි සහ කීර්ති ශ්‍රී සිංහ එලියනායක මුදියන්සේලාගේ ගුණතුංග යන අය විසින් පැහැර හැර ඇති හෙයින් ද, 2010 ජනවාරි මස 31 වැනි දිනට ඉහත කී අංක 352 හා 487/9265 දරන උකස් බැඳුම්කරය මත එකී රන්දෙනි කෝරාලලාගේ ඉන්දිරා නිල්මිණි හේරත් රන්දෙනි සහ කීර්ති ශ්‍රී සිංහ එලියනායක මුදියන්සේලාගේ ගුණතුංග යන අයගෙන් ඩීඑෆ්සීසී බැංකුවට රුපියල් එක්කෝටි තුන්ලක්ෂ හතලිස් එක් දහස් නවසිය හැත්තෑවකුත් ශත තිස් පහක (රු. 1,03,41,970.35) මුදලක් සහ 2010 පෙබරවාරි මස 01 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා එයින් රුපියල් හතලිස්පන් ලක්ෂයක් (රු. 45,00,000) සඳහා වර්ෂයකට සියයට දහතුන (13%) බැගින් ද රුපියල් විසිපන් ලක්ෂයක් (රු. 25,00,000) සඳහා එක් එක් වර්ෂයේ සෑම තුන්මසකට වරක් ජනවාරි, අප්‍රේල්, ජූලි සහ ඔක්තෝබර් යන මාසවල ව්‍යාපාර කටයුතු කරනු ලබන ප්‍රථම දිනයේ දී ප්‍රතිශෝධනය කරනු ලබන බරතැබූ මධ්‍යක මූලික ණය පොළී අනුපාතිකයට (ඒ. ඩබ්ලිව්, පී. ආර්) වර්ෂයකට සියයට හයක් (6%) ඉහල අනුපාතිකයක් මත ගණන් බලනු ලබන ආසන්නතම ඉහල 0.5% ට තීන්දු කරන වාර්ෂික අනුපාතිකය මත පොළිය ද ලැබිය යුතුව හා අයවිය යුතුව ඇති හෙයින් ද,

ඉහත කී උකස් බැඳුම්කර මත අයවිය යුතු මුදල වන රුපියල් එක්කෝටි තුන්ලක්ෂ හතලිස් එක්දහස් නවසිය හැත්තෑවකුත් ශත තිස් පහක (රු. 1,03,41,970.35) මුදල සහ 2010 පෙබරවාරි මස 01 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා එයින් රුපියල් හතලිස්පන් ලක්ෂයක් (රු. 45,00,000) සඳහා වර්ෂයකට සියයට දහතුන (13%) බැගින් ද රුපියල් විසිපන් ලක්ෂයක් (රු. 25,00,000) සඳහා එක් එක් වර්ෂයේ සෑම තුන්මසකට වරක් ජනවාරි, අප්‍රේල්, ජූලි සහ ඔක්තෝබර් යන මාසවල ව්‍යාපාර කටයුතු කරනු ලබන ප්‍රථම දිනයේ දී ප්‍රතිශෝධණය කරනු ලබන බරතැබූ මධ්‍යක මූලික ණය පොළී අනුපාතිකයට (ඒ. ඩබ්ලිව්. පී. ආර්) වර්ෂයකට සියයට හයක් (6%) ඉහළ අනුපාතිකයක් මත ගණන් බලනු ලබන ආසන්නතම ඉහළ 0.5%ට තීන්දු කරන වාර්ෂික අනුපාතිකය මත පොළිය හෝ විකිණීමේ දිනට එයින් නොගෙවා ඉතිරිව ඇති යම් කොටසක් මීට අදාළ ඉඩම හා පරිශ්‍රය සහ එහි පිහිටි ගොඩනැගිලි හා වෙනත් සියලු දේ විකිණීම පිළිබඳ ප්‍රචාරක ගාස්තු හා විකිණීමේ ගාස්තු ද 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 13 වැනි වගන්තිය ප්‍රකාර එකී බැඳුම්කරවල ප්‍රතිඥප්ති අනුව ඩීඑෆ්සීසී බැංකුව වැය කර ඇති සියලු මුදල් හා දරා ඇති සියලු වියදම් හා ගාස්තු ද සමග අයකර ගැනීම සඳහා ඉහත කී අංක 352 හා 487/9265 දරන උකස් බැඳුම්කර මගින් ඩීඑෆ්සීසී බැංකුව වෙත උකස් කර ඇති මෙහි පහත විස්තර කරන ඉඩම හා පරිශ්‍රය සහ එහි පිහිටි ගොඩනැගිලි හා වෙනත් සියලු දේ කොළඹ බලයලත් වෙන්දේසිකාර ෂොක්මන් සහ සමරවික්‍රම මහතුන් ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් සහ සංශෝධිත පරිදි වූ 1955 අංක 35 දරන ලංකා සංවර්ධන මුදල් සංස්ථා පනතින් පැවරී ඇති බලතල යටතේ ඩීඑෆ්සීසී බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් යෝජනා සම්මත කරයි.

***අංක 352 හා 487/9265 දරන උකස් බැඳුම්කර මගින් උකස් කරන ලද දේපළ විස්තරය***

වයඹ පළාතේ, පුත්තලම දිස්ත්‍රික්කයේ, උතුරු පිටිගල් කෝරළේ, ආනවිලුන්දාන් පත්තුවේ, හලාවත නගර සභා බල ප්‍රදේශ සීමාව ඇතුළත,

ශාන්ත ජේම්ස් වීදියේ පිහිටි "නිව් ආර්ක් ගාඩන්" නමැති ඉඩමේ බලයලත් මිනින්දෝරු එම්. එම්. පී. ඩන්ස්ටන් පෙරේරා විසින් මැන සකස් කළ අංක 4723 හා 2004 දෙසැම්බර් මස 13 වැනි දින දරන පිඹුරේ දැක්වෙන "ලොට් 1" ලෙස ලකුණු කල බෙදා වෙන්කළ බිම් කට්ටිය වන උතුරට : මැක්සල් පෙරේරාගේ ඉඩම ද, නැගෙනහිරට : නිෂාන්දන් සුරේකාගේ ඉඩම, වැන්ඩර්කෝන්ගේ ඉඩම සහ වී. රෙක්ස් නන්දන අප්පුහාමිගේ ඉඩම ද, දකුණට : නගර සභාවේ සිමෙන්ත කාණුව ද, බස්නාහිරට : ශාන්ත ජේම්ස් වීදිය ද යන මායිම් ඇතුළත, ඉහත කී අංක 4723 දරන පිඹුර ප්‍රකාර රූඩ් දෙකකුත් පර්චස් දෙකක් (අ. 0, රූ. 2. පර්. 2) බිම් ප්‍රමාණයෙන් යුත් ඉඩම සහ එහි පිහිටි ගොඩනැගිලි හා වෙනත් සියලු දේ.

ඒ. එන්. ෆොන්සේකා,
සාමාන්‍යාධිකාරී.

ඩීඑෆ්සීසී බැංකුව,
අංක 73/5, ගාලු පාර,
කොළඹ 03.

05-755/1

---

## සීමාසහිත ඩීඑෆ්සීසී වර්ධන බැංකුව

### 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය ප්‍රකාර සීමාසහිත ඩීඑෆ්සීසී වර්ධන බැංකුව විසින් සම්මත කර ගන්නා ලද යෝජනා සම්මතය පිළිබඳ දැන්වීම

සීමාසහිත ඩීඑෆ්සීසී වර්ධන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙහි පහත දැක්වෙන යෝජනා සම්මතය ඒකච්ඡන්දයෙන් සම්මත කර ගන්නා ලද බව 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 08 වැනි වගන්තියට අනුකූලව මෙයින් දැනුම් දෙනු ලැබේ.

#### අධ්‍යක්ෂ මණ්ඩල යෝජනා සම්මතය

සීමාසහිත ඩීඑෆ්සීසී වර්ධන බැංකුව නමට අනුරාධපුර ප්‍රසිද්ධ නොතාරිස් එස්. කේ. එන්. ඒ. කුරේරා විසින් ලියා සහතික කරන ලද අංක 2834 හා 2006 ඔක්තෝබර් මස 30 වැනි දින දරන උකස් බැඳුම්කරය මත අයවිය යුතු මුදල් ගෙවීම, අනුරාධපුර, අරඹවත්තගේ චමින්ද මංජුක පුෂ්පකුමාර රුදිගු යන අය විසින් පැහැර හැර ඇති හෙයින් ද, 2010 ජනවාරි 31 වැනි දිනට ඉහත කී අංක 2834 දරන උකස් බැඳුම්කරය මත එකී අරඹවත්තගේ චමින්ද මංජුක පුෂ්පකුමාර රුදිගු යන අයගෙන් සීමාසහිත ඩීඑෆ්සීසී වර්ධන බැංකුවට, රුපියල් අටලක්ෂ එකොළොස් දහස් නවසිය දහහතරකුත් ශත හැටහතක (රු. 8,11,914.67) මුදලක් සහ 2010 පෙබරවාරි මස 01 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා එයින් රුපියල් හාරලක්ෂ අසූදහස් හාරසිය හතලිස් එකකුත් ශත හැට දෙකක් (රු. 4,80,441.62) සඳහා වර්ෂයකට සියයට විසිපහ (25%) බැගින් පොලිය ද ලැබිය යුතුව හා අයවිය යුතුව ඇති හෙයින් ද,

ඉහත කී උකස් බැඳුම්කරය මත අයවිය යුතු මුදල වන රුපියල් අටලක්ෂ එකොළොස් දහස් නවසිය දහහතරකුත් ශත හැටහතක (රු. 8,11,914.67) මුදල සහ 2010 පෙබරවාරි මස 01 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා, එයින් රුපියල් හාරලක්ෂ අසූදහස් හාරසිය හතලිස් එකකුත් ශත හැට දෙකක් (රු. 4,80,441.62) සඳහා වර්ෂයකට සියයට විසිපහ (25%) බැගින් පොලිය හෝ විකිණීමේ දිනට එයින් නොගෙවා ඉතිරිව ඇති යම් කොටසක් මීට අදාළ මෝටර් වාහනය විකිණීම පිළිබඳ ප්‍රචාරක ගාස්තු හා විකිණීමේ ගාස්තු ද, 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 13 වැනි වගන්තිය ප්‍රකාර එකී උකස් බැඳුම්කරයේ ප්‍රතිඥප්ති අනුව සීමාසහිත ඩීඑෆ්සීසී වර්ධන බැංකුව වැය කර ඇති සියලු මුදල් හා දරා ඇති සියලු වියදම් හා ගාස්තු ද සමග අයකර ගැනීම සඳහා ඉහත කී අංක 2834 දරන උකස් බැඳුම්කරය මගින් සීමාසහිත ඩීඑෆ්සීසී වර්ධන බැංකුව වෙත උකස් කර ඇති මෙහි පහත විස්තර කරන මෝටර් වාහනය කොළඹ බලයලත් වෙන්දේසිකාර ෂොක්මන් සහ සමරවික්‍රම මහතුන් ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පැවරී ඇති බලතල යටතේ සීමාසහිත ඩීඑෆ්සීසී වර්ධන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් යෝජනා සම්මත කරයි.

*අංක 2834 දරන උකස් බැඳුම්කරය මගින් උකස් කරන ලද දේපල විස්තරය*

| *හඳුනාගැනීමේ අංකය (ලියාපදිංචි අංකය)* | *විස්තරය, වර්ගය, මෝස්තරය, අශ්වබලය යනාදිය* | *චැසි අංකය* | *එන්ජින් අංකය* | *නවතා තබන ස්ථානය* |
|---|---|---|---|---|
| 68-6202 | අයිෂර් මෝටර් ලොරිය | 15FC80150151 | 4D31A80142902 | 162, බුද්ධගයා මාවත, අනුරාධපුරය |

ලක්ෂ්මන් සිල්වා,
ප්‍රධාන විධායක නිලධාරී.

සීමාසහිත ඩීඑෆ්සීසී වර්ධන බැංකුව,
අංක 73, ඩබ්ලිව්. ඒ. ඩී. රාමනායක මාවත,
කොළඹ 02.

05-754

### ඩීඑෆ්සීසී බැංකුව

### 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය ප්‍රකාර ඩීඑෆ්සීසී බැංකුව විසින් සම්මත කරගන්නා ලද යෝජනා සම්මතය පිළිබඳ දැන්වීම

ඩීඑෆ්සීසී බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙහි පහත දැක්වෙන යෝජනා සම්මතය ඒකච්ඡන්දයෙන් සම්මත කර ගන්නා ලද බව 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විවිධිධාන) පනතේ 08 වැනි වගන්තියට අනුකූලව මෙයින් දැනුම් දෙනු ලැබේ.

### අධ්‍යක්ෂ මණ්ඩල යෝජනා සම්මතය

ඩීඑෆ්සීසී බැංකුව නමට ප්‍රසිද්ධ නොතාරිස් එස්. එම්. ගුණරත්න විසින් ලියා සහතික කරන ලද අංක 1927 හා 2007.04.04 දින දරන නිවැරදි කිරීමේ ඔප්පුව මගින් පරිපූර්ය අංක 1823 හා 2006.09.20 දින දරන මුල් උකස් බැඳුම්කරය මත සහ අංක 1926 හා 2007.04.04 දින දරන මුල් උකස් බැඳුම්කරය මත ද අයවිය යුතු මුදල් ගෙවීම, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ යථා පරිදි සංස්ථාගත කර ඇත්තා වූ ද, ලියාපදිංචි කාර්යාලය දැනට තලගල, ගෝනපල හන්දිය, පන්සල පාරේ (ටෙම්පල් රෝඩ් හි) පිහිටා ඇත්තා වූ ද (මෙහි මින් ඉදිරියට එකී සමාගම යනුවෙන් සඳහන් කරන) “ලංකා ක්වරීස් (ප්‍රයිවෙට්) ලිමිටඩ්” සමාගම විසින් පැහැර හැර ඇති හෙයින් ද, 2009 ඔක්තෝබර් මස 31 වැනි දිනට එකී සමාගමෙන් ඩීඑෆ්සීසී බැංකුවට ඉහත සඳහන් අංක 1927 දරන නිවැරදි කිරීමේ ඔප්පුව මගින් නිවැරදි කළ අංක 1823 දරන බැඳුම්කරය මත සහ අංක 1926 දරන බැඳුම්කරය මත, රුපියල් දෙකෝටි දහසයලක්ෂ හැටඅට දහස් තුන්සිය දොළහකුත් ශත එකොළහක (රු. 2,16,68.312.11) මුදලක් සහ 2009 නොවැම්බර් 01 වැනි දින සිට විකිණීමේ දිනය එක්වා එයින් රුපියල් එක්කෝටි හැටහය ලක්ෂ විසිතුන්දහස් එකසිය හැට හතරකුත් ශත අනූ දෙකක් (රු. 1,66.23,164.92) සඳහා එක් එක් වර්ෂයේ සෑම තුන්මසකට වරක් ජනවාරි, අප්‍රේල්, ජූලි සහ ඔක්තෝබර් යන මාසවල ව්‍යාපාර කටයුතු කරනු ලබන ප්‍රථම දිනයේ දී ප්‍රතිශෝධනය කරනු ලබන බරතැබූ මධ්‍යක මූලික ණය පොලී අනුපාතිකයට (ඒ. ඩබ්ලිව්. පී. ආර්) වර්ෂයකට සියයට හතක් (7%) ඉහළ අනුපාතිකයක් මත ගණන් බලනු ලබන ආසන්නතම ඉහළ 0.5%ට තීන්දු කරන අනුපාතිකයන් මත පොලිය ද, ලැබිය යුතුව හා අයවිය යුතුව ඇති හෙයින් ද,

ඉහත කී උකස් බැඳුම්කර මත අයවිය යුතු මුදල වන රුපියල් දෙකෝටි දහසයලක්ෂ හැටඅට දහස් තුන්සිය දොළහකුත් ශත එකොළහක (රු. 2,16,68,312.11) මුදල සහ 2009 නොවැමබ්ර් මස 01 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා එයින් රුපියල් එක්කෝටි හැටහය ලක්ෂ විසිතුන්දහස් එකසිය හැට හතරකුත් ශත අනූ දෙකක් (රු. 1,66,23,164.92) සඳහා එක් එක් වර්ෂයේ සෑම තුන්මසකට වරක් ජනවාරි, අප්‍රේල්, ජූලි සහ ඔක්තෝබර් යන මාසවල ව්‍යාපාර කටයුතු කරනු ලබන ප්‍රථම දිනයේ දී ප්‍රතිශෝධණය කරනු ලබන බරතැබූ මධ්‍යක මූලික ණය පොලී අනුපාතිකයට (ඒ. ඩබ්ලිව්. පී. ආර්) වර්ෂයකට සියයට හතක් (7%) ඉහළ අනුපාතිකයක් මත ගණන් බලනු ලබන ආසන්නතම ඉහළ 0.5.%ට තීන්දු කරන අනුපාතිකයන් මත පොළිය හෝ විකිණීමේ දිනට එයින් නොගෙවා ඉතිරිව ඇති යම් කොටසක් මීට අදාළ පිරියත, යන්ත්‍රසූත්‍ර හා උපකරණ විකිණීම පිළිබඳ ප්‍රචාරක ගාස්තු හා විකිණීමේ ගාස්තු ද, 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 13 වැනි වගන්තිය ප්‍රකාර එකී බැඳුම්කරවල ප්‍රතිඥප්ති අනුව ඩීඑෆ්සීසී බැංකුව වැය කර ඇති සියලු මුදල් හා දරා ඇති සියලු වියදම් හා ගාස්තු ද, සමග අයකර ගැනීම සඳහා ඉහත කී අංක 1823, 1927, 1926 දරන උකස් බැඳුම්කර මගින් ඩීඑෆ්සීසී බැංකුව වෙත උකස් කර ඇති මෙහි පහත විස්තර කරන පිරියත, යන්ත්‍රසූත්‍ර හා උපකරණ කොළඹ බලයලත් වෙන්දේසිකාර ෂොක්මන් සහ සමරවික්‍රම මහතුන් ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් සහ සංශෝධිත පරිදි වූ 1955 අංක 35 දරන ලංකා සංවර්ධන මුදල් සංස්ථා පනතින් පැවරී ඇති බලතල යටතේ ඩීඑෆ්සීසී බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් යෝජනා සම්මත කරයි.

### අංක 1926 දරන උකස් බැඳුම්කරය මගින් උකස් කරන ලද දේපළ විස්තරය

### පළමුවැනි උපලේඛනය

| *හඳුනාගැනීමේ අංකය* | *විස්තරය, වර්ගය, මෝස්තරය, සිලින්ඩර ධාරිතාව යනාදිය* | *චැසි අංකය* | *එන්ජින් අංකය* | *නවතා තබන ස්ථානය* |
|---|---|---|---|---|
| WP HL-9921 | ටාටා මෝටර් ලොරිය LPK 2516 | MAT39609132R04255 | 30D62266296 | ලංකා ක්වරීස් (ප්‍රයිවෙට්) ලිමිටඩ්, අංක 54, සරසවි ගාඩින්ස්, කොළඹ 08. |
| WP HM-0061 | ටාටා මෝටර් ලොරිය LPK 1615 | MAT39508137R18522 | 30F62272920 | ලංකා ක්වරීස් (ප්‍රයිවෙට්) ලිමිටඩ්, අංක 54, සරසවි ගාඩින්ස්, කොළඹ 08 |

ඒවාට අයත් සියලු උපාංග සහ මෙවලම් සමඟ

### දෙවන උපලේඛනය

මෙහි පහත දැක්වෙන චංචල පිරියත, යන්ත්‍ර සූත්‍ර හා උපකරණ ඇතුළුව

*විස්තරය*

JCB 3CX බැකෝ ලෝඩරය

එන්ජින් අංකය : AA50608U839989C
අනුක්‍රමික අංකය : SLP3CXTCVE0465851

කොළඹ 08, අංක 54, සරසවි ගාඩ්න්ස් හි ලංකා ක්වරිස් (ප්‍රයිවෙට්) ලිමිටඩ් පරිශ්‍රයේ දැනට තිබෙන අමතර කොටස්, උපාංග සහ මෙවලම්.

**අංක 1927 දරන නිවැරදි කිරීමේ ඔප්පුවෙන් නිවැරදි කළ අංක 1823 දරන උකස් බැඳුම්කරය මගින් උකස් කරන ලද දේපළ විස්තරය**

**පළමුවැනි උපලේඛනය**

මෙහි පහත සඳහන් චංචල යන්ත්‍ර සූත්‍ර හා උපකරණ ඇතුළුව :-

*විස්තරය*

ප්‍රයිමරි ක්‍රෂර් : PE 900x1200 චීනයේ නිෂ්පාදිත
සෙකන්ඩරි ක්‍රෂර් : PYB 1200 චීනයේ නිෂ්පාදිත
ටර්ෂරි ක්‍රෂර් : PYZ 1200 චිනයේ නිෂ්පාදිත
වීල් ලෝඩර් : කොමට්සු අලුත් වීල් ලෝඩරය මෝස්තරය - WA 380-3

සියළුම චංචල පිරියත, යන්ත්‍ර සූත්‍ර හා උපකරණ සහ තලගල, ගෝනපල හන්දිය, පන්සල පාරේ පිහිටි පරිශ්‍රය තුළ හා මත දැනට තිබෙන අමතර කොටස්, උපාංග හා මෙවලම්

**දෙවැනි උපලේඛනය**

මෙහි පහත සඳහන් චංචල යන්ත්‍ර සූත්‍ර හා උපකරණ ඇතුළුව :-

| *යන්ත්‍රෝපකරණ වර්ගය* | *විස්තරය* |
|---|---|
| ප්‍රයිමර් ක්‍රෂර් | PE 900x1200 චීනයේ නිෂ්පාදිත |
| සෙකන්ඩරි ක්‍රෂර් | PYB1200 චීනයේ නිෂ්පාදිත |
| ටර්ෂරි ක්‍රෂර් | PYZ 1200 චීනයේ නිෂ්පාදිත |
| වීල් ලෝඩර් 2යි | කොමට්සු WA 320 වීල් ලෝඩරය<br>එන්ජින් අංකය : 6D108-26058<br>අනුක්‍රමික අංකය : WO 53-50266<br>කොමට්සු WA 380 වීල් ලෝඩරය<br>එන්ජින් අංකය : 6D108-26849<br>අනුක්‍රමික අංකය : WO54-53004 |
| එක්ස්කැවේටර් 2යි | කොමට්සු PC220-6 එක්ස්කැවේටර්<br>අනුක්‍රමික අංකය : SA6D102E-1-A<br>චැසි අංකය : PC220-6-53142<br><br>කොමට්සු PC200-6 එක්ස්කැවේටර්<br>අනුක්‍රමික අංකය : 56D102E-1<br>චැසි අංකය : PC200-6C-10564 |

සියළු චංචල පිරියත, යන්ත්‍ර සූත්‍ර හා උපකරණ.

ඒ. එන්. ෆොන්සේකා,
සාමාන්‍යාධිකාරී.

ඩීඑෆ්සීසී බැංකුව,
අංක 73/5, ගාලු පාර,
කොළඹ 03.

05-755/2

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.